# 2017

වාර්ෂික වාර්තාව

ஆண்டறிக்கை

**Annual Report**




SPMC

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

இலங்கை அரச மருந்தாக்கற் பொருட்கள் உற்பத்திக் கூட்டுத்தாபனம்

**State Pharmaceuticals Manufacturing Corporation of Sri Lanka**

# සමරු ඵලකයේ සටහන

අත්‍යවශ්‍ය ඖෂධ නිපදවීම සඳහා වූ මෙම ඖෂධ සංයෝග මධ්‍යස්ථානය ශ්‍රී - ලංකා ජපාන මිත්‍රත්වයේ සංකේතයක් ලෙසින් ජපන් රජය විසින් ශ්‍රී - ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත කරන ලද පරිත්‍යාගයකි.

1987

# நுழைவாயிலில் இருக்கும் பதக்கப் பலகை

இம் முக்கியமான மருந்துகள் தயாரிக்கும் மருந்தாக்கல் கலவைகள் நிலையம் யப்பான் நாட்டிற்கும் இலங்கை சனநாயக சோசலிசக் குடியரசிற்கும் இடையே இருக்கும் நட்புறவு மற்றும் ஒருமைப்பாட்டின் அடையாளமாக யப்பான் நாட்டினால் இலங்கை சனநாயக சோசலிசக் குடியரசிற்கு வழங்கப்பட்ட நன்கொடையாகும்.

1987

# Plaque at the Entrance

This Pharmaceuticals Formulation Centre for the essential drugs is an outright gift by the Government of Japan to the Democratic Socialist Republic of Sri Lanka as a token of friendship and co-operation between Japan & the Democratic Socialist Republic of Sri Lanka.

1987

# වාර්ෂික වාර්තාව - 2017

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

# පටුන


| | |
|---|---|
| අපගේ දර්ශනය සහ මෙහෙවර | 3 |
| ආයතනික තොරතුරු | 5 |
| රා. ඖ. නි. සං. පිහිටුවීම සහ මූලික අරමුණු | 6 |
| සභාපතිවරයාගේ සමාලෝචනය | 7 |
| අධ්‍යක්ෂවරු | 9 |
| අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව | 12 |
| විගණන කමිටු වාර්තාව | 14 |
| ආයතනික පාලන වාර්තාව | 15 |
| අපගේ නිපැයුම් වර්ග | 17 |
| අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් වාර්තාව | 18 |
| මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | 21 |
| ආදයම් ප්‍රකාශය | 22 |
| ස්කන්ධ වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය | 23 |
| මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය | 24 |
| ආයතනික තොරතුරු සහ මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති | 25 |
| ගිණුම් පිළිබඳ සටහන් | 33 |
| විගණකාධිපති වාර්තාව | 46 |
| විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් සභාපතිවරයාගේ අදහස් | 64 |
| ප්‍රස්ථාරාත්මක සමාලෝචනය | 71 |
| පසුගිය වසර 10 ක වැදගත් මූල්‍ය විස්තර | 74 |

## අපගේ දර්ශනය

ජාත්‍යන්තර පිළිගැනීමක් ඇති
ඖෂධ නිමැවුම් නිෂ්පාදනය හා
අලෙවිකරණය කරන
දකුණු ආසියාවේ ඇති
ආදර්ශමත් ආයතනයක්
බවට පත්වීම

## අපගේ මෙහෙවර

දේශීය හා ජාත්‍යන්තර වෙළඳපල
සඳහා වඩා ආරක්ෂිත,
ප්‍රත්‍යක්ෂ හා
පහසු මිලකට ජාත්‍යන්තර ප්‍රමිතීන්ට
අනුකූලව
ඖෂධ නිෂ්පාදනය කිරීම



# ආයතනික තොරතුරු

## ආයතනයේ නාමය
ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

## නෛතික තත්වය
1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1987 වසරේ දී පිහිටුවන ලදී.

## සංස්ථාපිත කළ දිනය
1987 ජූනි මස 04

## ලියාපදිංචි කාර්යාලය
අංක 11, ශ්‍රීමත් ජෝන් කොතලාවල මාවත,
කඳවල වත්ත, රත්මලාන, ශ්‍රී ලංකාව.

## අධ්‍යක්ෂ මණ්ඩලය

| | |
|---|---|
| වෛද්‍ය එස්.ජී.සමරසුන්දර | - සභාපති |
| පී. සුන්දරලිංගම් | - කළමණාකාර අධ්‍යක්ෂ |
| වෛද්‍ය සුසී පෙරේරා | - අධ්‍යක්ෂ |
| වෛද්‍ය වෙන්කතේෂ්වරන් | - අධ්‍යක්ෂ |
| මියුරු භාෂිත ලියනගේ | - අධ්‍යක්ෂ |
| ශෆීක් රාජාබ්ඩීන් | - අධ්‍යක්ෂ |
| කේ.ඩී.එස්. රුවන්චන්ද්‍ර | - අධ්‍යක්ෂ |

## විගණකවරු
විගණකාධිපති, අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල.

## බැංකු
ලංකා බැංකුව
මහජන බැංකුව
ජාතික ඉතිරි කිරීමේ බැංකුව

## කළමනාකරණ කමිටුව

| | |
|---|---|
| එස්.ඩබ්. ජයසුන්දර | - සාමාන්‍යාධිකාරිණී |
| කේ.ඩී.ඒ. කුරුප්පු | - නියෝජ්‍ය - සාමාන්‍යාධිකාරී (තත්ව පාලන) |
| ඒ.ජී.ද.එස්.අතුරලිය | - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (මූල්‍ය) |
| එස්.පී.ජයවීර | - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නිෂ්පාදන) |
| ආර්.එම්.ආර්.එම්.රණසිංහ | - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වට්ටෝරු සහ පර්යේෂණ හා සංවර්ධන) - වැඩ බලන |
| පී.ඩී. ජයසුන්දර | - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු) |
| ආර්. ධර්මදාස | - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැලසුම් සහ ප්‍රසම්පාදන) |
| එස්. ඩබ්. සී. මොහොට්ටි | - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) |
| වී.පී. මුතුකුඩ | - කළමනාකාර (නිෂ්පාදන) |
| වී.ජේ. බණ්ඩාරවත්ත | - අභ්‍යන්තර විගණක |
| සී.ඩී. මගිනආරච්චි | - කළමනාකාරිණී (මානව සම්පත්) |
| ඒ.සී.පී. ආනන්ද කුමාර | - කළමනාකාරිණී (සැලසුම් සහ ප්‍රසම්පාදන) |
| එච්.කේ.පී. ඒ. සේනාධීර | - කළමනාකාර (තත්ව පාලන) |
| අමිල නුවන් හේවාගම | - කළමනාකාර (නිෂ්පාදන) |
| ඩී.එච්.ජේ. ගුණවර්ධන | - කළමනාකාර (ඉංජිනේරු) |
| ඒ.එම්.ටී.පී. කුලසේකර | - කළමනාකාර (අලෙවි ප්‍රවර්ධන) |
| පී. දන්තනාරායන | - කළමනාකාර (නිෂ්පාදන) |
| ජේ.එම්.එස්. ජයසුන්දර | - කළමනාකාර (මූල්‍ය) |
| බී.වී.එච්.පී.එස්. කුමාර | - කළමනාකාර (ඉංජිනේරු) |

## විගණන කමිටුව

| | |
|---|---|
| කේ.ඩී.එස්. රුවන්චන්ද්‍ර | - සභාපති |
| මියුරු භාෂිත ලියනගේ | - සාමාජික |
| ශෆීක් රාජාබ්ඩීන් | - සාමාජික |

# රා.ඖ.නි.සං පිහිටුවීම සහ මූලික අරමුණු

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව 1957 අංක 49 දරණ කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ සංස්ථාපනය කර ඇත.

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව 2017 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ ජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂාව සඳහා අත්‍යවශ්‍ය ඖෂධ වාණිජමය වශයෙන් නිෂ්පාදනය කිරීමෙහි 30 වසරක් සම්පූර්ණ කර ඇත. රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථා නිෂ්පාදන මාලාව පෙති සහ කරල් නිෂ්පාදන 72 කින් සමන්විත වේ. සමාලෝචිත වර්ෂය තුළ මෙයින් නිෂ්පාදන 40 ක් ක්‍රියාකාරී ලෙසම සංයෝජනය කර ඇත. රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව ශ්‍රී ලංකාවේ ඖෂධ නිෂ්පාදනයෙහි නියැලී සිටින එකම රාජ්‍ය සංස්ථාවයි.

ප්‍රධාන ක්‍රියාකාරීත්වයන්

(1) ඖෂධ නිෂ්පාදනය, සැකසීම, ගබඩා කිරීම, ඇසිරීම සහ නැවත ඇසිරීම
(2) ඖෂධ නිෂ්පාදනයට සහ සැකසීමට අවශ්‍ය තාක්ෂණික සහය සැපයීම
(3) ඖෂධ විද්‍යා සහ ඖෂධ ද්‍රව්‍ය පිළිබඳ පර්යේෂණ සහ ඖෂධ ප්‍රමිතිකරණය සහ
(4) නිෂ්පාදිත ඖෂධ අලෙවි කිරීම

වෙළඳපලට මුදා හරිනු ලබන සියලුම නිෂ්පාදන බ්‍රිතාන්‍ය ෆාමකෝපියා (BP) සහ එක්සත් ජනපද ෆාමකෝපියා (USP) නියමයන්ට අමතරව රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ (SPMC) අභ්‍යන්තර පිරිවිතරයන්ට ද අනුකූල වේ.

වත්මන් යහපත් නිෂ්පාදන පිළිවෙත් (cGMP) නියමයන් සහ කාර්යය පටිපාටි ක්‍රියාවේ යොදවන ආකාරය පිළිබඳව අභ්‍යන්තර ගුණාත්මකතා විගණනය සහ කම්හල් පිරික්සුම හරහා නිරීක්ෂණය සිදු කරනු ලැබේ.

# සභාපතිතුමාගේ පණිවුඩය

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, ආදායම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා විගණකාධිපති වාර්තාව ඇතුළත් විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශයන් ඉදිරිපත් කරන්නේ ඉමහත් සතුටිනි

පොදු ජනතාවට ගුණාත්මක, ඵලදායි හා ආරක්ෂාකාරී ඖෂධ නිපදවීමේ ඇප කැපවීමද සහිතව 1957 අංක 49 දරණ කාර්මික සංස්ථා පනත යටතේ 1987 වර්ෂයේදී ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව ීජඑක* ස්ථාපනය කරන ලදී. ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ විශාලතම හා ප්‍රමුඛතම ඖෂධ නිෂ්පාදකයා වෙයි. මේ වන විට මෙම සංස්ථාව ඖෂධ නාම යටතේ පුළුල් පරාසයක් ආවරණය කරමින් ඖෂධ වර්ග 72 ක් නිෂ්පාදනය කරයි. ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විසින් නිෂ්පාදනය කරනු ලබන සියලුම නිෂ්පාදන බ්‍රිටිෂ් ෆාමකෝපියා (BP) එක්සත් ජනපද ෆාමකෝපියා (USP) හා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථා ප්‍රමිතිවලට අනුව අවශ්‍ය ගුණාත්මකතාවය සපුරා ඇත. කාලීන යහපත් නිෂ්පාදන පිළිවෙත් :ජඨඑජ* රෙගුලාසි හා කාර්යපටිපාටි ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අභ්‍යන්තර ගුණාත්මකතා විගණනය හා කම්හල් පරීක්ෂාව හරහා නිති නිරීක්ෂණය කරනු ලැබේ.



ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ ඖෂධ නිෂ්පාදනාගාරය නවීන ජපන්, ජර්මානු හා කොරියානු යන්ත්‍රවලින් සමන්විතය. නිෂ්පාදනාගාරය අතිශයින් පිරිසිදු වාතාවරණයක් පවත්වා ගෙන යන අතර එය ලෝක සෞඛ්‍ය සංවිධානයේ හා වත්මන් යහපත් නිෂ්පාදන පිළිවෙත් (cGMP) නියමයන්ට අනුකූල වෙයි. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සිටින වෛද්‍යවරුන්, ඖෂධවේදීන් හා වෙනත් වෘත්තීයවේදීන් විසින් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථා නිෂ්පාදන අගය කරනු හා වඩා ප්‍රිය කරනු ලබයි. අපගේ සාර්ථකත්වයට තුඩු දෙන කරුණ වන්නේ ගුණාත්මක ඖෂධ නිපැයුම් නිෂ්පාදකයකු වශයෙන් වූ අපගේ කීර්තියයි.













### කාර්යසාධනය

2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව රුපියල් මිලියන 223 ක වාර්තාගත ශුද්ධ ලාභයක් වාර්තා කර ඇත.

### නිෂ්පාදන ප්‍රතිදානය

මුළු නිෂ්පාදන ප්‍රතිදානය 2017 වර්ෂයේදී පෙති/කරල් ඒකක මිලියන 1523ක් විය.

## පිරිවැටුම

2017 වර්ෂය සඳහා වූ මුළු පිරිවැටුම රුපියල් මිලියන 3,174 ක් වූ අතර එය සංස්ථාව ආරම්භ කළ පසු ඉහළම පිරිවැටුම විය. මුළු අලෙවියෙන් 78.25% ක් සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයුම් අංශය (MSD) වෙත වූ අතර ඉතිරිය රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව (SPC) හා අප වෙත ලියාපදිංචිව සිටින පෞද්ගලික ඔසුසල් වෙත විය.

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව මහා භාණ්ඩාගාරය වෙතින් කිසිදු සහායකින් තොරව සිය සම්පත්වලින් ලාභ ඉපැයීමට සමත් වී ඇති බව සනිටුහන් කරනුයේ සතුටිනි. සැබැවින්ම, ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව රාජ්‍ය සංස්ථාවක් වශයෙන් වූ සිය වගකීම ඉටුකරමින් 2017 වර්ෂයේදී දායකත්වය වශයෙන් රුපියල් මිලියන 45 ක මුදලක් මහා භාණ්ඩාගාරය වෙත ගෙවා ඇත.

## සංවර්ධන කාර්යය

කම්හල සංවර්ධනය
නිෂ්පාදනය වැඩි කිරීම පිණිස නිෂ්පාදන අංශයට නව පද්ධතියක් (Pneumatic Powder Transfer System) හඳුන්වා දෙන ලදී.

## පුළුල් කිරීමේ ව්‍යාපෘතිය

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව 2018 වර්ෂය වන විට සම්පූර්ණ වේ යැයි අපේක්ෂිත කම්හල පුළුල් කිරීම සඳහා ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය :ඍෂක්* වෙතින් අරමුදල් ලබා ගෙන ඇත. යෝජිත පුළුල් කිරීමත් සමගින්, අපේක්ෂිත ප්‍රතිදානය වර්ෂයකට පෙති හා කරල් ඒකක මිලියන 3,200 දක්වා වැඩි වනු ඇත.

මෙම පුළුල් කිරීමේ වැඩසටහන යටතේ නව යන්ත්‍ර මිලට ගැනීම, දැනට ඇති ගොඩනැගිලි නවීකරණය කිරීම හා අමුද්‍රව්‍ය හා නිමි භාණ්ඩ ගබඩා කිරීම සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම සිදු කිරීමටද ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව සැලසුම් කරයි.

## පර්යේෂණය හා සංවර්ධනය

2017 වර්ෂයේදී නව නිපැයුම් හයකට සංයෝගකරණ අනුමැතිය හා නිෂ්පාදන 3 කට නිෂ්පාදන බලපත්‍රය ලබා දෙන ලදී. එයට අමතරව, ඩිල්ටියසම් මි.ග්‍රෑ. 30 පෙති සඳහා බලපත්‍ර ලබා ගැනීම වෙනුවෙන් ලිපි ලේඛණ භාර දී ඇත.

## මානව සම්පත් සංවර්ධනය සහ සුභසාධනය

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ කාර්යක්ෂම හා සුමට ක්‍රියාකාරිත්වය උදෙසා, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ මගපෙන්වීම යටතේ රැකියාස්ථ පුහුණුවේ යෙදී සිටින පුහුණුලාභීන් 5 දෙනෙක් ඇතුළුව සේවක සේවිකාවන් 279 ක් 2017.12.31 දින වන විට සේවයේ යෙදී සිටියහ. දේශීය ආයතන විසින් මෙහෙයවනු ලබන වැඩසටහන් කීපයක් හරහා ඉන් 113 දෙනෙක් පුහුණුව ලැබූ අතර 15 දෙනෙක් විදෙස් පුහුණුව ලැබූහ.

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව සේවක සේවිකාවන් විසින් ඉල්ලනු ලැබූ මූලික සුභසාධන පහසුකම් සැපයීම මෙම වර්ෂයේදීද සිදු කළේය. එමෙන්ම ඔවුන් වාර්ෂික චාරිකාව/සුහද හමුව, සිංහල හා දමිළ අළුත් අවුරුදු උළෙල හා ක්‍රීඩා උත්සවය වැනි සාමාජීය හා සුභසාධන අවස්ථා සඳහා සහභාගි වීමටද දිරිගන්වන ලදී.

## උපායමාර්ගය හා ඉඩප්‍රස්ථා

අපගේ ප්‍රධාන අභිප්‍රාය වන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයුම් අංශය (MSD), රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව (SPC) ඔසුසල් හා වෛද්‍ය වෘත්තිකයින් සඳහා අවශ්‍ය කෙරෙන ඖෂධ ද්‍රව්‍ය අඛණ්ඩව සැපයීමයි. මෙම ක්‍රියාවලිය පහසු කරවනු පිණිස අපි දැනටමත්, නිෂ්පාදනය, ගබඩා ප්‍රදේශය හා පරිපාලන ඒකකය සඳහා ගොඩනැගිලි ධාරිතාව පුළුල් කිරීම සිදු කර ඇත.

සියලුම අංගෝපාංග සහිතව පර්යේෂණාගාරය පුළුල් කිරීම මගින් ශ්‍රී ලංකාවේ සිටින අපහසුතා සහිත ජනතාව සඳහා දැරිය හැකි මිලට උසස් තත්ත්වයේ ඖෂධ සැපයෙන බවට සහතික කෙරෙනු ඇත.

මෙම පුළුල් කිරීම අපට නිෂ්පාදනය දියුණු කිරීමට, නිපැයුම් මාලාව ව්‍යාප්ත කිරීමට, නව රැකියා අවස්ථා ජනනය කිරීමට, තාක්ෂණික දැනුම නංවා ගැනීමට, විකිණුම් ආදායම වැඩි කර ගැනීමට හා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ ව්‍යාපාරික ප්‍රතිරූපය නිර්මාණය කර ගැනීමට ඉවහල් වනු ඇත.

## තුති පළකිරීම

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මම ශ්‍රී ලංකාවේ ඖෂධ කර්මාන්තයේ උන්නතිය උදෙසා සිය අඛණ්ඩ කැපවීම වෙනුවෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා වෙත මාගේ හෘදයාංගම ස්තුතිය පුද කර සිටිමි. එමෙන්ම සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය ගරු රාජිත සේනාරත්න මැතිතුමා විසින් ලබා දෙන ලද අගනා සහයෝගය හා මගපෙන්වීම වෙනුවෙන් මාගේ කෘතඥතාව පළ කරමි. තවද, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් අනුර ජයවික්‍රම මහතා ඇතුළු නිලධාරීන් විසින් ලබා දෙන ලද මගපෙන්වීමද අපි අගය කරමු. එමෙන්ම මහා භාණ්ඩාගාරයේ විවිධ දෙපාර්තමේන්තුවල නිලධාරීන් විසින් ලබා දෙන ලද දායකත්වය අපි මහත්සේ අගය කරමු.

මෙම සංස්ථාවේ සාර්ථකත්වය උදෙසා මනා දායකත්වයක් ලබා දුන් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව (SPC) වෛද්‍ය සැපයුම් අංශය (MSD) ඔසුසල් හා වෛද්‍ය වෘත්තිකයින් අප සමග උත්කෘෂ්ට සබඳතාවක් පවත්වා ගෙන ගිය බව කෘතඥතා පූර්වකව සනිටුහන් කිරීම සතුටකි.

2017 වර්ෂයේදී සාධනීය ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීමෙහිලා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ කළමනාකාර අධ්‍යක්ෂතුමා, සාමාන්‍යාධිකාරිතුමිය, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්, කළමනාකාරවරුන්, විධායක කාර්ය මණ්ඩලය සහ සියලුම මට්ටම්වල සේවකයින් විසින් දක්වන ලද කැපවීම අපි මහත් සේ අගය කරමු.

අවසන් වශයෙන්, සංස්ථාව සාර්ථකත්වය කරා මෙහෙයවීමෙහිලා සිය අගනා දායකත්වය හා මගපෙන්වීම ලබා දීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මාගේ ස්තුතිය පුද කර සිටිමි.

**වෛද්‍ය එස්.ජී. සමරසුන්දර**
**සභාපති**
**ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව**
**2017 පෙබරවාරි 28 වැනි දින**

# අධ්‍යක්ෂවරු

**වෛද්‍ය සයුරු සමරසුන්දර**
**- සභාපති**

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරන වෛද්‍ය සයුරු සමරසුන්දර මහතා වෘත්තියෙන් වෛද්‍යවරයෙකු වන අතර ලැට්වියා/රිගා ස්ට්‍රේඩින්ස් විශ්ව විද්‍යාලයෙන් වෛද්‍ය විද්‍යාව හදාරා ඇත. ඔහු රුසියාවේ මොස්කව් විශ්ව විද්‍යාලයේ නව සොයා ගැනීම් සහ තාක්ෂණ ආයතනයෙන් ආචාර්ය උපාධිය ලබා ගෙන ඇත.

ඔහු මීට පෙර ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිත ආයතනයෙහි සභාපතිවරයා වශයෙන් ද කටයුතු කර ඇති අතර ධීවර අමාත්‍යංශයේ ව්‍යාපෘති ස්ථාපිත කිරීමේ ඒකකයෙහි අධ්‍යක්ෂකවරයෙකු ලෙසද කටයුතු කර ඇත.

තවද ඔහු ශ්‍රී ලංකා ධීවර විශ්ව විද්‍යාලයේ පාලනාධිකාරියේ සාමාජිකයෙකු වන අතර ශ්‍රී ලංකා ජාතික ජල ජීවී වගා සංවර්ධන අධිකාරියේ සාමාජිකයෙකි. ඔහු 2012 - 2015 කාලය තුලදී ජාත්‍යන්තර ජලමාන සංවිධානය වෙනුවෙන් ශ්‍රී ලංකාව නියෝජනය කර ඇත.

**පී සුන්දරලිංගම්**
**- කළමණාකාර අධ්‍යක්ෂ**

පී සුන්දරලිංගම් මහතා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය තුළ කළමණාකාර අධ්‍යක්ෂ ලෙස 2015 ජනවාරි 26 දින සිට කටයුතු කරයි.

එසේම ඔහු වසර 42 ක බැංකු ක්ෂේත්‍රය තුල විවිධ අත්දැකීම් හෙබි අයෙකි. ඉන් වසර 36ක් ලංකා බැංකුවේද වසර 6ක් යුනියන් බැංකුවේද ජ්‍යෂ්ඨ විධායක නිලධාරියෙකු ලෙස කටයුතු කර ඇත.ඔහු සතුව බැංකුකරණය, උපාය මාර්ගික සැලසුම්කරණය, ව්‍යාපාරික ක්‍රියාත්මක කිරීම් සුපරීක්ෂණය, අලෙවිකරණය, නාලිකා කළමණාකරනය, ඒකාබද්ධ පාලනය, කළමණාකරන තොරතුරු පද්ධති යන ක්ෂේත්‍ර පිළිබඳව විශේෂඥ දැනුමක් සහ පුළුල් අත්දැකීම් සම්භාරයක් ඇත.

ඔහුගේ මෙම සේවා කාලය තුළ යුනියන් බැංකුවේ උප සභාපති ලෙසද, අනුකුලතා ප්‍රධානී ලෙස සහ ලංකා බැංකුවේ කළමණාකරන තොරතුරු තාක්ෂණ අංශයේ ප්‍රධානී ලෙසද, ව්‍යාවහාරික හා දේශීය බැංකු ව්‍යාපාර අංශයේ විවිධ වූ විධායක තනතුරු ගණනාවක් ද හොබවා ඇත.
එසේම ඔහු ධීවර හා ජලජ සම්පත් අමාත්‍යංශයේ ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකයේ සභාපති ලෙස වසර 4ක් සේවය කර ඇත.

ඔහු 1991 වර්ෂයේදී පරිගණක තොරතුරු තාක්ෂණය පිළිබඳ පාඨමාලාවක්ද 2000 වර්ෂයේදී සිංගප්පූරුවේ ජාතික විශ්ව විද්‍යාලය මඟින් පවත්වනු ලබන ගිණුම්කරණය මූල්‍යකරණය පිළිබඳ පාඨමාලාවක්ද හදාරා ඇත.

**වෛද්‍ය සුසී පෙරේරා**
**- අධ්‍යක්ෂ**

වෛද්‍ය සුසී පෙරේරා මහත්මිය දැනට සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ව්‍යාපෘති සංවර්ධන අධ්‍යක්ෂ ධූරය හොබවයි.

ඇය කොළඹ වෛද්‍ය විද්‍යාගලයේ උපාධිධාරිණියක් වන අතර ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධියක් හා ආචාර්ය උපාධියක් ලබා ඇත.

ඇය කොළඹ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ප්‍රජා වෛද්‍ය විද්‍යා ඒකකයේ අධ්‍යයන මණ්ඩල සාමාජිකයෙකි. එසේම ඇය ශ්‍රී ලංකා ප්‍රජා වෛද්‍ය විද්‍යාලයේ සභාපතිනිය ලෙස ද කටයුතුකර ඇත.

ඇය ශ්‍රී ලංකා ප්‍රාථමික සෞඛ්‍ය වැඩසටහන් වලට දායක වී ඇති අතර ශ්‍රී ලංකා ජාතික සංක්‍රමණික සෞඛ්‍ය ප්‍රතිපත්තිය හා නිදන්ගත බෝ නොවන රෝග පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සංවර්ධනය කිරීමෙහි ලා දායකත්වය ලබා දී ඇත. ඇය ශ්‍රී ලංකා පොදු වෛද්‍ය විද්‍යාලයේ හා ශ්‍රී ලංකා ප්‍රජා වෛද්‍ය විද්‍යාලයේ ගෞරවණීය සාමාජිකත්වය උසුලයි.

**වෛද්‍ය වෙන්කතේෂ්වරන්**
**- අධ්‍යක්ෂ**

වෛද්‍ය වෙන්කතේෂ්වරන් මහතා දැනට වහී ඉදිකිරීම් පුද්ගලික ආයතනයේ කළමණාකාර අධ්‍යක්ෂකවරයා ලෙස කටයුතු කරයි.

ඔහු වාණිජ විද්‍යාවේදී උපාධිය හා ආචාර්ය උපාධිය ද හොබවයි.

එසේම ඔහුට අලෙවිකරණ ක්ෂේත්‍රයේ අවුරුදු 21ක පළපුරුද්දක් ඇත.

**ෂරීක් රාජාබ්ඩීන්**
**- අධ්‍යක්ෂ**

මොහොමඩ් ෂරීක් රාජාබ්ඩීන් මහතා දැනට ජාතික ජල සම්පාදන සහ ජලාපවාහන මණ්ඩලයේ උප සභාපති ධූරය හොබවයි.

ඔහු 1974 සිට දේපළ වෙළඳාම, හාඩ්වෙයාර් භාණ්ඩ, සනීපාරක්ෂක භාණ්ඩ සහ ගෘහ උපකරණ ආදියට සම්බන්ධ සමාගම් සමූහයක කළමණාකාරිත්වයට සම්බන්ධව කටයුතු කරයි.

එසේම ඔහු සෙරන්ඩිබ් ආයතනයේ උප සභාපතිවරයා ලෙසද කටයුතු කර ඇති අතර පාර්ලිමේන්තුව, බස්නාහිර පළාත් සභාව හා කොළඹ මහ නගර සභාව තුළ සාමාජිකයෙක් වශයෙන්ද කටයුතු කර ඇත.

**මියුරු භාෂිත ලියනගේ**
**- අධ්‍යක්ෂ**

මියුරු භාෂිත ලියනගේ මහතා දැනට අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ පාර්ලිමේන්තු කටයුතු ලේකම් වශයෙන් කටයුතු කරන අතර සරස සමූහ ව්‍යාපාරයේ සභාපති/කළමණාකාර අධ්‍යක්ෂ, උපදේශක ලේඛන කලාව සහ පොලිස් හා මහජන සම්බන්ධතා (බාහිර) උපදේශකවරයෙක වශයෙන් ද කටයුතු කරයි.

ඔහු ජනසන්නිවේදනය පිළිබඳ විශේෂ උපාධිධාරියෙක් වේ. එසේම බෙල්වුඩ් ආයතනයේ සෞන්දර්ය කලා ඩිප්ලෝමාව, ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනයේ ව්‍යාපාර කළමනාකරණ ඩිප්ලෝමාව, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ග්‍රන්ථ කර්තෘ හා ජනසන්නිවේදනය පිළිබඳ ඩිප්ලෝමාව 2012 වර්ෂයේ කොළඹ විශ්ව විද්‍යාලයේ පුවත්පත් කලාවේදී ඩිප්ලෝමාව සහ විවෘත විශ්ව විද්‍යාලයේ ග්‍රන්ථ කර්තෘ හා ජනසන්නිවේදනය පිළිබඳ සහතික පත්‍ර හිමි අයෙකි.එසේම දැනට කොළඹ විශ්වවිද්‍යාලයේ ලේඛන කලාව පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමා උපාධිය සහ ජන සන්නිවේදන පශ්චාත් උපාධිය හදාරනු ලබයි. එසේම ඔහු පුවත්පත් කලාවේදියෙක් හා විවිධ වැඩසටහන් ඉදිරිපත් කරන්නෙක් වශයෙන් රූපවාහිනී සහ ගුවන් විදුලියේ සේවය කර ඇත.

**කේ ඩී එස් රුවන්චන්ද්‍ර**
**- අධ්‍යක්ෂ**

කේ ඩී එස් රුවන්චන්ද්‍ර මහතා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යංශයේ ලේඛම් වශයෙන් කටයුතු කරයි.

ඔහු සිංගප්පූරුවේ ජාතික විශ්ව විද්‍යාලයේ රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳව පශ්චාත් උපාධිය ද, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ රාජ්‍ය පරිපාලන උපාධිය සහ උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව ද ලබා ගෙන ඇත. එසේම ඔහු වරලත් කළමණාකරණ ගණකාධිකරණ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකි.

ඔහු මුදල් අමාත්‍යංශයේ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ සහ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන් සේවය කර ඇත. එසේම ඔහු ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යංශය, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යංශය, ආරක්ෂක හා නගර සංවර්ධන අමාත්‍යංශය, රාජ්‍ය කළමණාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යංශය යන අමාත්‍යංශ වල අතිරේක ලේකම් වශයෙන් සේවය කර ඇත. එසේම බීජිංහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ අමාත්‍යංශ උපදේශක වශයෙන්ද විදේශ කටයුතු අමාත්‍යංශයේ අධ්‍යක්ෂක/ උපදේශක වශයෙන් සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂක ලෙසද කටයුතු කර ඇත.

# අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ අධ්‍යක්ෂවරුන් 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සිය විගණිත ගිණුම් වාර්තා ඉදිරිපත් කරනුයේ ඉමහත් සතුටිනි. ගිණුම් වාර්තා පිටු 19-45 දක්වා ඇත.

## ප්‍රධාන කාර්යයන්

සංස්ථාවේ ප්‍රධාන කාර්යයන් වන්නේ,

- ඖෂධ නිෂ්පාදනය, සැකසීම, ගබඩා කිරීම, ඇසිරීම සහ නැවත ඇසිරීම
- ඖෂධ නිෂ්පාදනයට සහ සැකසීමට අවශ්‍ය තාක්ෂණික සහය සැපයීම
- ඖෂධ විද්‍යා සහ ඖෂධ ද්‍රව්‍ය පිළිබඳ පර්යේෂණ සහ ඖෂධ ප්‍රමිතිකරණය සහ
- නිෂ්පාදිත ඖෂධ අලෙවි කිරීම

අදාල වර්ෂය තුළදී සංස්ථාවේ මූලික කාර්යයන් සම්බන්ධයෙන් සැලකිය යුතු වෙනස් වීමක් සිදුවී නොමැත.

## ව්‍යාපාර සමාලෝචනය

2017 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ කාර්යයන් හි තත්වය පිළිබඳ තොරතුරු අඩංගු ශේෂ පත්‍රය 21 පිටුවේ දක්වා ඇත. අදාල මූල්‍ය වර්ෂයේ සංස්ථාවේ තක්සේරුව පිළිබඳව සභාපතිතුමාගේ සමාලෝචනයෙහි පිටු 07 සිට 08 දක්වා ඇත.

## පිරිවැටුම සහ ප්‍රතිඵල

2017 වර්ෂයේ පිරිවැටුම සහ ප්‍රථිඵල ඇතුලත් ආදායම් ප්‍රකාශය හා ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය පිළිවෙලින් 22 සහ 23 පිටු වල දක්වා ඇත.

## අනාගත සංවර්ධන කාර්යයන්

ව්‍යාපාරයේ අනාගත සංවර්ධනය පිළිබඳව සභාපතිතුමාගේ සමාලෝචනයෙහි පිටු අංක 07 සිට 08 දක්වා ඇත.

## පරිත්‍යාග

අදාල වර්ෂය තුල සංස්ථාව විසින් පරිත්‍යාග කිසිවක් ලබා දී නොමැත.

## දේපළ, පිරියත සහ උපකරණ

අදාල වර්ෂය තුළ ව්‍යාපාරයේ දේපළ, පිරියත සහ උපකරණ ඇතුලත් වාර්තා 33 පිටුවේ මූල්‍ය ප්‍රකාශයෙහි 01 වන සටහන මගින් දක්වා ඇත.

## ලාභාංශ / දායකත්වය

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව ලාභාංශ ලෙස රු මිලියන 45 ක දායකත්වයක් මහා භාණ්ඩාගාරයේ ඒකාබද්ධ අරමුදලට ගෙවා ඇත.

## සංචිත

මුළු සංචිත ප්‍රමාණය හා ඒවායේ සංයෝජනය ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය මගින් 23 පිටුවෙහි දක්වා ඇත.

## අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයන් හය දෙනෙකුගෙන් සමන්විත වන අතර ඔවුන් ගරු සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබේ. එක් අධ්‍යක්ෂවරයෙක් මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයෙක් වන අතර අනෙක් අධ්‍යක්ෂවරයා සෞඛ්‍ය,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය නියෝජනය කරයි.

## නව අධ්‍යක්ෂ මණ්ඩලය

නව අධ්‍යක්ෂ මණ්ඩලය 2015 වර්ෂයේ මැයි මස පත් කරන ලදී.

අදාළ කාලපරිච්ඡේදය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 08 ක් පැවැත්වුන අතර අදාල කාලපරිච්ඡේදය සඳහා සංස්ථාවේ කටයුතු සම්බන්ධ වගකීම සභාපතිවරයා හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ඇත.

| | |
|---|---|
| වෛද්‍ය එස්.ජී.සමරසුන්දර | - සභාපති |
| පී. සුන්දරලිංගම් | - කළමනාකාර අධ්‍යක්ෂ |
| මියුරු භාෂිත ලියනගේ | - අධ්‍යක්ෂ |
| වෛද්‍ය වෙන්කතේෂ්වරන් | - අධ්‍යක්ෂ |
| ශරීක් රාජාබ්ඩීන් | - අධ්‍යක්ෂ |
| වෛද්‍ය සුසී පෙරේරා | - අධ්‍යක්ෂ - සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජිත |
| කේ. ඩී. එස්. රුවන්චන්ද්‍ර | - අධ්‍යක්ෂ - මුදල් අමාත්‍යාංශයේ නියෝජිත |

## ගිණුම් ප්‍රතිපත්ති

සංස්ථාව උපයෝගී කරගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති 25 සිට 32 දක්වා පිටුවල ඇත.

## පරිසර සංරක්ෂණය

සිය ක්‍රියාකාරීත්වය තුළින් පරිසරයට අහිතකර ප්‍රතිඵලයක් ඇති නොවන පරිදි කටයුතු කිරීම සහ ඉහළම ගුණාත්මක භාවයෙන් යුතු නිෂ්පාදන අපගේ පාරිභෝගිකයන්ට සහ ප්‍රජාවට ලබා දීමෙන් ඔවුන්ට වාසිදායක ප්‍රතිඵලයක් ඇති කිරීම සංස්ථාවේ වගකීම වේ.

## ව්‍යවස්ථානුකූල ගෙවීම්

ශේෂ පත්‍ර දිනට රජයට හා සේවකයන්ට අදාල සියලුම ව්‍යවස්ථානුකූල ගෙවීම් කර තිබේ.

## ශේෂ පත්‍රයේ දිනට පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශයන් හි සැකසීමට හෝ හෙළිදරව් කිරීමට අවශ්‍ය සිදුවීම් කිසිවක් ශේෂ පත්‍ර දිනයේ සිට සිදුවී නොමැත.

## අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශයන් මූලිකවම පිළියෙල කරන ලද්දේ අඛණ්ඩ පැවැත්ම යන සංකල්පයට අනුකූලවය. සංස්ථාව සතුව ප්‍රමාණවත් සම්පත් පවත්නා බැවින් අධ්‍යක්ෂ මණ්ඩලය එහි අනාගත මෙහෙයුම් පිළිබඳව සෑහීමකට පත් වේ.

## විගණකවරුන් පත් කිරීම

1971 මූල්‍ය පනතේ ප්‍රකාරව විගණකාධිපතිවරයා සංස්ථාවේ විගණක වන අතර, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධව වාර්ෂික විගණනය විගණකාධිපතිවරයා විසින් කරන ලදී.

**වෛද්‍ය එස්. ජී. සමරසුන්දර**
**සභාපති**
**රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව**

# විගණන කමිටු වාර්තාව - 2017

2010/12/14 දිනැති අංක පීඊඩී 55 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛය අනුව විගණන කමිටුව පිහිටුවා ඇත.

ඉහත චක්‍රලේඛයට අනුව අදාළ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත හා අනෙකුත් නීතිමය අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි මූල්‍ය වාර්තාකරණය සාක්ෂාත් කර ගැනිම සඳහා සහය වීමට, රජය විසින් නිකුත් කරන ලද අදාළ නීති, රෙගුලාසි සහ චක්‍රලේඛයන්ට ඇති අනුකූලතාවය විමර්ශනය කිරීම හා අනුකූල නොවන අවස්ථාවල අධ්‍යක්‍ෂ මණ්ඩලයට නිර්දේශයන් ඉදිරිපත් කිරීමට, අභ්‍යන්තර හා බාහිර විගණන වාර්තා කළමනාකරණ ලිපි, පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර කාරක සභාවේ (COPE) නිර්දේශයන් විමර්ශනය කිරීමට ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන පද්ධති හදුන්වා දීම හා ක්‍රියාත්මක කිරීමට විගණන කමිටුව විසින් අධ්‍යක්‍ෂ මණ්ඩලයට සහය විය යුතු වේ.

වර්ෂය තුළදී සංස්ථාවේ විධායක නොවන අධ්‍යක්‍ෂවරුන් හතර දෙනෙකුගෙන් සමන්විත වූ විගණන කමිටුවෙහි සභාපතිත්වය දරනු ලැබුවේ මහා භාණ්ඩාගාරය නියෝජනය කරන අධ්‍යක්‍ෂවරයා විසිනි.

උක්ත චක්‍රලේඛය අනුව විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙක් නිරීක්‍ෂකයෙකු ලෙස මෙම රැස්වීම්වලට සහභාගි වී ඇති අතර සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයාද එම අමාත්‍යාංශයේ නිරීක්‍ෂකයකු ලෙස මෙම රැස්වීම්වලට සහභාගී වී ඇත.

2017 මූල්‍ය වර්ෂය තුළ විගණන කමිටු රැස්වීම් හතරක් (04) පවත්වා ඇත.

2017 වසර තුළ කමිටුව විසින්,

- අභ්‍යන්තර විගණන වාර්තා මගින් පෙන්වා දී ඇති අඩු පාඩු සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ පිළිතුරු අවධානයට යොමු කර ඒවා නිවැරදි කිරීම සඳහා අදාළ කළමණාකාරීත්වය විසින් ගෙන ඇති පියවරයන් සැලකිල්ලට ලක් කර ඇත.
- සංස්ථාවේ කාර්යයන් කාර්යක්‍ෂම ලෙස පවත්වාගෙන යාම සඳහා තොග හා භාණ්ඩ ලේඛන, ස්ථාවර වත්කම්, ස්ථාවර වත්කම් මිලදී ගැණුම්, තෝරාගත් භාණ්ඩ මිලගණන් හා ගෙවීම් යන ක්ෂේත්‍රයන්හි ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන පද්ධති කිහිපයක් පිළිබඳව විමර්ශනය කර සුදුසු නිර්දේශ ඉදිරිපත් කර ඇත.
- අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් ගෙන ඇති පසුවිපරම් කටයුතු පිළිබඳව කමිටු නිර්දේශ සැළකිල්ලට ගෙන විමර්ශන සිදු කර ඇත.
- අමු ද්‍රව්‍ය, ඇසුරුම් ද්‍රව්‍ය, නිෂ්පාදනය වෙමින් පවතින ද්‍රව්‍ය, නිෂ්පාදන භාණ්ඩ, වට්ටෝරු දෙපාර්තමේන්තුවේ අමු ද්‍රව්‍ය හා නිෂ්පාදනය වෙමින් පවතින ද්‍රව්‍ය, ස්ථාවර වත්කම් හා අමතර කොටස් ඇතුළුව හානිවූ හා අවභාවිත වත්කම් බැහැර කිරීමේ හා විනාශ කිරීමේ ක්‍රියාපටිපාටිය විමර්ශනය කර නිර්දේශ ඉදිරිපත් කර ඇත.
- මූල්‍ය වාර්තා කරණයේ හා සංස්ථා අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණාත්මක භාවය පිළිබඳ සැලකිල්ලට ගෙන ඇත.
- විගණකාධිපතිවරයා විසින් පෙන්වා දුන් කරුණු පිළිබඳව සංස්ථාවේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් ලබා දුන් කරුණු සැලකිල්ලට ගෙන ඇත.
- දැනට පවත්නා ව්‍යවසාය සම්පත් සැලසුම් කිරීමේ පද්ධතිය අධ්‍යයනය කිරීම සඳහා තොරතුරු තාක්‍ෂණය පිළිබඳ සුදුසු උපදේශකවරයෙක් තෝරාගැනීම පිළිබඳව සලකා බැලීම හා නව ව්‍යවසාය සම්පත් සැලසුම් කිරීමේ පද්ධතියක් (ERP) ලබා ගැනීම පිළිබඳව අවධානය යොමු කර සුදුසු නිර්දේශ ඉදිරිපත් කර ඇත.
- දැනට පවතින ව්‍යවසාය සම්පත් සැලසුම් කිරීමේ පද්ධතියෙන් (ERP) ලබා ගන්නා තොරතුරු නිසි අධීක්‍ෂණයට ලක් කර ඇත.
- අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති විමර්ශන වාර්තාවල අඩංගු කරුණු මගින් පෙන්වා දී ඇති අඩු පාඩු සලකා බලා ඒ සඳහා සුදුසු නිර්දේශයන් ඉදිරිපත් කර ඇත.

විගණන කමිටුවේ කාර්ය පැවරුම් නියමයන් සියලු ප්‍රමාණාත්මක කරුණු සම්බන්ධයෙන් අනුකූල වූ බව කමිටුවේ මතයයි.

විගණක කමිටු සාමාජිකයන්

| | | |
|---|---|---|
| කේ ඩී එස් රුවන්චන්ද්‍ර | - සභාපති | - අධ්‍යක්‍ෂ - රා ඖ නි ස - භාණ්ඩාගාර නියෝජිත |
| මියුරු භාෂිත ලියනගේ | - සාමාජික | - අධ්‍යක්‍ෂ - රා ඖ නි ස |
| ශෆීක් රාජාබ්ඩීන් | - සාමාජික | - අධ්‍යක්‍ෂ - රා ඖ නි ස |
| වෛද්‍ය සුසී පෙරේරා | - සාමාජික | - අධ්‍යක්‍ෂ - රා ඖ නි ස |

කේ ඩී එස් රුවන්චන්ද්‍ර
විගණන කමිටුවේ සභාපති
2018.10.04

# ආයතනික පාලන වාර්තාව

ආයතනික පාලනය යනු ඉහළ විනිවිදභාවය, නිරවද්‍ය හා කාලීන මූල්‍ය වාර්තාකරණය සාක්ෂාත් කිරීම මගින් ආයතනයට සම්බන්ධ පාර්ශවයන්ගේ (ආයෝජකයින්, සේවකයින්, සැපයුම්කරුවන්, පාරිභෝගිකයින්, රජය සහ ප්‍රජාව) අභිමතාර්ථ සාධනය උදෙසා කළමනාකරණය විසින් ආයතන අධ්‍යක්ෂණය සහ පාලනය කරන ක්‍රම පිළිවෙලයි.

සංස්ථාපිත පාලන සම්බන්ධ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලැබේ.

## අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලය, කළමනාකරණ, ඖෂධවේද, වෛද්‍ය විද්‍යාව, අලෙවිකරණය, මූල්‍ය හා පරිපාලනය යන ක්ෂේත්‍රයන්හි වෘත්තීමය සහ අත්දැකීම් බහුල පුද්ගලයන්ගෙන් සැදුම් ලබයි.

විධායක අධ්‍යක්ෂවරයෙකු වන සභාපතිවරයා සහ කළමණාකාර අධ්‍යක්ෂවරයෙකුගෙන් සහ විධායක නොවන අධ්‍යක්ෂවරු පස් දෙනෙකු ගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වේ.

පාර්ලිමේන්තුව විසුරුවා හැර ඇති අවස්ථාවකදී හෝ ගරු ඇමතිවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලය පත්කර නොමැති විටකදී හැර අධ්‍යක්ෂ මණ්ඩලය මාසිකව රැස්වේ. අවශ්‍ය විටෙකදී විශේෂ රැස්වීමක් පැවැත් වීමටද කටයුතු කරනු ලැබේ.

සමාලෝචනයට ලක් වූ කාල පරිච්ඡේදය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අටක් පැවැත්වුණි.

## කළමනාකරණ කමිටුව

සංස්ථාපිත කළමනාකරණ කමිටුවේ සභාපති තනතුර සංස්ථාවේ සභාපතිවරයා විසින් හොබවනු ලැබේ. අනෙකුත් කමිටු නිළධාරීන් වන්නේ සංස්ථාවේ සාමාන්‍යාධිකාරී, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ නියෝජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ය.

සංස්ථාවේ එදිනෙදා කටයුතු සම්බන්ධ තීරණ ගැනීම, ප්‍රතිපත්තිමය තීරණ සහ උපාය මාර්ගික අරමුණු ක්‍රියාත්මක කිරීම මෙන්ම අවශ්‍ය විටෙක ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට සුදුසු නිර්දේශයන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම ආදී කටයුතු කළමනාකරණ කමිටුව මගින් සිදුකෙරේ. කළමනාකරණ කමිටුව මාසිකව රැස්වේ.

## විගණන කමිටුව

"යහපත් පාලනය සහ පොදු ව්‍යාපාර මාර්ගෝපදේශ" සහ රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ වලට අනුකූලව විගණන කමිටු පිහිටුවා ඇත.

විගණන කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කෙරෙන අතර සංස්ථාවේ විධායක නොවන අධ්‍යක්ෂවරුන් හතරදෙනෙකුගෙන් සමන්විත වේ. මුදල් අමාත්‍යාංශය නියෝජනය කරන අධක්ෂවරයා කමිටුවේ සභාපති වේ. සංස්ථාවේ කාර්යයන් පරීක්ෂා කිරීම සහ ඇගයීම් විගණන කමිටුව විසින් ස්වාධීනව කරනු ලැබේ. අභ්‍යන්තර විගණන කාර්යයන්, විගණන කමිටුවේ අනුමැතිය මත පිළියෙල කරන ලද අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව සිදු කෙරෙන අතර එය විගණකාධිපතිවරයාගේ දැනුවත් වීමට ද යොමු කෙරේ.

අදාල කාල පරිච්ඡේදය තුළදී විගණන කමිටු රැස්වීම් හතරක් පැවැත්වුණි. විගණන කමිටුවේ වාර්තාව පිටු අංක 14 හි දක්වා ඇත.

## ආයෝජකයන්ගේ සම්බන්ධතා සහ පොදු වගකීම

ජනතාව වෙනුවෙන් රජය විසින් පොදු ව්‍යාපාර පිහිටුවීම, අයිතිය පවත්වා ගෙන යාම සහ මෙහෙයවීම කරනු ලැබේ. එම නිසා සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකරුවන් ආයතනය පාලනය කිරීම සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශය ලෙස සෞඛ්‍ය,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයටත්, මුදල් අමාත්‍යාංශයේ මහා භාණ්ඩාගාරයටත් වගකිව යුතු වේ. මෙම වගකීම සපුරාලමින් වාර්ෂික වාර්තාව, වාර්ෂික ගිණුම්, වාර්ෂික අයවැය, කාර්තු සඳහා ප්‍රගති වාර්තා ආදිය එම අමාත්‍යාංශ වලට ඉදිරිපත් කරනු ලැබේ.

රාජ්‍ය මූල්‍ය සම්බන්ධව අවසාන අධිකාරී බලය ජනතා නියෝජිතයින් නියෝජනය කරන්නා වූ පාර්ලිමේන්තුව සතුව පවතින බව ප්‍රජාතන්ත්‍රවාදී ලෝකය විසින් පිළිගෙන ඇත.

ආයතනයේ ප්‍රගතිය, මූල්‍ය වාර්තා, විගණන වාර්තාව ඇතුලත් වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තු නියෝජිතයන්ගේ සමාලෝචනය සඳහා ඉදිරිපත් කරනු ලැබේ.

පොදු ව්‍යාපාරයක් ලෙස සංස්ථාව පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර සඳහා වන පාර්ලිමේන්තු කාරක සභාවට (COPE) වග කියනු ලැබේ.

## වේතන ප්‍රතිපත්තිය

සංස්ථාවේ වේතන ප්‍රතිපත්තිය මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිර්දේශයන් මත පිහිටුවා සකසා ඇත.

අධ්‍යක්ෂ වේතන සහ අනෙකුත් දීමනා මුදල් අමාත්‍යාංශය මගින් නිකුත් කරන රාජ්‍ය සංස්ථා වලට අදාල වේතන හා දීමනා සඳහා වන චක්‍රලේඛ මත පදනම්ව ගෙවනු ලැබේ.

සේවක වේතන රාජ්‍ය පරිපාලන වැටුප් තලයන් පාදක කර ගනිමින් සංස්ථාව විසින් පිළියෙල කරන ලද වැටුප් තලයන් අනුව මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේනතුවේ අනුමැතිය ඇතිව ගෙවනු ලැබේ. කාර්යසාධනය මත සෘජුවම අගය කිරීමක් ලෙස කාර්යසාධන දිරිදීමනාව හඳුනාගෙන ඇත.

## අභ්‍යන්තර පාලනය

ආයතනය විසින් එළඹෙන සියලු ගනුදෙනු සඳහා නියමිත අධිකාරිය ලැබුන බවටත්, සටහන් ගත කිරීම, වාර්තා කිරීම යන කරුණු සම්බන්ධයෙන් සාධාරණ තහවුරු කිරීමක් ඇතිවන පරිදි අභ්‍යන්තර පාලනය සැලසුම් කොට ඇති බවටත් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි.

කාර්යයන් මත පදනම් වූ ආයතනික සැලැස්මක් ක්‍රියාත්මක වේ. නියමිත කාර්යයන් අනුව දෙපාර්තමේන්තු සැලසුම් කර ඇති අතර ඒවා නිෂ්පාදන, තත්ව පාලන, නඩත්තු, මූල්‍ය, සැලසුම්, වට්ටෝරු පර්යේෂණ හා සංවර්ධන, අලෙවිකරණ ආදී වශයෙන් වෙති.

සංස්ථාවේ ප්‍රධාන විධායක නිලධාරී වන සාමාන්‍යාධිකාරී වෙත එක් එක් දෙපාර්තමේන්තු ප්‍රධානියා ඍජුවම වාර්තා කරයි.

සාමාන්‍යාධිකාරී, සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරයි. අභ්‍යන්තර විගණන කාර්යය මගින් අභ්‍යන්තර පාලනය තව දුරටත් ශක්තිමත් කෙරේ. අභ්‍යන්තර විගණක ඍජුවම සභාපතිවරයාට සහ විගණන කමිටුවට වාර්තා කිරීම මගින් අභ්‍යන්තර විගණකගේ ස්වාධීනත්වය තවදුරටත් තහවුරු කෙරේ.

මිලදී ගැනීමේ ක්‍රියාවලිය තරඟකාරී ටෙන්ඩර් පටිපාටිය මගින් සිදු කෙරෙන අතර ගණුදෙනු වල විනිවිදභාවය රැකීම තුලින් සැපයුම්කරුවන්ට මෙ මගින් සමාන අවස්ථා ද ලැබේ.

ප්‍රාග්ධන අයවැය ඇතුළත් වාර්ෂික අයවැය ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කොට සෞඛ්‍ය,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයට හා මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කරනු ලැබේ.

# අපගේ නිපැයුම් වර්ග

අපගේ එක් එක් නිපැයුම් වර්ග අනුව නිෂ්පාදිත පෙති හා කරල් සංඛ්‍යාව

| නිපැයුම් වර්ග | ප්‍රමාණය මිලියන වලින් | නිපැයුම් වර්ග | ප්‍රමාණය මිලියන වලින් |
|---|---|---|---|
| ඇලුමිනියම් හයිඩ්‍රොක්සයිඩ් පෙති BP මි.ග්‍රෑ 500 | 0.912 | ග්ලික්ලසයිඩ් පෙති BP මි.ග්‍රෑ 40 | 114.000 |
| ඇමොක්සිසිලින් පෙති USP මි.ග්‍රෑ 125 | 8.837 | ග්ලික්ලසයිඩ් පෙති BP මි.ග්‍රෑ 80 | 63.000 |
| ඇමොක්සිසිලින් කරල් BP මි.ග්‍රෑ 250 | 118.758 | ලොසාටන් පොටෑසියම් පෙති මි.ග්‍රෑ 50 | 9.600 |
| ඇමොක්සිසිලින් කරල් BP මි.ග්‍රෑ 500 | 22.750 | මෙබෙන්ඩසෝල් පෙති USP මි.ග්‍රෑ 500 | 0.640 |
| ඇස්කෝබික් අම්ලය පෙති BP මි.ග්‍රෑ 100 | 29.700 | මෙට්ෆෝමින් පෙති BP මි.ග්‍රෑ 500 | 22.750 |
| ඇටෝවාස්ටටින් පෙති BP මි.ග්‍රෑ 10 | 18.000 | පැරසිටමෝල් පෙති BP මි.ග්‍රෑ 500 | 259.200 |
| ඇටනොලොල් පෙති BP මි.ග්‍රෑ 50 | 1.000 | ෆිනොක්සිමීතයිල් පෙනිසිලින් පෙති BP මි.ග්‍රෑ 250 | 28.716 |
| බෙන්සෙක්සෝල් පෙති BP මි.ග්‍රෑ 2 | 66.000 | ෆිනොක්සිමීතයිල් පෙනිසිලින් පෙති BP මි.ග්‍රෑ 125 | 0.900 |
| කාබමෙසපීන් පෙති BP මි.ග්‍රෑ 200 | 26.000 | ප්‍රෙඩ්නිසෙලෝන් පෙති BP මි.ග්‍රෑ 5 | 215.600 |
| සිමෙටිඩීන් පෙති BP මි.ග්‍රෑ 200 | 7.280 | ප්‍රොප්‍රනලෝල් පෙති BP මි.ග්‍රෑ 40 | 18.000 |
| ක්ලැරිත්රොමයිසින් පෙති මි.ග්‍රෑ 250 | 6.400 | සැල්බියුටමෝල් පෙති BP මි.ග්‍රෑ 2 | 151.200 |
| ක්ලොක්සසිලීන් කරල් BP මි.ග්‍රෑ 250 | 58.100 | සැල්බියුටමෝල් පෙති BP මි.ග්‍රෑ 4 | 12.000 |
| ක්ලොක්සසිලීන් කරල් BP මි.ග්‍රෑ 500 | 42.700 | ස්පයිරනොලැක්ටෝන් පෙති USP මි.ග්‍රෑ 25 | 6.900 |
| සිප්රොෆ්ලොක්සසින් පෙති USP මි.ග්‍රෑ 500 | 4.800 | තියෝෆිලීන් පෙති ER USP මි.ග්‍රෑ 125 | 30.800 |
| කෝට්‍රිමොක්සසෝල් පෙති BP මි.ග්‍රෑ 480 (වැඩිහිටි) | 0.750 | ට්‍රයිප්ලුවොපෙරසීන් HCl පෙති BP මි.ග්‍රෑ 5 | 4.500 |
| ඩයික්ලෝෆෙනැක් සෝඩියම් පෙති USP මි.ග්‍රෑ 50 | 22.100 | ටොල්බියුටමයිඩ් පෙති BP මි.ග්‍රෑ 500 | 3.780 |
| ඩිල්ටියසෙම් HCL පෙති මි.ග්‍රෑ 60 | 24.750 | වෙරපමිල් පෙති BP මි.ග්‍රෑ 40 | 28.050 |
| ඩයිඊතයිල් කාබමසීන් පෙති BP මි.ග්‍රෑ 50 | 13.500 | විටමින් බී පෙති CHF | 50.400 |
| ෆැමොටිඩීන් පෙති USP මි.ග්‍රෑ 20 | 8.100 | විටමින් බී ස්ට්‍රෝං පෙති BPC | 8.000 |
| ෆෲසෙමයිඩ් පෙති BP මි.ග්‍රෑ 40 | 28.500 | | |

**ඉදිරියේදී නිපදවීමට අදහස්කර ඇති ඖෂධ - 2018**

සෙට්රිසින් පෙති BP මි.ග්‍රෑ 10

ක්ලොපිඩොග්‍රිල් බයිසල්ෆේට් පෙති USP මි.ග්‍රෑ 75

සිප්රොෆ්ලොක්සසින් පෙති USP මි.ග්‍රෑ 250

ප්‍රෙඩ්නිසෙලෝන් පෙති BP මි.ග්‍රෑ 1

ෆෝලික් ඇසිඩ් පෙති BP ම.ග්‍රෑ 400

ඇටෝවාස්ටටින් පෙති BP මි.ග්‍රෑ 20

ඩිල්ටියසෙම් HCL පෙති මි.ග්‍රෑ 30

සෙෆලෙක්සින් BP කරල් මි.ග්‍රෑ 250

ලෙවතයිරොක්සින් පෙති BP ම.ග්‍රෑ 50

# අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් වාර්තාව

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම්, පිටු අංක 46-63 හි ඇතුලත් විගණකාධිපති වාර්තාවේ සඳහන් විගණකවරයාගේ වගකීම තුලින් වෙනස් වේ.

1971 අංක 38 දරණ මුදල් පනතට අනුකූලව රාජ්‍ය සංස්ථා විසින් ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් සහ සංස්ථාවේ අනෙකුත් සියළුම ගනු දෙනු පිළිබඳ ගිණුම් වාර්තා සුදුසු පරිදි තබා ගත යුතුය. රාජ්‍ය සංස්ථා විසින් ගිණුම් පිළිබඳ වාර්ෂික වාර්තාවක් සහ සංස්ථාවේ ක්‍රියාකාරකම් හා සම්බන්ධ වූ සංඛ්‍යානමය කරුණු, එකී ස්වරූපයන් හා එකී කරුණු ඇතුලත්ව පිළියෙල කළ යුතුය.

රජය සහ ආයතනයට සම්බන්ධ පාර්ශවයන් නියෝජනය කරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩලයට, ආයතනයේ භාරකාරීත්වය සම්බන්ධයෙන් ව්‍යවස්ථානුකූලව වගකීමක් හිමිව තිබෙන අතර සංස්ථාවේ මූල්‍ය තත්වය පිළිබඳ සාධාරණ නිවැරදි තාවයකින් යුක්තව හෙළිදරවු කිරීම සඳහා ප්‍රමාණවත් ගිණුම් වාර්තා සංස්ථාව තුළ තබා ගැනීමට ඔවුන වගකීමෙන් බැඳේ. එසේම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සිදු කොට ඇති බවට සහ 1971 අංක 38 දරණ මුදල් පනතට අනුකූලව අවශ්‍ය තොරතුරු සපයා ඇති බවට සහ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී අඛණ්ඩ පැවැත්ම සංකල්පය අධ්‍යක්ෂවරුන් විසින් අනුගමනය කර ඇති බව සහතික කළ යුතුය.

සංස්ථාවේ වත්කම් ආරක්ෂා කිරීම සඳහා සාධාරණ පියවරයන් ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට වගකීමක් ඇති අතර, මේ සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන, අභ්‍යන්තර සෝදිසි කිරීම්,මූල්‍යමය සමාලෝචනය සහ වංචා හා අක්‍රමිකතා අනාවරණය කර ගැනීම ඇතුළත් වූ ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රමස්ථාපනය කිරීම සඳහා සුදුසු සලකා බැලීම් කිරීමේ වගකීමද ඔවුන් සතුය.

1971 අංක 38 දරණ මුදල් පනතට අනුකූලව විගණකාධිපති,අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කළ සියලුම මූල්‍ය වාර්තා හා සම්බන්ධිත දත්ත සමග මූල්‍ය ප්‍රකාශන පරීක්ෂා කර ඇති මතය මෙම වාර්තාවේ පිටු අංක 46-63 හි සඳහන්ව ඇත.

# මූල්‍ය ප්‍රකාශන

2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2017.12.31 දිනට

(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි)

| | සටහන | 31.12.2017 දිනට | 31.12.2016 දිනට |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ පිරියත හා උපකරණ | 01 | 802,775,316 | 798,657,066 |
| අස්පෘශ්‍ය වත්කම් | 02 | 1,720,952 | 1,128,780 |
| වෙනත් ජංගම නොවන වත්කම් | 05 | 1,302,233 | 438,094 |
| පෙර ගෙවූ කල් බදු | 04 | 3,380,221 | 3,429,209 |
| නොනිමි වැඩ | | 85,299,340 | 21,586,468 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 06 | 799,112,524 | 751,873,001 |
| වෙළඳ හා වෙනත් අයවිය යුතු දේ | 07 | 434,523,866 | 139,049,949 |
| පූර්ව ගෙවීම් | 08 | 17,520,999 | 8,735,569 |
| වෙනත් මූල්‍ය වත්කම් | 09 | 926,461,067 | 1,175,754,426 |
| බැංකු සහ අතැති මුදල | 10 | 1,374,564 | 1,631,481 |
| | | 2,178,993,021 | 2,077,044,426 |
| **මුළු වත්කම්** | | **3,073,471,082** | **2,902,284,042** |
| **කාරක ප්‍රාග්ධනය හා බැරකම්** | | | |
| අනුදත් ප්‍රාග්ධනය | | 850,000,000 | 850,000,000 |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 11 | 690,079,000 | 690,079,000 |
| රඳවා ගත් ඉපැයීම් | | 2,051,566,519 | 1,869,310,352 |
| මුළු කාරක ප්‍රාග්ධනය | | 2,741,645,519 | 2,559,389,352 |
| **ජංගම නොවන බැරකම්** | | | |
| සේවක ප්‍රතිලාභ බැරකම් | | 41,213,529 | 40,862,404 |
| විලම්බිත බදු බැරකම් | 12 | 135,323,858 | 133,251,496 |
| | | 176,537,387 | 174,113,900 |
| **ජංගම බැරකම්** | | | |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දේ | 13 | 112,291,372 | 96,565,523 |
| ගෙවිය යුතු බදු | | 42,996,805 | 72,215,267 |
| | | 155,288,177 | 168,780,790 |
| **මුළු කාරක ප්‍රාග්ධනය හා බැරකම්** | | **3,073,471,082** | **2,902,284,042** |

මෙම මූල්‍ය ප්‍රකාශනවලට අදාල ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 24 සිට 31 දක්වා ඇති එසේම මෙම මූල්‍ය ප්‍රකාශන පිළියල කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරණු ලබන අතර මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යොමුකර ඇති සේම රජයේ විගණන දෙපාර්තමේන්තුවට ද ඉදිරිපත් කර ඇත.

සභාපති : ..............................

කළමණාකාර අධ්‍යක්ෂ : ..............................

දිනය : 2018-02-28

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී - මූල්‍ය : ..............................

# ආදායම් ප්‍රකාශය

2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි)

| | සටහන | 2017 වර්ෂය සඳහා | 2016 වර්ෂය සඳහා |
|---|---|---|---|
| ආදායම | 14 | 3,174,612,664 | 2,434,508,479 |
| විකුණුම් පිරිවැය | 15 | (2,666,683,665) | (1,888,256,150) |
| දළ ලාභය | | 507,928,998 | 546,252,329 |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 16 | 20,988,536 | 26,190,482 |
| පරිපාලන වියදම් | 17 | (204,579,086) | (165,788,553) |
| විකුණුම් සහ බෙදාහැරීමේ වියදම් | 18 | (67,630,402) | (48,380,262) |
| අනිකුත් මෙහෙයුම් වියදම් | 19 | (11,926,527) | (4,497,428) |
| මෙහෙයුම් ලාභය | | 244,781,520 | 353,776,567 |
| මූල්‍ය පිරිවැය | 20 | (406,092) | (240,959) |
| මූල්‍ය ආදායම | 21 | 77,607,094 | 87,629,279 |
| බදු පෙර ලාභය | | 321,982,521 | 441,164,887 |
| බදු වියදම | 22 | (98,074,582) | (144,518,173) |
| වර්ෂය සඳහා ලාභය | | **223,907,939** | **296,646,714** |

| විස්තීරණ ආදායම් ප්‍රකාශය | 2017 වර්ෂය සඳහා | 2016 වර්ෂය සඳහා |
|---|---|---|
| වර්ෂය සඳහා ලාභය | **223,907,939** | **296,646,714** |
| (-) ප්‍රත්‍යක්ෂ ලාභ/අලාභ | 1,226,459 | 4,817,184 |
| උපකල්පන වෙනස්වීම් නිසා වූ ලාභ / අලාභ | 2,121,769 | 24,048,388 |
| බදු ගැලපීමෙන් පසු වෙනත් විස්තීරණ ආදයම | **3,348,228** | **28,865,572** |
| බදු ගැලපීමෙන් පසු මුළු වෙනත් විස්තීරණ ආදායම් | **227,256,167** | **325,512,286** |

# ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි)

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය | ලාභය / (අලාභය) | එකතුව |
|---|---|---|---|
| 2016.01.01 දිනට ශේෂය | 690,079,000 | 1,608,798,066 | 2,298,877,066 |
| වර්ෂය සඳහා ලාභය | - | 296,646,714 | 296,646,714 |
| වෙනත් විස්තීරණ ආදයම් | - | 28,865,572 | 28,865,572 |
| මුළු විස්තීරණ ආදායම් | - | 325,512,286 | 325,512,286 |
| මහා භාණ්ඩාගාරය වෙත දායකත්වය | - | (65,000,000) | (65,000,000) |
| **2016.12.31 දිනට ශේෂය** | **690,079,000** | **1,869,310,352** | **2,559,389,352** |
| 2017.01.01 දිනට ශේෂය | 690,079,000 | 1,869,310,352 | 2,559,389,352 |
| වර්ෂය සඳහා ලාභය | - | 223,907,939 | 223,907,939 |
| වෙනත් විස්තීරණ ආදයම් | - | 3,348,228 | 3,348,228 |
| මුළු විස්තීරණ ආදායම් | - | 227,256,167 | 227,256,167 |
| මහා භාණ්ඩාගාරය වෙත දායකත්වය | - | (45,000,000) | (45,000,000) |
| **2017.12.31 දිනට ශේෂය** | **690,079,000** | **2,051,566,519** | **2,741,645,519** |

# මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි)

| | 2017 වර්ෂය සඳහා | 2016 වර්ෂය සඳහා |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයන්** | | |
| බදු සහ අති විශේෂ අයිතමයන්ට පෙර ශුද්ධ ලාභය / (අලාභය) | 321,982,521 | 441,164,887 |
| ගැලපුම් :- | | |
| ස්ථාවර වත්කම් මත ක්ෂය | 105,693,713 | 110,886,391 |
| වර්තමාන පාරිතෝෂික පිරිවැය | 2,655,342 | 5,028,968 |
| සේවක පොළී පිරිවැය | 3,881,928 | 5,446,805 |
| ස්ථාවර වත්කම් විකිණීම මත ලාභ/අලාභ | - | (4,909,777) |
| හානි වූ හා අභාවිත ද්‍රව්‍ය පිරිවැය | 324,902 | 1,632,478 |
| බැංකු ඇපකර මඟින් අය කර ගැනීම(Dalas) | - | (7,525,587) |
| නොගෙවූ ටෙන්ඩර් බැඳුම්කර(වර්ෂ 20 වැඩි) | - | (4,473,719) |
| Claimed Late Charges | (12,971,037) | - |
| අය කර නොගත් රඳවා ගැනීම් | (4,952,389) | (4,187,151) |
| පොළී ආදායම | (73,534,273) | (85,783,178) |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය** | 343,080,706 | 457,280,117 |
| **කාරක ප්‍රාග්ධන අයිතමයන්හි වෙනස් වීම්** | | |
| තොග අඩු /(වැඩි) වීම | (47,239,523) | 20,989,038 |
| ණයගැතියන්ගේ හා අයවිය යුතුදේහි අඩු / (වැඩි) වීම | (295,473,917) | (17,871,154) |
| තැන්පතු වල සහ පෙර ගෙවීම්වල අඩු වීම/ (වැඩි) වීම | (8,785,430) | 5,192,183 |
| බැරකම් වල (අඩු) /වැඩි වීම | 33,649,275 | 2,960,033 |
| **මෙහෙයුම් වලින් ජනනය වූ මුදල්** | 25,231,111 | 468,550,217 |
| පාරිතෝෂික ගෙවීම් | (2,837,917) | (1,267,855) |
| ආදායම් බදු ගෙවීම් | (125,220,683) | (184,182,270) |
| **මෙහෙයුම් වලින් ජනනය වූ ශුද්ධ මුදල** | (102,827,489) | 283,100,093 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයන්** | | |
| කෙටිකාලීන ආයෝජන (සටහන - අ ) | 264,882,293 | (143,596,270) |
| ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම් | (174,392,920) | (161,545,630) |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ආදයම | - | 5,018,900 |
| ලැබුණු පොළිය | 57,945,340 | 81,013,817 |
| වෙනත් ජංගම නොවන වත්කම් ඉහළ නැංවීම | (864,140) | (67,033) |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා භාවිතා කළ ශුද්ධ මුදල** | 147,570,572 | (219,176,215) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයන්** | | |
| මහා භාණ්ඩාගාර දායකත්වය | (45,000,000) | (65,000,000) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා භාවිතා කළ ශුද්ධ මුදල** | (45,000,000) | (65,000,000) |
| **මුදල් සහ ආසන්න මුදල්වල ශුද්ධ වැඩි/ (අඩු) වීම්** | (256,917) | (1,076,122) |
| **වර්ෂය ආරම්භක මුදල් සහ ආසන්න මුදල්** | 1,631,481 | 2,707,603 |
| **වර්ෂය අවසාන මුදල් හා ආසන්න මුදල් (සටහන ආ)** | **1,374,564** | **1,631,481** |

**සටහන (අ) - ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය**

| | | |
|---|---|---|
| වර්ෂය තුළ මුදල් ගලා ඒම් | 5,945,552,908 | 7,709,395,948 |
| වර්ෂය තුළ මුදල් ගලා යෑම් | (6,210,435,201) | (7,565,799,678) |
| ශුද්ධ මුදල් ප්‍රවාහය | (264,882,293) | 143,596,270 |

**සටහන (ආ)**

**මුදල් සහ ආසන්න මුදල්**

| | | |
|---|---|---|
| ලංකා බැංකුව - රත්මලාන ශාඛාව | 41,084 | 54,043 |
| ලංකා බැංකුව - ආයතනික ශාඛාව | 1,228,266 | 971,147 |
| මහජන බැංකුව - රත්මලාන ශාඛාව | 40,698 | 249,278 |
| මහජන බැංකුව - ආයතනික ශාඛාව | 11,634 | 309,816 |
| මුදල් ශේෂය | 36,367 | 28,895 |
| සුළු මුදල් ශේෂය | 16,516 | 18,302 |
| | 1,374,564 | 1,631,481 |

# ආයතනික තොරතුරු සහ මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 1. ආයතනික තොරතුරු

**පොදු තොරතුරු**

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව 1957 අංක 49 දරණ කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ සංස්ථාපිත කර ඇත. මෙය රත්මලාන ශ්‍රීමත් ජෝන් කොතලාවල මාවතේ අංක 11 දරණ ස්ථානයේ පිහිටා ඇති රාජ්‍ය සංස්ථාවකි.
2017 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා සංස්ථාව මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කරන අතර, මෙම මූල්‍ය ප්‍රකාශ වලට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත.

**ප්‍රධාන ක්‍රියාකාරකම්**

**ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ:**

(අ) ඖෂධ නිෂ්පාදනය, සැකසීම, ගබඩා කිරීම, ඇසිරීම හා නැවත ඇසිරීම
(ආ) ඖෂධ නිෂ්පාදනයට හා සැකසීමට අවශ්‍ය තාක්ෂණික සහාය සැපයීම
(ඇ) ඖෂධ විද්‍යා සහ ඖෂධ ද්‍රව්‍ය පිළිබඳ පර්යේෂණ සහ ඖෂධ ප්‍රමිතිකරණය සහ
(ඈ) නිෂ්පාදිත ඖෂධ අලෙවි කිරීම

## 2. පිළියෙල කිරීමේ පදනම

### 2.1 අනුකූලතා ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශයන් පිළියෙළ කොට ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය මඟින් නිකුත් කල ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS/LKAS) වලට අනුකූලවය.

### 2.2 මිනුම් පදනම

මූල්‍ය ප්‍රකාශ පිළියෙල වී ඇත්තේ ඓතිහාසික පිරිවැය පදනම මතය. සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශ වල අගයන් ඉදිරිපත් කර ඇත්තේ ශ්‍රී ලංකා රුපියල් වලිනි.

## 3. මූලික ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

### 3.1 මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති

5.1.5 දක්වා ඇති පොදු කාර්ය වියදම් වෙන්කිරීම හැර ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර වර්ෂයේදී භාවිතා කරන ලද ඒවා සමග අනුකූල වේ.

#### 3.1.1 දේපළ, පිරියත සහ උපකරණ

දේපළ, පිරියත සහ උපකරණ සටහන් කර ඇත්තේ සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානිකරණ අලාභ වීම් ඇත්නම් ඒවා ද අන්තර්ග්‍රහණය කොට ගණනය කළ ශුද්ධ පිරිවැය ලෙසය. එම පිරිවැයට දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණවලට අළුතින් කොටස් මාරු කිරීමේදී දැරීමට සිදුවන පිරිවැය සහ පිරිවැය නිර්ණායක වලට අනුකූල වන්නේ නම්, දීර්ඝ කාලීන ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ණයට ගැනීමේ පිරිවැය ද ඇතුළත් වේ. යම් නියමිත කාලයකට වරක් දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ වල වැදගත් කොටස් වෙනුවට අලුත් ඒවා යෙදීම අවශ්‍ය වන්නේ නම්, එම ඉවත් කරනු ලබන කොටසට අදළ පිරිවැය මුළු පිරිවැයෙන් ඉවත්කරන අතර නව කොටසෙහි පිරිවැය ඇතුළත් කරන අතර ක්ෂය එහි ප්‍රයෝජනවත් ආයු කාලය මත ගණනය කරනු ලබයි. එලෙසම, ප්‍රධාන පෙළේ පිරික්සීමක් සිදු කරනු ලබන අවස්ථාවේදී එහි පිරිවැය, පිරිවැය නිර්ණායක සපුරා ලන්නේ නම්, දේපළ හා පිරියතෙහි ලියාපදිංචි අගයට ඇතුළත් කරනු ලබයි. දේපළ හා පිරියතෙහි අනිකුත් අලුත්වැඩියා කිරීම් හා නඩත්තු වියදම්, ආදයම් ප්‍රකාශයට ඇතුලත් කරනු ලැබේ.

#### 3.1.2 ක්ෂය

ක්ෂය කිරීම් LKAS 16 මත පදනම්ව සිදු කරන අතර ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය කිරීම් එම වත්කම් භාවිතය ආරම්භ වූ දිනයේ සිට SLFRS 05 ට අනුව එම වත්කම විකිණීමට තීරණය කළ දිනය දක්වා සරල මාර්ග ක්‍රම පදනම අනුව, ක්ෂය කරනු ලැබේ. දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ වල ප්‍රයෝජනවත් ආයුකාලය පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| බදු ඉඩම් | 99 අවුරුදු බදු කාලය සඳහා |
| භූමි අලංකරණ වියදම් | 99 අවුරුදු බදු කාලය සඳහා |
| ගොඩනැගිලි | අවුරුදු 4 සිට 30 දක්වා |
| වාහන නවතන ගොඩනැගිල්ල | අවුරුදු 4 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | අවුරුදු 1 සිට 25 දක්වා |
| මෝටර් වාහන | අවුරුදු 3 සිට 15 දක්වා |
| යතුරු පැදි | අවුරුදු 4 සිට 15 දක්වා |
| පා පැදි හා කරත්ත | අවුරුදු 7 |
| උපකරණ | අවුරුදු 2 සිට 30 දක්වා |
| පරිගණක උපාංග | අවුරුදු 1 සිට 10 දක්වා |
| පරිගණක මෘදුකාංග | අවුරුදු 1 සිට 6 දක්වා |
| ලී බඩු හා සවිකිරීම් | අවුරුදු 3 සිට 20 දක්වා |
| මෙවලම් | අවුරුදු 1 සිට 15 දක්වා |
| පුස්තකාල ග්‍රන්ථ | අවුරුදු 5 |

### 3.1.3 අස්පෘශ්‍ය වත්කම්

අත්පත් කර ගන්නා අස්පෘශ්‍ය වත්කම් වල මූලික පිරිවැය වන්නේ අත්පත් කරගැනීමේ පිරිවැයයි. මූලික පිරිවැය හඳුනා ගැනීමෙන් පසුව, අස්පෘශ්‍ය වත්කම් ඉදිරියට ගෙන යනු ලබන්නේ පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂය හා සමුච්චිත අපචය අඩු කරමිනි. ප්‍රාග්ධනීකරණය කරන ලද සංවර්ධන පිරිවැය අගයන් හැර අභ්‍යන්තරිකව ජනනය කරන ලද අස්පෘශ්‍ය වත්කම් ප්‍රාග්ධනීකරණය කරනු නොලබන අතර වියදම ඇති වූ වර්ෂයේ ආදායම් ප්‍රකාශය තුළ අදාළ වියදම පිළිබිඹු කෙරේ.

### 3.1.4 දේපළ, පිරියත හා යන්ත්‍රසූත්‍ර වල හානිකරණය

දේපළ, පිරියත හා යන්ත්‍රසූත්‍ර වල ධාරණ වටිනාකමේ හානිකරණය සමාලෝචනය කරනු ලබන්නේ වාර්ෂිකව හෝ වෙනස්කම් සිදුවීම් මගින් හෝ දේපළ, පිරියත හා යන්ත්‍රසූත්‍රවල ධාරණ වටිනාකම අය කර ගත නොහැකි වීමට ඉඩ ඇති බව හඳුනා ගත් අවස්ථාවකදීය. එබඳු තත්ත්වයක් පවතින්නේ නම් සහ ධාරණ වටිනාකම ඇස්තමේන්තුගත අය කර ගත හැකි ප්‍රමාණය ඉක්මවා යන්නේ නම්, වත්කම් ඒවායේ අය කර ගත හැකි වටිනාකමට සටහන් කරනු ලැබේ. ආදායම් ප්‍රකාශයෙහි ප්‍රත්‍යාගණන අතිරික්තයන් සටහන් කිරීමට ප්‍රතිවිරුද්ධ සටහනක් ලෙස වත්කම් හානිකරණ අලාභ සටහන් කරනු ලැබේ.

### 3.1.5 මූල්‍ය නොවන වත්කම් වල හානිකරණය

වත්කමක් හානි විය හැකි බව දක්වන සංඥාවක් ඇතිදැයි සංස්ථාව එක් එක් වාර්තා කරන දිනයේදී තක්සේරු කරයි. කවර හෝ සංඥාවක් පවතී නම්, එසේත් නැති නම් වත්කමක් සඳහා වාර්ෂික හානි පිරික්සුමක් අවශ්‍ය වූ විට, සංස්ථාව අදාළ වත්කමේ අය කර ගත හැකි ප්‍රමාණය ඇස්තමේන්තු කරයි. වත්කමක අය කර ගත හැකි ප්‍රමාණය වනාහි වත්කමේ හෝ මුදල්-උත්පාදන ඒකකයේ (CGU) සාධාරණ වටිනාකමෙන්, විකිණීමේ වියදම් අඩු කිරීමෙන් ලැබෙන අගය හා භාවිතයේදී එහි වටිනාකම අඩු කළ විට ලැබෙන අගය යන අගයන් දෙකෙන් වඩා විශාල අගයයි. එය තනි වත්කම් සඳහා නිර්ණය කරනු ලබන්නේ වෙනත් වත්කම් වලින් හෝ වත්කම් සමූහ වලින් ආයතනය තුලට එන මුදල් ප්‍රවාහ වලින් ස්වායත්තව අදාළ තනි වත්කම ආයතනය තුලට මුදල් උත්පාදනය කරන්නේ නම් පමණි. වත්කමක හෝ මුදල්-උත්පාදන ඒකකයක ධාරණ අගය එහි අය කර ගත හැකි ප්‍රමාණය ඉක්මවා යන විට, වත්කම හානිකරණය වී ඇතැයි සැලකෙන අතර, එය එහි අය කර ගත හැකි ප්‍රමාණය ලෙස සටහන් කරනු ලැබේ. භාවිතයේදී වටිනාකම තක්සේරු කිරීමේදී, මුදලේ වර්තමාන අගය සහ වත්කමට ආවේණික අවදානම් පිළිබඳ වත්මන් වෙළඳපල තක්සේරු අගයන් පිළිබිඹු කරන බදු-පූර්ව වට්ටම් අනුපාතිකය භාවිතා කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් ඒවායේ වත්මන් වටිනාකමට වට්ටම් කරනු ලැබේ. සාධාරණ වටිනාකමෙන් විකිණීමේ පිරිවැය අඩු කොට අගය නිර්ණය කිරීමේදී, මෑත කාලීන වෙළඳපල ගනුදෙනු (තිබේ නම්) සැලකිල්ලට ගනු ලැබේ. එබඳු ගනුදෙනු හඳුනා ගත නොහැකි නම්, උචිත තක්සේරු ක්‍රමයක් භාවිතා කරනු ලැබේ.

### 3.1.6 බදුකරණය

#### 3.1.6.1 වර්තමාන බදුකරණය

වර්තමාන සහ පෙර වර්ෂවල දී මෙන් බදු ආයතන වලට,ආයතනයේ බදු වත්කම් සහ බැරකම් මත බදු ගෙවීමක් සිදු කරයි. එම බදු ප්‍රමාණයන් ගණනය කිරීමට යොදා ගන්නා ලද බදු අනුපාතික හා බදු නීති වනාහි ශේෂ පත්‍ර දින වන විට පනවා තිබූ ඒවා වේ.

ඒ අනුව, 2000 අංක 38 දරණ දේශීය ආදායම් පනතේ හා එයට කරන ලද සංශෝධන හා විධිවිධාන වලට අනුකූලව පනතේ නියම කර ඇති අනුපාතිකයන්ට අනුව බදු ගෙවීමේ කාර්යය සඳහා ගලපන ලද වර්ෂයේ ලාභය පදනම් කරගනිමින් බදු ප්‍රතිපාදනය කරනු ලැබේ. සමාලෝචිත වර්ෂයේ බදු සඳහා ප්‍රතිපාදන සලසා ඇත්තේ පනතේ නියම කර ඇති අනුපාතික වලට යටත්ව ගිණුම්ගත ලාභය පදනම් කරගෙනය.

#### 3.1.6.2 විලම්බිත බදුකරණය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ හඳුනා ගෙන ඇති වත්කම් සහ වගකීම් වලට අදාල තාවකාලික වෙනස්කම් සඳහා විලම්බිත බදු බැරකම් හා වත්කම් සඳහා ප්‍රතිපාදන කර ඇත. අපගේ මූල්‍ය ප්‍රකාශයන් තුළ ප්‍රධාන වශයෙන් ස්ථාවර වත්කම් වල ලියාහල පොත් අගය හා ලියාහල බදු වටිනාකම සඳහා විලම්බිත බදු බැරකමක්ද, විශ්‍රාම පාරිතෝෂිකය වෙනුවෙන් වූ ප්‍රතිපාදනය සඳහා විලම්බිත බදු වත්කමක්ද හඳුනා ගත්තෙමු. විලම්බිත බදු වත්කම් සහ බැරකම් මනිනු ලබන්නේ ආදායම් බදු අනුපාත අනුවය.

### 3.2. භාණ්ඩ තොග

'ප්‍රථමයෙන් ලැබ ප්‍රථමයෙන් නිකුත් කල' පදනමින් අගය තක්සේරු කෙරෙන අභාවිත හෝ මන්දගාමී චලනයක් සහිත භාණ්ඩ සඳහා නිසි වෙන් කිරීම් කළ පසුව පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගය මත භාණ්ඩ තොග අගය කරනු ලැබේ.

#### 3.2.1 තොග අගය කිරීම

**තොග පිරිවැය**

**අමුද්‍රව්‍ය**

කවර හෝ පසු වියදම්ද ඇතුළුව මිලට ගැනිමේ පිරිවැය

**නොනිමි වැඩ**

අමුද්‍රව්‍ය පිරිවැය සහ සම්පූර්ණ විචල්‍ය නිෂ්පාදන පිරිවැය

**නිමි භාණ්ඩ**

අමුද්‍රව්‍ය පිරිවැය සහ සම්පූර්ණ විචල්‍ය නිෂ්පාදන පිරිවැය

**වෙනත් තොග**

පිරිවැය නිශ්චය කර ඇත්තේ බර තැබූ සාමාන්‍යය පදනමිනි.

#### 3.2.2 වෙළඳ සහ අනිකුත් අය විය යුතු දේ

වෙළඳ සහ අනිකුත් අය විය යුතු දේ ප්‍රථමයෙන් සාධාරණ වටිනාකම මත හඳුනා ගෙන පසු වර්ෂයන්හිදී හානිකරණය සඳහා ප්‍රතිපාදන වලට යටත්ව සඵල පොළී අනුපාතිකය ආධාරයෙන් ගණනය කරනු ලබන ක්‍රමක්ෂය කරන ලද පිරිවැයටය. 2017.12.31 දිනට දීර්ඝ කාලයක් හිඟ හිටි මුදලක් නොතිබූ බැවින් මෙම සංස්ථාව වෙළඳ ණයගැතියන් සඳහා කිසිදු හානිකරණයට අදාල ප්‍රතිපාදනයක් කොට නැත.

#### 3.2.3 මුදල් හා මුදල්වලට සමාන දේ

මුදල් හා මුදල්වලට සමාන දේ යන්නට අත ඇති මුදල්, බැංකු ශේෂය හා කෙටි කාලීන ආයෝජන ඇතුළත්ය.

#### 3.2.4 සබැඳි පාර්ශවයන් සමග ගනුදෙනු

#### 3.2.4.1 අධ්‍යක්ෂ මණ්ඩල වන්දි

**රාජ්‍ය හා රාජ්‍ය පාලනය සහිත ආයතන සමග ගනුදෙනු**

සංස්ථාව සිය සාමාන්‍ය මෙහෙයුම් වලදී සබැඳි පාර්ශවයන් සමඟ ගනුදෙනු වලට එළඹෙයි. සබැඳි පාර්ශවයන්ට ශ්‍රී ලංකා රජය (රාජ්‍යඃ සංස්ථාවේ හිමිකරු වශයෙන්), විවිධ රජයේ දෙපාර්තමේන්තු සහ රජය විසින් පාලනය කරනු ලබන ආයතන ඇතුළත්ය. රජය සහ රජය විසින් පාලනය කරනු ලබන හා තනි තනිව වැදගත් වන්නාවූ හෝ අන් සමහර ගනුදෙනු සම්බන්ධයෙන් තනි තනිව නොව, සාමූහිකව වැදගත් වන්නා වූ ආයතන සමග සංස්ථාව එළඹුනු ගනුදෙනු හා විධිවිධාන පිළිබඳ විස්තර පහත දැක්වෙන පරිදි වේ.

**ගනුදෙනුවේ ස්වභාවය**

| ගනුදෙනු | 2017 | 2016 |
|---|---|---|
| සංස්ථාව සතු ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් වල ආයෝජන | 926,461,067 | 1,175,754,426 |
| වර්ෂය තුළ රජය වෙත කල ගෙවීම් | 45,000,000 | 65,000,000 |
| විකුණුම් හිඟ හිටි ශේෂය | 3,174,612,664 | 2,434,508,479 |
| රා. ඖ. සං. වෙතින් අය විය යුතු දේ | 5,421,788 | 28,464,567 |
| සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව වෙතින් අය විය යුතු දේ | 316,077,817 | 6,860,212 |

### 3.2.5 ප්‍රාග්ධනය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ අනුදත් ප්‍රාග්ධනයෙහි වෙනසක් වී නොමැත.

### 3.2.6 මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දිනට පසු සිදුවීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දිනට පසු සිදු වූ සියලුම වැදගත් සිදුවීම් සැලකිල්ලට ගෙන මූල්‍ය ප්‍රකාශනයෙහි අවශ්‍ය අවස්ථාවන්හිදී යෝග්‍ය වෙනස්කම් සිදු කර ඇති අතර, අවශ්‍ය තැන්හිදී මූල්‍ය ප්‍රකාශයට අනාවරණයන් සිදු කර ඇත.

### 3.2.7 පර්යේෂණ පිරිවැය

නව විද්‍යාත්මක හෝ තාක්ෂණික දැනුම හා අවබෝධය ලබා ගැනීමේ අරමුණින් සිදු කරන ලද පර්යේෂණ කටයුතු සඳහා වියදම් ඇති වූ අවස්ථාවේදී ඒවා ලාභාලාභ ගිණුම තුළ පෙන්වා ඇත.

## 4. බැරකම් සහ ප්‍රතිපාදන

### 4.1 විශ්‍රාම ප්‍රතිලාභ වගකීම

### 4.1.1 නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැලැස්ම - විශ්‍රාම පාරිතෝෂිකය

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත ප්‍රකාරව පාරිතෝෂික ගෙවීමට සංස්ථාව බැඳී සිටී. සේවකයකුට ගෙවිය යුතු පාරිතෝෂිකය සඳහා බැරකම පැන නගින්නේ සේවකයකු සංස්ථාව සමග අවුරුදු 5 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කරන අවස්ථාවේදීය. මෙම වගකීම සපුරාලනු පිණිස මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ප්‍රතිපාදනයක් ඉදිරියට ගෙන යනු ලැබේ. වර්ෂය මුලදී ඉදිරියට ගෙනා ප්‍රතිපාදනය සහ වර්ෂය අවසානයේදී ඉදිරියට ගෙන ගිය ප්‍රතිපාදනය අතර ඇති වන වෙනස ආදායම් ප්‍රකාශය තුළ දක්වා ඇත.

සංස්ථාව 2017 වර්ෂය සඳහා ආයුගණක තක්සේරුකරුවකුගේ උපදෙස් මත විශ්‍රාම ප්‍රතිලාභ පාරිතෝෂිකයේ වර්තමාන වටිනාකම ගණනය කර ඇත.

ගණනය කිරීම්වලදී භාවිතා කෙරෙන ප්‍රධාන උපකල්පනයන් පහත සඳහන් පරිදි වේ.

| | | 2017 | 2016 |
|---|---|---|---|
| අපේක්ෂිත සාමාන්‍ය වාර්ෂික වැටුප් වර්ධක අනුපාතිකය | - | 4.00% | 4.00% |
| වට්ටම්/පොලී අනුපාතිකය | - | 10.40% | 9.50% |
| කාර්ය මණ්ඩල පිරිවැටුම් සාධකය | - | 2.67% | 2.67% |

මෙම බැරකම සම්බන්ධයෙන් බාහිරව අරමුදල් සැපයීම සිදු නොකෙරේ. මෙය මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ජංගම නොවන බැරකම් යටතේ කාණ්ඩගත කෙරේ.

### 4.1.2 නිශ්චිත දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

සේවක අර්ථසාධක අරමුදල් දායකත්වයට හා සේවක භාරකාරත්ව අරමුදල් දායකත්වයට සුදුසුකම් ඇති සියලුම සේවකයන් අදාල රෙගුලාසි වලට අනුකූලව අදාළ දායකත්ව අරමුදල් මගින් ආවරණය කරනු ලැබේ. සේවකයන් ආවරණය කරමින් අර්ථසාධක අරමුදලට හා භාරකාර අරමුදලට සැපයෙන දායකත්වයන් පිළිබඳ වගකීම් භාරයන් ආදායම් ප්‍රකාශය තුළ වියදම් වශයෙන් හඳුනා ගනු ලැබේ.

### 4.1.3 වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දේ

වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දේ ඒවායේ පිරිවැය අනුව සඳහන් කර ඇත. වෙළඳ සහ අනිකුත් ගෙවිය යුතු දේ ප්‍රථමයෙන් සාධාරණ වටිනාකම මත අගය කර පසුව සඵල පොළී අනුපාතිකය ආධාරයෙන් ගණනය කරනු ලබන ක්‍රමක්ෂය කරන ලද පිරිවැයට හානිකරණ සඳහා ප්‍රතිපාදනයන් අඩුකරයි. 2017.12.31 දිනට සැලකිය යුතු අවදානමක් නොමැති බැවින් පසු වර්ෂයන් හිදි ගෙවීමට සිදුවෙතැයි අපේක්ෂිත පිරිවැයක් සඳහා සංස්ථාව කිසිදු ප්‍රතිපාදනයක් සිදු කොට නැත.

### 4.1.4 ප්‍රතිපාදන

**පොදු**

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් වර්තමාන (නෛතික හෝ අර්ථවිග්‍රහ කළ) වගකීම් භාරයක් සංස්ථාවට ඇති විට ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ. අදාළ වගකීම පියවනු පිණිස ආර්ථික ප්‍රතිලාභයක් ඇති වත්කම් වලින් මුදල් ප්‍රවාහයක් ගලා යන්නේ නම් සහ වගකීම් භාරයේ ප්‍රමාණය පිළිබඳව විශ්වාසය තැබිය හැකි ඇස්තමේන්තුවක් කළ හැකි වීමේ හැකියාව තිබිය හැකිය. සංස්ථාව ප්‍රතිපාදනයෙන් කොටසක් හෝ සමස්තයම ප්‍රතිපූරණය කෙරෙනු ඇතැයි අපේක්ෂා කරන තැන්හිදී (නිදසුනක් ලෙස රක්ෂණ ගිවිසුමක් යටතේ) වුවද ප්‍රතිපූරණය වෙනම වත්කමක් ලෙස හඳුනා ගනු ලබන්නේ ප්‍රතිපූරණය නිශ්චිතවම හඳුනාගත් විටය. කවර හෝ ප්‍රතිපාදනයක් සම්බන්ධයෙන් වූ වියදමක් ආදායම් ප්‍රකාශයේ ඉදිරිපත් කරනු ලබන්නේ ඊට අදාල ප්‍රතිපූරණයන් අඩු කොටය.

මුදලේ වර්තමාන අගයේ වෙනස්වීම වැදගත් නම්, උචිත තැන්හිදී බැරකමට වන විශේෂිත අවදානම් සඳහා පිළිඹිබු කරන වත්මන් බදු-පූර්ව අනුපාතිකයක් භාවිතා කරමින් ප්‍රතිපාදන වට්ටම් කෙරේ. වට්ටම්කරණය භාවිතා කරන තැන්හිදී කාලය ගත වීමත් සමගම ප්‍රතිපාදනයේ ඇති වන වෙනස මූල්‍ය පිරිවැයක් ලෙස හඳුනා ගැනේ.

## 5. ආදායම් ප්‍රකාශය

ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා වියදම් ශ්‍රිත ක්‍රමය යොදා ගෙන ඇත්තේ එමගින් සංස්ථාවේ කාර්යසාධනයෙහි සංරචකයන් සාධාරණව නිරූපනය වන නිසාය.

### 5.1.1 පිරිවැටුම

සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට හා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ බෙද හරින්නන් වෙත කෙරෙන අලෙවියෙන් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ පිරිවැටුම සමන්විත වේ.

### 5.1.2 ආදායම් හඳුනා ගැනීම

ගෙවන අවස්ථාව කවරක් වුවද, ආර්ථික ප්‍රතිලාභ සංස්ථාව වෙත ගලා ඒමේ හැකියාව ඇති හා ආදායම හා ඊට සම්බන්ධ පිරිවැය විශ්වාසය තැබිය හැකි අයුරින් මැනිය හැකි මට්ටමට ආදායම හඳුනා ගනු ලැබේ. ගිවිසුම්ගතව නිර්වචනය කරන ලද ගෙවීමේ නියමයන් සැලකිල්ලට ගනිමින් හා බදු හෝ තීරු ගාස්තු බැහැර කරමින්, ලැබුණු හෝ අය විය යුතු ප්‍රතිෂ්ඨාවේ සාධාරණ වටිනාකමට ආදායම මනිනු ලැබේ. සංස්ථාව සිය ආදායම් සැලසුම් වල විධිවිධානයන් දෙනු ලබන ප්‍රධානියා වේ. ආදායමක් වශයෙන් හඳුනාගැනීමේදී පහත සඳහන් විශේෂ පිළිගත් මිනුම් දඬු සපුරාලිය යුතුය.

**භාණ්ඩ අලෙවිය**

භාණ්ඩ අලෙවි ආදායම හඳුනා ගනු ලබන්නේ භාණ්ඩ හිමිකරුගේ අවදානම් හා ප්‍රතිලාභ ගැනුම්කරුට හිමි වූ අවස්ථාවේදි, සාමාන්‍යයෙන් භාණ්ඩ භාර දුන් විටය.

### 5.1.3 වියදම්

වර්ෂයේ ලාභය ගණනය කිරීමේදී, ව්‍යාපාරය පවත්වා ගෙන යාමෙන් ඇති වූ සියලුම වියදම් ආදායමෙන් අඩු කර ඇත. අළුත්වැඩියාවන් හා අළුත් කිරීම් එම වියදම ඇති වූ වර්ෂයේ ලාභ අලාභවලට අය කරනු ලැබේ.

### 5.1.4 මූල්‍ය වියදම්

මූල්‍ය වියදම් සමන්විත වන්නේ බැංකු අයිරා මත පොලිය, ණයවර ලිපි විවෘත කිරීමේ වියදම්, සහ ණය පහසුකම් ගිවිසුම් ගාස්තු යන මේවායින්ය.

### 5.1.5 පොදුකාර්ය වියදම් ප්‍රතිපාදනය

මූල්‍ය ප්‍රකාශ තුළ පොදුකාර්ය ප්‍රතිපාදන ක්‍රමය පහත සඳහන් පරිදි වේ.

**වියදම්**

(අ) වරිපනම් බදු, විදුලිය, ජල ගාස්තු, රක්ෂණ, උපකරණ නඩත්තු, පොදු නඩත්තු, ගොඩනැගිලි නඩත්තු, ක්ෂය

(ආ) සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයේ වාරිකය, කාර්ය මණ්ඩල සුභසාධනය, නිල ඇඳුම් හා පාවහන්, සහ ප්‍රවාහන ගාස්තු

(ඇ) අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු, වෙනත් දිරිදීමනා, මෝටර් වාහන අළුත්වැඩියාව හා නඩත්තු, වාහන සඳහා ඉන්ධන හා ලිහිසි ද්‍රව්‍ය, තැපැල් හා ෆැක්ස් ගාස්තු, දුරකථන ගාස්තු, ආරක්ෂක ගාස්තු, වාහන හා ඖෂධ බලපත්‍ර ගාස්තු, මුද්‍රණ කටයුතු හා ලිපිද්‍රව්‍ය, කාර්යාල වියදම්, විගණන ගාස්තු, කුළී ගාස්තු, ප්‍රචාරක දැන්වීම්, වෙළඳ දායකත්වයන් හා වාර සඟරා, නීති හා පරීක්ෂණ වියදම්, වෘත්තීයවේදී ගාස්තු, සංග්‍රහ, වාර්ෂික දායකත්වයන්, වාර්ෂික සමුළු හා රැස්වීම්, මුද්දර ගාස්තු, ලිපිද්‍රව්‍ය තොග සත්‍යාපන ගැලපුම්.

(ඈ) කාර්ය මණ්ඩල ප්‍රතිලාභ සහ වෙනත් වියදම්

**ප්‍රතිපාදන ක්‍රමය**

අ) අදාල පිරිවැය සෘජුවම නිෂ්පාදන හෝ පරිපාලන වියදම් ලෙස හඳුනා ගනු ලබන අවස්ථා වලදී ඒ ඒ පිරිවැය යටතේද පොදු පිරිවැයක් වන්නේ නම් එයද 70% හා 30% වශයෙන් පිලිවෙලින් නිෂ්පාදන හා පරිපාලන වශයෙන් වෙන් කරනු ලැබේ.

(ආ) එක් එක් අංශයේ සිටින සේවක සංඛ්‍යාව පදනම් කර ගෙන පිරිවැය බෙදනු ලැබේ.
(ඇ) තථ්‍ය පිරිවැය ක්‍රමය භාවිතා කෙරේ.
(ඈ) තථ්‍ය පිරිවැය ක්‍රමය භාවිතා කෙරේ.

## 6. මූල්‍යකරණ මෙවලම් - ප්‍රථම සහ පසු වර්ෂ සඳහා තක්සේරු කිරීම

### 6.1 මූල්‍ය වත්කම

#### 6.1.1 මුල් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම

ශ්‍රී.ල.මු.වා.ප්‍ර අංක 39 හි විෂයපථය තුළ මූල්‍ය වත්කම් වර්ගීකරණය වී ඇත්තේ ලාභ අලාභ ගිණුම හරහා මූල්‍ය වත්කම්, ණය හා අය විය යුතු දේ, කල් පිරීම දක්වා කරනු ලබන ආයෝජන හා විකිණීමට ඇති මූල්‍ය වත්කම් ලෙසයි. ඒ අනුව වටිනාකම ආයතන වලට යෝග්‍ය ආකාරයට තම මූල්‍ය වත්කම් වර්ගීකරණය නිර්ණය කළ යුතුය.

සියලුම මූල්‍ය වත්කම් වෙළඳපල වටිනාකමට අගය කලයුතු අතර වෙළඳපල අගය තීරණය කල නොහැකි අවස්ථා වල එම මූල්‍ය වත්කම් ගනුදෙනු අගය කල පිරිවැයට අගය කල යුතුය.

සංස්ථාවේ මූල්‍ය වත්කම් වලට මුදල් හා කෙටිකාලීන භාණ්ඩාගාර බිල්පත් ආයෝජන, වෙළඳ හා වෙනත් අයවිය යුතු දේ, කාර්ය මණ්ඩල ණය, සහ වෙනත් අය විය යුතු දේ ඇතුළත් වේ.

#### 6.1.2 පසු තක්සේරුව

මූල්‍ය වත්කම් වල පසු වර්ෂ වල තක්සේරුව පහත දැක්වෙන පරිදි ඒවායේ වර්ගීකරණය මත රඳ පවතී.

#### 6.1.3 ලාභාලාභ ගිණුම හරහා වෙළඳපල වටිනාකමට අගය තක්සේරු කරන මූල්‍ය වත්කම්

ලාභාලාභ ගිණුම හරහා වෙළඳපල වටිනාකමට අගය තක්සේරු කරන මූල්‍ය වත්කම් වලට අන්තර්ගත වනුයේ විකිණීම සඳහා වෙන් කරන ලද මූල්‍ය වත්කම් හා මුල් හඳුනාගැනීමේදී මෙම වර්ගීකරණයට අයත් යැයි නිර්ණය කරන ලද මූල්‍ය වත්කම්ය. මූල්‍ය වත්කම් නුදුරු කාලයේදී විකිණීමේ හෝ යළි මිලට ගැනීමේ කාර්යය සඳහා අත්කර ගෙන ඇති නම් ඒවා විකිණීම සඳහා වෙන්කරන ලද මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කෙරේ.

#### 6.1.4 ණය සහ ලැබිය යුතු දේ

ණය සහ අය විය යුතු දේ වනාහි ක්‍රියාශීලී වෙළඳපලක තක්සේරු නොකරන ලද ස්ථාවර හෝ නිර්ණය කළ හැකි ගෙවීම් සහිත විවෘත වෙළඳපලේ විකුණා ඉපයීමක් නොකරන මූල්‍ය වත්කම්ය. මුල් හඳුනා ගැනීමෙන් පසුව එබඳු මූල්‍ය වත්කම් පසු වර්ෂයන් හි තක්සේරු කරනු ලබන්නේ හානිවීම අඩු කර සඵල පොළී අනුපාතික ක්‍රමය (EIR) භාවිතා කරමින් ක්‍රමක්ෂය කරන ලද පිරිවැයටය. ගාස්තු හා පිරිවැය සහ අත්කර ගැනීමේදී වූ වට්ටම් හෝ විශේෂ දීමනා සැලකිල්ලට ගනිමින් ගණනය කල සඵල පොළී අනුපාතිකය භාවිතා කර ක්‍රමක්ෂය කරන ලද පිරිවැය ගණනය කරනු ලැබේ. ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදයම

තුළ සඵලපොලී අනුපාතික ක්‍රමක්ෂය ඇතුළත් කරනු ලැබේ. හානිවීම් නිසා පැන නගින අලාභයන් ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය තුළ හඳුනා ගනු ලැබේ.

### 6.1.5 කල්පිරීම තෙක් රඳවනු ලබන ආයෝජන

ස්ථාවර හෝ නිර්ණය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න වෙළඳපලේ විකිණීමක් නොකරන සංස්ථාවට කල්පිරීම දක්වා දැරීමේ හැකියාව හා සාධනීය චේතනාව තිබේ නම් ඒවා කල්පිරීම තෙක් රඳවනු ලබන ආයෝජන ලෙස වර්ගීකරණය කෙරේ. මූලික හඳුනාගැනීමෙන් පසුව කල් පිරීම තෙක් රඳවනු ලබන ආයෝජන තක්සේරු කරනු ලබන්නේ හානිවීම් අඩු කර සඵල පොළී අනුපාතික ක්‍රමය (EIR) භාවිතා කර ක්‍රමක්ෂය කරන ලද පිරිවැයටය.ගාසතු හා පිරිවැය සහ අත්කර ගැනීමේදී වූ වට්ටම් හෝ විශේෂ දීමනා සැලකිල්ලට ගනිමින් ගණනය කරනු ලබන පොළී අනුපාතිකය භාවිතා කරමින් ක්‍රමක්ෂය කරනු ලැබේ. ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායම තුළ සඵල පොළී අනුපාතික ක්‍රමක්ෂය ඇතුළත් කරනු ලැබේ. හානිවීම් තුලින් පැන නගින අලාභයන් ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය තුළ හඳුනා ගනු ලැබේ. 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ සංස්ථාව සතුව කල්පිරීම තෙක් රඳවනු ලබන ආයෝජන නොතිබුණි.

### 6.1.6 විකිණීමට ඇති මූල්‍ය ආයෝජන

විකිණීමට ඇති මූල්‍ය ආයෝජන වලට කාරක ප්‍රාග්ධනය හා ණය සුරැකුම් ඇතුළත්ය. විකිණීමට ඇති මූල්‍ය ආයෝජන ලෙස වර්ගීකරණය කර ඇත්තේ කාරක ප්‍රාග්ධන ආයෝජන විකිණීම සඳහා රඳවා ගනු ලබන ලෙස වර්ගීකරණය කරනු ලැබූ ලාභ හෝ අලාභ ගිණුම හරහා වෙළඳපල වටිනාකමට අගය කර නොමැති ඒවාය. මෙම ප්‍රභේදය තුල ඇති ණය සුරැකුම් වනාහි ද්‍රවශීලතාව සඳහා වූ අවශ්‍යතාවන්ට ප්‍රතිචාර වශයෙන් හෝ වෙළඳපල තත්ත්වයන්ගේ වෙනස්කම් වලට ප්‍රතිචාර වශයෙන් අලෙවි කරනු ලැබිය හැකි අවිනිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා රඳවනු ලැබීමට අපේක්ෂා කෙරෙන ඒවාය.

විකිණීමට ඇති මූල්‍ය ආයෝජන මූලික හඳුනාගැනීමෙන් පසුව, සමුච්චිත අලාභය, ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය තුළ යළි වර්ගීකරණය කොට විකිණීමට ඇති සංචිතයෙන් ඉවත් කෙරෙන අතර, සමුච්චිත අලාභය වෙනත් මෙහෙයුම් ආදායම තුළ හඳුනා ගන්නා හෝ හානි වූ ලෙස නිර්ණය කරනු ලබන අවස්ථාවක, ආයෝජන ලෙස හඳුනා නොගැනීමක් කෙරෙන තෙක්, විකිණීමට ඇති සංචිතය තුළ අනෙකුත් අංග සම්පූර්ණ ආදායම ලෙස හඳුනා ගනු ලැබූ අනු උපලබ්ධි ලාභ හෝ අලාභ සමග වෙළඳපල වටිනාකමට තක්සේරු කරනු ලැබේ.විකිණීමට ඇති ණය සුරැකුම් මත පොළී ආදායම සඵල පොළී ක්‍රමය භාවිතා කරමින් ගණනය කරනු ලබන අතර, ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනු ලැබේ.

සංස්ථාව සිය විකිණීමට ඇති මූල්‍ය වත්කම් තක්සේරු කරනුයේ නුදුරු කාලයේදී මෙම මූල්‍ය වත්කම් විකිණීමට ඇති හැකියාව හා අභිප්‍රාය තවමත් උචිතද යන්න නිශ්චය කරනු පිණිසය. වෙළඳපලේ අක්‍රීය බව නිසා මෙම මූල්‍ය වත්කම් ගනුදෙනු කිරීමට සංස්ථාවට නොහැකි වන විට සහ එසේ කිරීමට කළමනාකාරිත්වයට ඇති අභිප්‍රාය සාදෘශ්‍ය අනාගතයේදී සැලකිය යුතු ලෙස වෙනස් වන විට, සංස්ථාව ඉතා කලාතුරකින් මෙම මූල්‍ය වත්කම් යළි වර්ගීකරණය කිරීමට තීරණය කිරීමට ඉඩ ඇත. මූල්‍ය වත්කම් ණය හා අයවිය යුතු දේවල නිර්වචනය සපුරාලයි නම් සහ සාදෘශ්‍ය අනාගතය තුළ හෝ කල්පිරෙන තෙක් මෙම වත්කම් රඳවා ගැනීමට ඇති හැකියාව හා අභිප්‍රාය බැංකුවට ඇති විට ඒවා ණය හා අයවිය යුතු දේ ලෙස යළි වර්ගීකරණය කිරීමට අවසර ලැබේ. කල්පිරෙන තෙක් රඳවනු ලබන ආයෝජන ලෙස යළි වර්ගීකරණය කිරීමට අවසර ලැබෙනුයේ ආයතනයට අදාළ මූල්‍ය වත්කම එලෙස රැඳවීමට හැකියාව හා අභිප්‍රාය තිබේ නම් පමණි.

'විකිණීමට ඇති' ප්‍රභේදයෙන් ඉවත්ව යළි වර්ගීකරණය කරන ලද මූල්‍ය වත්කමක් සම්බන්ධයෙන්, කාරක ප්‍රාග්ධනය තුළ හඳුනා ගෙන ඇති එම වත්කමේ කවර හෝ පෙර ලාභයක් හෝ අලාභයක් සඵල පොළී අනුපාතික භාවිතා කරමින් ආයෝජනයේ ඉතිරිව ඇති ආයුකාලය මුළුල්ලේ ලාභය හෝ අලාභයට ක්‍රමක්ෂය කරනු ලැබේ. නව ක්‍රමක්ෂය කරන ලද පිරිවැය සහ අපේක්ෂිත මුදල් ප්‍රවාහ අතර ඇති වන කවර හෝ වෙනසක් වුවද සඵල පොළී අනුපාතික භාවිතා කරමින් වත්කමෙහි ඉතිරිව ඇති ආයුකාලය මුළුල්ලේ ක්‍රමක්ෂය කරනු ලැබේ. අදාළ වත්කම් පසුව හානි වී ඇතැයි නිර්ණය කරනු ලබන්නේ නම්, එවිට කාරක ප්‍රාග්ධනය තුළ සටහන් කරන ලද ප්‍රමාණය ආදායම් ප්‍රකාශය වෙත යළි වර්ගීකරණය කරනු ලැබේ. 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ සංස්ථාව සතුව කිසිදු විකිණීමට ඇති මූල්‍ය ආයෝජන නොතිබුණි.

### 6.1.7 හඳුනා නොගැනීම්

මූල්‍ය වත්කමක් (එසේත් නැත හොත්, අදාළ අවස්ථාව අනුව, මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක කොටසක්) හඳුනා නොගැනීමක් කරනු ලබන්නේ පහත අවස්ථාවන්හිදී.

| | |
|---|---|
| i). | වත්කම වෙතින් මුදල් ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය ඉකුත් වීම |
| ii). | සංස්ථාව එම වත්කම වෙතින් මුදල් ප්‍රවාහ ලැබීමේ සිය අයිතිවාසිකම් පවරා තිබීම හෝ 'විනිවිද යන' විධිවිධානයක් යටතේ තුන්වන පාර්ශවයකට බලවත් ප්‍රමාදයකින් තොරව ලැබුණු මුදල් ප්‍රවාහයන් පූර්ණ වශයෙන් ගෙවීමේ වගකීමක් භාර ගෙන තිබීම සහ |
| අ) | සංස්ථාව වත්කමෙහි සියලුම අවදානම් සහ ප්‍රතිලාභ ප්‍රමාණවත්ව පවරා තිබීම හෝ |
| ආ) | සංස්ථාව, වත්කමෙහි සියලුම අවදානම් සහ ප්‍රතිලාභ ප්‍රමාණවත්ව පැවරීමකින් හෝ රඳවා ගැනීමකින් තොරව වත්කමේ පාලනය පවරා තිබීම. |

### 6.1.8 මූල්‍ය වත්කම් හානිකරණය

යම් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානි වී තිබෙන බවට පිළිගත හැකි සාක්ෂි කිසිවක් තිබේදැයි සංස්ථාව එක් එක් වාර්තාකරණ දිනයේදී තක්සේරු කර බලයි. යම් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානි වී ඇතැයි සලකනු ලබන්නේ වත්කමේ මූලික හඳුනා ගැනීමට පසුව සිදු වූ සිදුවීමක හෝ කීපයක ප්‍රතිඵලය වශයෙන් හානි වීමක් පිළිබඳව පිළිගත හැකි සාක්ෂි ඇති නම් සහ මූල්‍ය වත්කමේ හෝ මූල්‍ය වත්කම් සමූහයේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් මත විශ්වාසය තැබිය හැකි අයුරින් ඇස්තමේන්තු කළ හැකි බලපෑමක් මඟින් අලාභ ගෙන දෙන සිදුවීමක් හෝ සිදුවීම් ඇති නම් පමණි.

හානිකරණයේ සාක්ෂි ලෙස ණයගැතියන්ගේ හෝ ණයගැති සමූහයේ සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතා, පොළී හෝ මුල් මුදල් ගෙවීම් පැහැර හැරීම, බුන්වත්භාවය හෝ වෙනත් මූල්‍ය සංවිධානය වීම්වලට අවතීර්ණ වීම අත්විඳිමින් සිටින බව දක්වන සංඥා සහ පැහැර හැරීම්වලට සහසම්බන්ධ හිඟ වාරික හෝ ආර්ථික තත්ත්වයන් වැනි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි මැනිය හැකි අඩු වීමක් තිබෙන බව හඟවන නිරීක්ෂණය කළ හැකි දත්ත ඇතුළත් වේ.

### 6.1.9 ක්‍රමක්ෂිත පිරිවැයට අගය කරනු ලබන මූල්‍ය වත්කම්

ක්‍රමක්ෂිත පිරිවැයට අගය කරනු ලබන මූල්‍ය වත්කම් සම්බන්ධයෙන්, සංස්ථාව මුලින්ම, තනිව වැදගත් වන මූල්‍ය වත්කම් සඳහා තනි තනිව හානිවීමේ සහ තනිව වැදගත් නොවන මූල්‍ය වත්කම් සඳහා සාමූහික වශයෙන් හානිවීමේ වාස්තවික සාක්ෂි තිබේද යන්න තක්සේරු කරයි. තනිව තක්සේරු කරනු ලබන මූල්‍ය වත්කම් සඳහා හානිවීමේ වාස්තවික සාක්ෂි නොමැති බවට සංස්ථාව තක්සේරු කරන්නේ නම් එම වත්කම සැලකිය යුතු එකක් වූවද, නොවූවද, සංස්ථාව එම වත්කම එයට සමාන ණය අවදානම් ලක්ෂණ සහිත මූල්‍ය වත්කම් කණ්ඩායමකට ඇතුළත් කොට, හානිවීම සම්බන්ධයෙන් අදාළ වත්කම් කණ්ඩායමම සාමූහිකව තක්සේරු කරයි. හානිවීමක් ඇතිදැයි තනි තනිව තක්සේරු කරනු ලබන හා අපව අලාභයක් ඇති හෝ අඛණ්ඩව පවතිනු ඇති ලෙස හඳුනා ගනු ලබන වත්කම් සාමූහික අපව තක්සේරුවකට ඇතුළත් කරනු නොලැබේ.

හානිවීමේ අලාභයක් සිදු වී ඇති බවට වාස්තවික සාක්ෂි පවතී නම්, අලාභයේ ප්‍රමාණය මනිනු ලබන්නේ වත්කමෙහි ධාරණ අගය හා ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි (තවමත් ඇති වී නොමැති අනාගතයේ අපේක්ෂිත ණය අලාභයන් ඇතුළත් නොවන) වර්තමාන වටිනාකම අතර වෙනස ලෙස ය. ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි වර්තමාන වටිනාකම මූල්‍ය වත්කමෙහි මුල් සඵල පොළී අනුපාතිකයට වට්ටම් කරනු ලැබේ. සංස්ථාව එක් එක් ණයගැති ප්‍රභේදය සඳහා විශේෂිත හානි වීම තක්සේරු කිරීම සිදු කර ඇත.

# 2017.12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

01 සටහන

දේපළ, පිරියත හා උපකරණ - ක්ෂය වන වත්කම්

## 2017

පිරිවැය

| විස්තරය | 2017.01.01 දිනට පිරිවැය | වර්ෂය තුළ අත්පත් කර ගැනීම් | වර්ෂය තුළ විකිණීම් | 2017.12.31 දිනට ශේෂය | හානි වූ හා අභාවිත ගැලපුම්(සටහන 03) | හානි වූ හා අභාවිත ගැලපු පසු 2017.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| ක්ෂය වන වත්කම් | | | | | | |
| භූමි අලංකරණ වියදම් | 6,113,388 | - | - | 6,113,388 | - | 6,113,388 |
| ඉඩම් | 23,214,262 | 26,257,656 | - | 49,471,918 | - | 49,471,918 |
| ගොඩනැගිලි | 395,490,614 | 66,169,293 | - | 461,659,907 | - | 461,659,907 |
| පිරියත හා යන්ත්‍ර | 950,838,612 | 1,129,132 | (93,800) | 951,873,944 | (31,688,139) | 920,185,805 |
| මෝටර් වාහන | 89,021,800 | - | - | 89,021,800 | - | 89,021,800 |
| යතුරුපැදි | 298,640 | (0) | - | 298,640 | - | 298,640 |
| උපකරණ | 141,168,379 | 9,067,400 | - | 150,235,779 | (22,898,172) | 127,337,607 |
| පරිගණක උපාංග | 12,853,261 | 6,250,795 | - | 19,104,056 | (610,410) | 18,493,647 |
| ලී බඩු හා සවිකිරීම් | 26,584,254 | 676,098 | - | 27,260,352 | (511,373) | 26,748,979 |
| පාපැදි හා කරත්ත | 31,987 | 0 | - | 31,987 | - | 31,987 |
| මෙවලම් | 7,840,355 | (0) | - | 7,840,355 | (1,080,825) | 6,759,530 |
| පූර්ණ ලෙස ක්ෂය වූ වත්කම් | | | | | | |
| පුස්තකාල ග්‍රන්ථ | 2,499,042 | - | - | 2,499,042 | - | 2,499,042 |
| වාහන නවත්වන ගොඩනැගිලි | 1,170,063 | - | - | 1,170,063 | - | 1,170,063 |
| වත්කම්වල මුළු වටිනාකම | 1,657,124,656 | 109,550,375 | (93,800) | 1,766,581,231 | (56,788,918) | 1,709,792,313 |

ක්ෂය

| විස්තරය | 2017.01.01දිනට සමුච්චිත ක්ෂය | වර්ෂය සඳහා ක්ෂය | විකිණීමට අදාල සමුච්චිත ක්ෂය | හානි වූ හා අභාවිත ගැලපුම් | 2017.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| ක්ෂය වන වත්කම් | | | | | |
| භූමි අලංකරණ වියදම් | 1,858,226 | 60,788 | - | - | 1,919,014 |
| ඉඩම් | - | - | - | - | - |
| ගොඩනැගිලි | 189,566,201 | 26,573,183 | - | - | 216,139,384 |
| පිරියත හා යන්ත්‍ර | 428,731,194 | 65,103,005 | (71,845) | (279,274) | 493,483,080 |
| මෝටර් වාහන | 45,009,417 | 6,084,260 | - | - | 51,093,677 |
| යතුරුපැදි | 218,980 | 52,993 | - | - | 271,972 |
| උපකරණ | 102,403,615 | 3,344,428 | - | (146,195) | 105,601,848 |
| පරිගණක උපාංග | 8,660,561 | 1,467,623 | - | (20,937) | 10,107,247 |
| ලී බඩු හා සවිකිරීම් | 16,856,952 | 2,094,521 | - | (29,328) | 18,922,146 |
| පාපැදි හා කරත්ත | 28,788 | 3,199 | - | - | 31,987 |
| මෙවලම් | 5,476,368 | 301,268 | - | (100) | 5,777,536 |
| පූර්ණ ලෙස ක්ෂය වූ වත්කම් | | | | | |
| පුස්තකාල ග්‍රන්ථ | 2,499,041 | - | - | - | 2,499,041 |
| වාහන නවත්වන ගොඩනැගිලි | 1,170,063 | - | - | - | 1,170,063 |
| එකතුව | 802,479,405 | 105,085,269 | (71,845) | (475,833) | 907,016,995 |

ලියාපදිංචි අගය

| විස්තරය | 2017.12.31 දිනට ශේෂය |
|---|---|
| ක්ෂය වන වත්කම් | |
| භූමි අලංකරණ වියදම් | 4,194,374 |
| ඉඩම් | 49,471,918 |
| ගොඩනැගිලි | 245,520,523 |
| පිරියත හා යන්ත්‍ර | 426,702,725 |
| මෝටර් වාහන | 37,928,123 |
| යතුරුපැදි | 26,667 |
| උපකරණ | 21,735,759 |
| පරිගණක උපාංග | 8,386,399 |
| ලී බඩු හා සවිකිරීම් | 7,826,833 |
| පාපැදි හා කරත්ත | 0 |
| මෙවලම් | 981,993 |
| පූර්ණ ලෙස ක්ෂය වූ වත්කම් | |
| පුස්තකාල ග්‍රන්ථ | - |
| වාහන නවත්වන ගොඩනැගිලි | - |
| එකතුව | 802,775,316 |

## 2016

පිරිවැය

| විස්තරය | 2016.01.01 දිනට පිරිවැය | වර්ෂය තුළ අත්පත් කර ගැනීම් | වර්ෂය තුළ විකිණීම් | 2016.12.31 දිනට ශේෂය | හානි වූ හා අභාවිත ගැලපුම් | හානි වූ හා අභාවිත ගැලපූ පසු 2016.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| ක්ෂය වන වත්කම් | | | | | | |
| භූමි අලංකරණ වියදම් | 6,113,388 | - | - | 6,113,388 | - | 6,113,388 |
| ඉඩම් | 23,214,262 | - | - | 23,214,262 | - | 23,214,262 |
| ගොඩනැගිලි | 386,762,540 | 8,728,074 | - | 395,490,614 | - | 395,490,614 |
| පිරියත හා යන්ත්‍ර | 826,156,709 | 124,681,903 | - | 950,838,612 | (31,294,389) | 919,544,222 |
| මෝටර් වාහන | 85,771,800 | 5,950,000 | (2,700,000) | 89,021,800 | - | 89,021,800 |
| යතුරුපැදි | 298,640 | - | - | 298,640 | - | 298,640 |
| උපකරණ | 136,965,700 | 4,213,730 | (11,050) | 141,168,379 | (22,691,337) | 118,477,043 |
| පරිගණක උපාංග | 9,789,553 | 3,063,708 | - | 12,853,261 | (487,105) | 12,366,156 |
| ලී බඩු හා සවිකිරීම් | 25,082,488 | 1,501,765 | - | 26,584,254 | (434,628) | 26,149,626 |
| පාපැදි හා කරත්ත | 31,987 | - | - | 31,987 | - | 31,987 |
| මෙවලම් | 7,840,355 | - | - | 7,840,355 | (1,080,725) | 6,759,630 |
| පූර්ණ ලෙස ක්ෂය වූ වත්කම් | | | | | | |
| පුස්තකාල ග්‍රන්ථ | 2,499,042 | - | - | 2,499,042 | - | 2,499,042 |
| වාහන නවත්වන ගොඩනැගිලි | 1,170,063 | - | - | 1,170,063 | - | 1,170,063 |
| වත්කම්වල මුළු වටිනාකම | 1,511,696,526 | 148,139,180 | (2,711,050) | 1,657,124,656 | (55,988,183) | 1,601,136,473 |

ක්ෂය

| විස්තරය | 2016.01.01දිනට සමුච්චිත ක්ෂය | වර්ෂය සඳහා ක්ෂය | විකිණීමට අදාල සමුච්චිත ක්ෂය | හානි වූ හා අභාවිත ගැලපුම් | 2016.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| ක්ෂය වන වත්කම් | | | | | |
| භූමි අලංකරණ වියදම් | 1,796,474 | 61,751 | - | - | 1,858,226 |
| ඉඩම් | - | - | - | - | - |
| ගොඩනැගිලි | 164,361,639 | 25,204,561 | - | - | 189,566,201 |
| පිරියත හා යන්ත්‍ර | 364,258,682 | 67,218,178 | - | (2,745,666) | 428,731,194 |
| මෝටර් වාහන | 39,826,146 | 7,774,148 | (2,590,877) | - | 45,009,417 |
| යතුරුපැදි | 165,986 | 52,993 | - | - | 218,980 |
| උපකරණ | 97,912,453 | 5,827,666 | (11,050) | (1,325,454) | 102,403,615 |
| පරිගණක උපාංග | 7,770,781 | 986,410 | - | (96,630) | 8,660,561 |
| ලී බඩු හා සවිකිරීම් | 14,068,679 | 2,867,592 | - | (79,319) | 16,856,952 |
| පාපැදි හා කරත්ත | 23,990 | 4,798 | - | - | 28,788 |
| මෙවලම් | 5,178,748 | 302,870 | - | (5,250) | 5,476,368 |
| පූර්ණ ලෙස ක්ෂය වූ වත්කම් | | | | | |
| පුස්තකාල ග්‍රන්ථ | 2,499,041 | - | - | - | 2,499,041 |
| වාහන නවත්වන ගොඩනැගිලි | 1,170,063 | - | - | - | 1,170,063 |
| එකතුව | 699,032,682 | 110,300,969 | (2,601,927) | (4,252,319) | 802,479,405 |

ලියාපදිංචි අගය

| විස්තරය | 2016.12.31 දිනට ශේෂය |
|---|---|
| ක්ෂය වන වත්කම් | |
| භූමි අලංකරණ වියදම් | 4,255,162 |
| ඉඩම් | 23,214,262 |
| ගොඩනැගිලි | 205,924,413 |
| පිරියත හා යන්ත්‍ර | 490,813,028 |
| මෝටර් වාහන | 44,012,383 |
| යතුරුපැදි | 79,660 |
| උපකරණ | 16,073,428 |
| පරිගණක උපාංග | 3,705,595 |
| ලී බඩු හා සවිකිරීම් | 9,292,674 |
| පාපැදි හා කරත්ත | 3,199 |
| මෙවලම් | 1,283,262 |
| පූර්ණ ලෙස ක්ෂය වූ වත්කම් | |
| පුස්තකාල ග්‍රන්ථ | - |
| වාහන නවත්වන ගොඩනැගිලි | - |
| එකතුව | 798,657,068 |

## 02 සටහන
## අස්පෘශ්‍ය වත්කම්

### පිරිවැය 2017

| විස්තරය | 2017.01.01 දිනට පිරිවැය | වර්ෂය තුළ අත්පත් කර ගැනීම් | වර්ෂය තුළ බැහැර කිරීම් | 2017.12.31 දිනට ශේෂය | හානි වූ හා අභාවිත ගැලපුම්(සටහන 03) | හානි වූ හා අභාවිත ගැලපූ පසු 2017.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| පරිගණකමෘදුකාංග | 16,786,901 | 1,129,673 | - | 17,916,574 | (67,500) | 17,849,074 |
| වත්කම්වල මුළු වටිනාකම | **16,786,901** | **1,129,673** | **-** | **17,916,574** | **(67,500)** | **17,849,074** |

ක්ෂය

| විස්තරය | 2017.01.01දිනට සමුච්චිත ක්ෂය | වර්ෂය සඳහා ක්ෂය | විකිණීමට අදාල සමුච්චිත ක්ෂය | හානි වූ හා අභාවිත ගැලපුම් | 2017.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| පරිගණක මෘදුකාංග | 15,590,621 | 537,501 | - | - | 16,128,123 |
| එකතුව | **15,590,621** | **537,501** | **-** | | **16,128,123** |

ලියාහල අගය

| විස්තරය | 2017.12.31 දිනට ශේෂය |
|---|---|
| පරිගණක මෘදුකාංග | 1,720,952 |
| එකතුව | **1,720,952** |

### පිරිවැය 2016

| විස්තරය | 2016.01.01 දිනට පිරිවැය | වර්ෂය තුළ අත්පත් කර ගැනීම් | වර්ෂය තුළ බැහැර කිරීම් | 2016.12.31 දිනට ශේෂය | හානි වූ හා අභාවිත ගැලපුම්(සටහන 03) | හානි වූ හා අභාවිත ගැලපූ පසු 2016.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| පරිගණක මෘදුකාංග | 16,417,961 | 368,940 | - | 16,786,901 | (67,500) | 16,719,401 |
| වත්කම්වල මුළු වටිනාකම | **16,417,961** | **368,940** | **-** | **16,786,901** | **(67,500)** | **16,719,401** |

ක්ෂය

| විස්තරය | 2016.01.01දිනට සමුච්චිත ක්ෂය | වර්ෂය සඳහා ක්ෂය | විකිණීමට අදාල සමුච්චිත ක්ෂය | හානි වූ හා අභාවිත ගැලපුම් | 2016.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| පරිගණක මෘදුකාංග | 15,054,904 | 535,717 | - | - | 15,590,621 |
| එකතුව | **15,054,904** | **535,717** | **-** | **-** | **15,590,621** |

ලියාහල අගය

| විස්තරය | 2016.12.31 දිනට ශේෂය |
|---|---|
| පරිගණක මෘදුකාංග | 1,128,780 |
| එකතුව | **1,128,780** |

03 සටහන

හානි වූ සහ අභාවිත ද්‍රව්‍ය ගැලපුම් 2017

| විස්තරය | 2017.01.01 දිනට ශේෂය | වර්ෂය තුළ හඳුනාගත් හානි වූ සහ අභාවිත ද්‍රව්‍ය | වර්ෂය තුළ බැහැර කිරීම් | 2017.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| පිරියත හා යන්ත්‍ර | 31,294,389 | 393,750 | - | 31,688,139 |
| උපකරණ | 22,691,337 | 206,835 | - | 22,898,172 |
| පරිගණක උපාංග | 487,105 | 123,305 | - | 610,410 |
| ලී බඩු හා සවිකිරීම් | 434,628 | 76,745 | - | 511,373 |
| මෙවලම් | 1,080,725 | 100 | - | 1,080,825 |
| පරිගණක මෘදුකාංග | 67,500 | - | - | 67,500 |
| | 56,055,683 | 800,735 | - | 56,856,418 |

හානි වූ සහ අභාවිත ද්‍රව්‍ය ගැලපුම් 2016

| විස්තරය | 2016.01.01 දිනට ශේෂය | වර්ෂය තුළ හඳුනාගත් හානි වූ සහ අභාවිත ද්‍රව්‍ය | වර්ෂය තුළ බැහැර කිරීම් | 2016.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| පිරියත හා යන්ත්‍ර | 27,116,800 | 4,177,589 | - | 31,294,389 |
| උපකරණ | 21,250,477 | 1,440,860 | - | 22,691,337 |
| පරිගණක උපාංග | 390,475 | 96,630 | - | 487,105 |
| ලී බඩු හා සවිකිරීම් | 270,159 | 164,469 | - | 434,628 |
| මෙවලම් | 1,075,475 | 5,250 | - | 1,080,725 |
| පරිගණක මෘදුකාංග | 67,500 | - | - | 67,500 |
| | 50,170,886 | 5,884,797 | - | 56,055,683 |

04 සටහන

පෙර ගෙවූ කල් බදු

පිරිවැය 2017

| විස්තරය | 2017.01.01 දිනට පිරිවැය | වර්ෂය තුළ අත්පත් කර ගැනීම් | වර්ෂය තුළ බැහැර කිරීම් | 2017.12.31 දිනට පිරිවැය |
|---|---|---|---|---|
| බදු ඉඩම් | 4,920,845 | - | - | 4,920,845 |
| වත්කම්වල මුළු වටිනාකම | **4,920,845** | **-** | **-** | **4,920,845** |

ක්ෂය

| විස්තරය | 2017.01.01දිනට සමුච්චිත ක්ෂය | වර්ෂය සඳහා ක්ෂය | බැහැර කිරීම් සඳහා සමුච්චිත ක්ෂය | 2017.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| බදු ඉඩම් | 1,491,636 | 48,988 | - | 1,540,624 |
| එකතුව | **1,491,636** | **48,988** | **-** | **1,540,624** |

ලියාහල අගය

| විස්තරය | 2017.12.31 දිනට ශේෂය |
|---|---|
| බදු ඉඩම් | 3,380,221 |
| එකතුව | **3,380,221** |

පිරිවැය 2016

| විස්තරය | 2016.01.01 දිනට පිරිවැය | වර්ෂය තුළ අත්පත් කර ගැනීම් | වර්ෂය තුළ බැහැර කිරීම් | 2016.12.31 දිනට පිරිවැය |
|---|---|---|---|---|
| බදු ඉඩම් | 4,920,845 | - | - | 4,920,845 |
| වත්කම්වල මුළු වටිනාකම | **4,920,845** | **-** | **-** | **4,920,845** |

ක්ෂය

| විස්තරය | 2016.01.01දිනට සමුච්චිත ක්ෂය | වර්ෂය සඳහා ක්ෂය | බැහැර කිරීම් සඳහා සමුච්චිත ක්ෂය | 2016.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| බදු ඉඩම් | 1,441,931 | 49,706 | - | 1,491,636 |
| එකතුව | **1,441,931** | **49,706** | **-** | **1,491,636** |

ලියාහල අගය

| විස්තරය | 2016.12.31 දිනට ශේෂය |
|---|---|
| බදු ඉඩම් | 3,429,209 |
| එකතුව | **3,429,209** |

05 සටහන

| වෙනත් ජංගම නොවන වත්කම් | | 2017.12.31 දිනට | 2016.12.31 දිනට |
|---|---|---|---|
| තැන්පතු | | 1,070,000 | 220,000 |
| ආරක්ෂක තැන්පතු | | 232,233 | 218,094 |
| | | **1,302,233** | **438,094** |

06 සටහන

| තොග | | 2017.12.31 දිනට | 2016.12.31 දිනට |
|---|---|---|---|
| අමුද්‍රව්‍ය | | 449,694,018 | 235,929,691 |
| ඇසුරුම් ද්‍රව්‍ය | | 38,572,834 | 30,408,378 |
| නිමි භාණ්ඩ | | 155,543,481 | 283,819,001 |
| නොනිමි වැඩ | | 29,215,037 | 72,657,306 |
| මාර්ගස්ථ තොග - අමුද්‍රව්‍ය | | 6,427,489 | 16,676,440 |
| ණය පදනම මත ගත් අමුද්‍රව්‍ය | | 581,594 | 31,827 |
| තොග - සංයෝජන. පර්යේෂණ හා සංවර්ධන | | 1,710,675 | 2,013,309 |
| පිරියත හා යන්ත්‍ර අමතර කොටස් | | 115,331,036 | 108,339,758 |
| ඉන්ධන හා ලිහිසි ද්‍රව්‍ය | | 1,036,451 | 868,302 |
| ලිපිද්‍රව්‍ය තොග | | 999,909 | 1,128,989 |
| | | **799,112,524** | **751,873,001** |

07 සටහන

| වෙළඳ ණයගැතියෝ සහ අයවිය යුතු දේ | | 2017.12.31 දිනට | 2016.12.31 දිනට |
|---|---|---|---|
| ණයගැතියෝ - රාජ්‍ය ඖෂධ සංස්ථාව | | 2,298,338 | - |
| ණයගැතියෝ - සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | | 316,077,817 | 6,860,212 |
| ණයගැතියෝ - බෙදාහැරීම් | | 69,522,656 | 90,119,524 |
| ආපදා ණය | | 29,778,193 | 22,905,146 |
| අයවිය යුතු දේ | සටහන 28 | 1,246,780 | 7,646,356 |
| පාපැදි ණය | | 1,821,765 | 1,964,306 |
| සේවක ණය | | 1,450,033 | - |
| ආර්ථික සේවා බදු - 0.5% | | 11,288,784 | 8,655,104 |
| වැටුප් අතතිකාරම් | | - | 4,000 |
| උත්සව අත්තිකාරම් | | 531,000 | 541,000 |
| ආනයන තැන්පතු ප්‍රතිපූරණ | | 508,500 | 354,301 |
| | | **434,523,866** | **139,049,949** |

08 සටහන

| පූර්ව ගෙවීම් | 2017.12.31 දිනට | 2016.12.31 දිනට |
|---|---|---|
| අත්තිකාරම් ගෙවීම් | 624,445 | 1,835,700 |
| අත්තිකාරම් ගෙවීම් - යන්ත්‍ර සූත්‍ර සහ අමතර කොටස් | 10,226,313 | 33,705 |
| පූර්ව ගෙවීම් | 1,876,120 | 2,894,993 |
| කාර්යමණ්ඩලයට කළ පූර්ව ගෙවීම්වල පිරිවැය | 4,794,121 | 3,971,170 |
| | **17,520,999** | **8,735,569** |

09 සටහන

| වෙනත් මූල්‍ය වත්කම් | 2017.12.31 දිනට | 2016.12.31 දිනට |
|---|---|---|
| භාණ්ඩාගාර බිල්පත් | 843,731,264 | 1,144,738,018 |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ භාණ්ඩාගාර බිල්පත් | 61,306,765 | 10,845,063 |
| භාරකාරත්ව අරමුදල තුළ ආයෝජන | 21,423,039 | 20,171,345 |
| | **926,461,067** | **1,175,754,426** |

10 සටහන

| අත ඇති හා බැංකුවේ ඇති මුදල් | 2017.12.31 දිනට | 2016.12.31 දිනට |
|---|---|---|
| ලංකා බැංකුව - රත්මලාන ශාඛාව | 41,084 | 54,043 |
| ලංකා බැංකුව - ආයතනික ශාඛාව | 1,228,266 | 971,147 |
| මහජන බැංකුව - රත්මලාන ශාඛාව | 40,698 | 249,278 |
| මහජන බැංකුව - ආයතනික ශාඛාව | 11,634 | 309,816 |
| අතැති මුදල් | 36,367 | 28,895 |
| සුළු මුදල් | 16,516 | 18,302 |
| | **1,374,564** | **1,631,481** |

11 සටහන

**ප්‍රකාශිත ප්‍රාග්ධනය**

ප්‍රකාශිත ප්‍රාග්ධනය සෑදී ඇත්තේ රුපියල් 476,904,000 ක් වටිනා රුපියල් 0.186 බැගින් පරිවර්තනය කරන ලද ජපන් යෙන් මිලියන 2564 ක ප්‍රදානයකින්, මහා භාණ්ඩාගාරයෙන් ලබා දුන් රුපියල් 208,375,000 ක මුදලකින් සහ රාජ්‍ය ඖෂධ සංස්ථාව විසින් පවරන ලද ඉඩම්වල වටිනාකම වූ රුපියල් 4,800,000 කින්ය.

12 සටහන

| විලම්බිත බදු බැරකම | 2017.12.31 දිනට | 2017.12.31 දිනට |
|---|---|---|
| වර්ෂයේ ආරම්භක ශේෂය | 133,251,496 | 118,537,632 |
| වර්ෂය තුල විලම්බිත බදු බැරකම - හඳුනාගත්/(ලියාහල) අගය | 2,072,361 | 14,713,865 |
| | **135,323,858** | **133,251,496** |

13 සටහන

| වෙළඳ ණයහිමියෝ හා අනෙකුත් ගෙවීම් | 2017.12.31 දිනට | 2017.12.31 දිනට |
|---|---|---|
| ණයහිමි පාලනය - ඇසුරුම් ද්‍රව්‍ය | 3,426,222 | 7,751,662 |
| ණයහිමි පාලනය - අමුද්‍රව්‍ය | 23,420,969 | 7,590,666 |
| ණයහිමි පාලනය - ලිපිද්‍රව්‍ය | 1,549,446 | 792,244 |
| ණයහිමි පාලනය - උපකරණ හා යන්ත්‍රසූත්‍ර | 198,538 | 6,250,353 |
| ණයහිමි පාලනය - රසායනික ද්‍රව්‍ය | 210,016 | 1,381,226 |
| ණයහිමි පාලනය - සුභසාධන | - | 8,000 |
| ණයහිමි පාලනය - පොදු | 17,312,272 | 13,187,480 |
| ණයහිමි පාලනය - බැංකු | 34,661,676 | 25,459,755 |
| ණයහිමි පාලනය - සේවක | 2,770,210 | 2,651,168 |
| ණයහිමි පාලනය - සේවා | 4,101,901 | 4,171,437 |
| ණයහිමි පාලනය - අනෙකුත් ස්ථාවර වත්කම් | - | 18,614,927 |
| ණයහිමි පාලනය - බද්ධ ව්‍යාපාර | 18,187,600 | - |
| තැම්පත්කරුවන් වෙත ගෙවිය යුතු - අයකැමියෝ | 11,274 | 10,823 |
| තැම්පත්කරුවන් වෙත ගෙවිය යුතු - ගබඩා සහකාරවරු | 220,959 | 207,271 |
| ගෙවිය යුතු ටෙන්ඩර් බැඳුම්කර | 6,205,643 | 7,770,028 |
| ගෙවිය යුතු 1/3 එකතු කල අගය මත බදු | - | 633,049 |
| ගෙවිය යුතු උපයන විට ගෙවීමේ බද්ද | (166,155) | (41,199) |
| ගෙවිය යුතු සේවක අර්ථසාධක හා භාරකාර දායක මුදල් 25% | - | 126,632 |
| අමුද්‍රව්‍ය ණයට ගැනුම් | 180,802 | - |
| | **112,291,372** | **96,565,523** |

14 සටහන

| ආදායම | 2017 වර්ෂය සඳහා | 2016 වර්ෂය සඳහා |
|---|---|---|
| විකුණුම් - රාජ්‍ය ඖෂධ සංස්ථාව | 10,774,300 | - |
| විකුණුම් - සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | 2,484,217,605 | 1,901,261,853 |
| විකුණුම් - බෙදාහරින්නන් | 679,620,759 | 533,246,626 |
| | **3,174,612,664** | **2,434,508,479** |

15 සටහන

| විකුණුම් පිරිවැය | 2017 වර්ෂය සඳහා | 2016 වර්ෂය සඳහා |
|---|---|---|
| විකුණුම් පිරිවැය - රාජ්‍ය ඖෂධ සංස්ථාව | 8,172,816 | - |
| විකුණුම් පිරිවැය - රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව | 407,543,593 | 335,576,654 |
| විකුණුම් පිරිවැය - සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | 1,980,764,645 | 1,348,813,994 |
| විකුණුම් පිරිවැය - අමුද්‍රව්‍ය | 210,341 | 315,180 |
| විකුණුම් පිරිවැය - ඉන්වොයිසි විචලනය | 581,873 | 803,566 |
| තොග ගණන් ගැනීමේ ගැලපුම් - නිමි භාණ්ඩ | (5,604) | - |
| නිමි භාණ්ඩ ගැලපුම් - රාජ්‍ය ඖෂධ සංස්ථාව | 3536 | - |
| නිෂ්පාදන වියදම් ( සටහන 23 ) | 269,412,465 | 202,746,756 |
| | **2,666,683,665** | **1,888,256,150** |

16 සටහන

| වෙනත් මෙහෙයුම් ආදායම් | 2017 වර්ෂය සඳහා | 2016 වර්ෂය සඳහා |
|---|---|---|
| විවිධ ආදායම් - සටහන 16 A | 20,711,713 | 20,316,413 |
| අමුද්‍රව්‍ය හා නිමිභාණ්ඩ විකුණුම් | 276,823 | 394,034 |
| අඩමාණ ණය වෙනුවෙන් වැඩිපුර වෙන් කිරීම් | - | 570,257 |
| බැහැර කිරීමේදී ලාභය හෝ අලාභය | - | 4,909,777 |
| | **20,988,536** | **26,190,482** |

16 A සටහන

| විවිධ ආදායම් | 2017 වර්ෂය සඳහා | 2016 වර්ෂය සඳහා |
|---|---|---|
| අබලි ද්‍රව්‍ය විකිණීම | 1,314,495 | 3,261,587 |
| සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම | 214,000 | 233,500 |
| ටෙන්ඩරපත් විකිණීම | 279,882 | 464,800 |
| නිදහස් නොකළ බැඳුම්කර - අවුරුදු 02 ට වැඩි | - | 4,473,719 |
| බැංකු සුරකුම්පත් වලින් අය කර ගැනීම් | - | 7,525,587 |
| ප්‍රමාදගාස්තු අයකර ගැනිම | 12,971,037 | - |
| අය නොකළ රඳවා ගැනීම් | 4,952,389 | 4,187,151 |
| සාමාන්‍ය | 979,910 | 170,070 |
| | **20,711,713** | **20,316,413** |

17 සටහන

| පරිපාලන වියදම් | 2017 වර්ෂය සඳහා | 2016 වර්ෂය සඳහා |
|---|---|---|
| වැටුප් හා වේතන | 29,765,783 | 24,097,230 |
| අනියම් සේවක වැටුප් | 13,104,068 | 13,097,099 |
| ජීවන වියදම් දීමනාව | 6,609,447 | 5,431,538 |
| ගමන් වියදම් දිරිදීමනා | 7,663,336 | 3,948,912 |
| සේවක අර්ථසාධක හා භාරකාර අරමුදල් ගෙවීම් - 15% | 5,556,076 | 6,444,008 |
| අතිකාල | 8,138,628 | 4,816,754 |
| පැමිණීමේ දිරිදීමනාව | 4,469,285 | 3,149,274 |
| නිෂ්පාදන දිරිදීමනාව | 8,069,379 | 5,598,191 |
| වාර්ෂික ප්‍රසාද දීමනා | 1,442,728 | 1,145,581 |
| ජංගම සේවා පිරිවැය | 855,428 | 1,387,752 |
| සේවක පොළී පිරිවැය | 1,286,664 | 1,722,125 |
| සේවාමුර දිරිදීමනාව | 201,206 | 128,150 |
| කාර්ය මණ්ඩල පිරිවැය | 795,841 | 218,459 |
| සේවක මණ්ඩල වෛද්‍ය වියදම් | 1,458,535 | 2,646,857 |
| නිවාස ණය පොළී ප්‍රතිපූරණය | 2,429,940 | 1,677,357 |
| සුපරීක්ෂක දීමනා | 143,806 | 12,000 |
| දුෂ්කර සේවා දීමනාව | 179,508 | - |
| වෘත්තියවේදී දීමනාව | 192,000 | - |
| විශේෂ වැඩබැලීමේ දිරිදීමනාව | 162,000 | 217,931 |
| විශ්‍රමික ප්‍රතිලාභ | - | 58,000 |
| දුරකථන බිල්පත් ප්‍රතිපූරණය | 539,048 | 556,853 |
| සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය (සටහන 27) | 209,109 | 2,577,917 |
| කාර්ය මණ්ඩල සුභසාධනය | 9,438,124 | 6,737,015 |
| කාර්ය මණ්ඩල පුහුණුව | 5,005,516 | 2,335,259 |
| නිල ඇඳුම් හා පාවහන් | 733,761 | 416,909 |
| ගමන් බිමන් - විදේශ | 13,282,712 | 9,275,865 |
| අධ්‍යක්ෂ ගාස්තු | 230,000 | 368,000 |
| වෙනත් දිරිදීමනා | 2,359,580 | 1,543,300 |
| වරිපනම් හා බදු | 276,231 | 276,231 |
| විදුලිය | 10,176,759 | 11,889,330 |
| ජල ගාස්තු | 728,539 | 679,142 |
| රක්ෂණය - සාමාන්‍ය | 79,650 | 145,158 |
| රක්ෂණය - වාහන | 1,181,244 | 1,116,048 |
| මෝටර් වාහන අළුත්වැඩියාව හා නඩත්තුව | 3,876,145 | 4,110,199 |
| වාහන සඳහා ඉන්ධන හා ලිහිසි ද්‍රව්‍ය | 2,744,585 | 2,885,378 |
| උපකරණ නඩත්තුව | 1,237,632 | 770,613 |
| නඩත්තු පරිපාලන | 2,571,917 | 3,373,539 |
| ක්ෂය | 16,374,644 | 18,441,808 |
| ප්‍රවාහන ගාස්තු | 1,028,774 | 730,547 |
| තැපැල් හා ෆැක්ස් ගාස්තු | 330,484 | 290,147 |
| දුරකථන ගාස්තු | 1,224,192 | 1,049,156 |
| ආරක්ෂක ගාස්තු | 1,544,737 | 993,552 |
| පරිත්‍යාග | 9,468,973 | 619,803 |
| බලපත්‍ර ගාස්තු - මෝටර් වාහන | 108,845 | 132,236 |
| බලපත්‍ර ගාස්තු - ඖෂධ | 2,660,925 | 3,251,501 |
| බලපත්‍ර ගාස්තු - වෙනත් | 745,410 | 6,161 |
| මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 2,979,426 | 1,992,543 |
| කාර්යාල වියදම් | 319,934 | 146,849 |
| විගණන ගාස්තුව | 611,097 | 640,625 |
| කුලී ගාස්තු | 12,753,602 | 4,480,611 |
| ප්‍රචාරක දැන්වීම් | 3,673,512 | 4,683,735 |
| වෙළඳ දායකත්වයන් හා වාර සඟරා | 262,095 | 273,647 |
| නීති හා පරීක්ෂණ වියදම් | 558,680 | 349,750 |
| වෘත්තීයවේදී ගාස්තු | 166,419 | 361,335 |
| සංග්‍රහ වියදම් | 1,135,510 | 756,779 |
| වාර්ෂික දායකත්වයන් | 52,500 | 40,000 |
| වාර්ෂික සම්මන්ත්‍රණ හා රැස්වීම් | 10,000 | 11,000 |
| මුද්දර ගාස්තු | 42,350 | 41,975 |
| හානි වූ හා අභාවිත ද්‍රව්‍ය පිරිවැය | 324,902 | 1,632,478 |
| පුහුණු පාසල සඳහා වියදම් - CTPPM | 1,007,798 | - |
| තොග ගණන් ගැනීමේ ගැලපුම්-ලිපි ද්‍රව්‍ය | 67 | 8,339 |
| | 204,579,086 | 165,788,553 |

18 සටහන

| අලෙවි හා බෙදාහැරීම් වියදම් | 2017 වර්ෂය සඳහා | 2016 වර්ෂය සඳහා |
|---|---|---|
| ප්‍රවර්ධන වට්ටම් | 24,701,981 | 15,642,548 |
| විකුණුම් ප්‍රවර්ධන වියදම් | 38,092,942 | 32,735,666 |
| ප්‍රතික්ෂේපිත නිමි ද්‍රව්‍ය පිරිවැය | 126,003 | 2,048 |
| 30 වන සංවත්සර උත්සවය වෙනුවෙන් වියදම් | 4,709,477 | - |
| | **67,630,402** | **48,380,262** |

19 සටහන

| වෙනත් මෙහෙයුම් වියදම් | 2017 වර්ෂය සඳහා | 2016 වර්ෂය සඳහා |
|---|---|---|
| සංයෝජනය පර්යේෂණ හා සංවර්ධන වියදම් | 11,424,806 | 4,324,220 |
| තොග ගණන් ගැනීමේ ගැලපුම් - පර්යේෂණ හා සංවර්ධන වියදම් | 2,821 | (144,934) |
| විනිමය අලාභ | 498,900 | 318,143 |
| | **11,926,527** | **4,497,428** |

20 සටහන

| මූල්‍ය වියදම් | 2017 වර්ෂය සඳහා | 2016 වර්ෂය සඳහා |
|---|---|---|
| බැංකු ගාස්තු | 394,764 | 238,959 |
| අයිරා පොළිය | 11,328 | 2,000 |
| | **406,092** | **240,959** |

21 සටහන

| මූල්‍ය ආදායම | 2017 වර්ෂය සඳහා | 2016 වර්ෂය සඳහා |
|---|---|---|
| කාර්ය මණ්ඩල ණය පොළිය | 986,470 | 836,586 |
| භාණ්ඩාගාර බිල්පත් පොළිය | 73,534,273 | 85,783,178 |
| පොළී ආදායම - කාර්යමණ්ඩල ණය | 2,880,351 | 1,009,515 |
| පාඨමාලා ගාස්තු - පුහුණු පාසල - CTPPM | 206,000 | - |
| | **77,607,094** | **87,629,279** |

22 සටහන

| ආදායම් බදු වියදම | 2017 වර්ෂය සඳහා | 2016 වර්ෂය සඳහා |
|---|---|---|
| වත්මන් බදු වියදම - 22 'අ' සටහන | 81,019,139 | 112,684,115 |
| විලම්බිත බදු වියදම - 22 'ආ' සටහන | 2,072,361 | 14,713,865 |
| ලාභාංශ බදු | 14,983,082 | 17,120,193 |
| | **98,074,582** | **144,518,173** |

22 'අ' සටහන

| වත්මන් බදු වියදම | 2017 වර්ෂය සඳහා | 2016 වර්ෂය සඳහා |
|---|---|---|
| වර්ෂයේ ලාභය මත බදු - 22 'අ' (i) සටහන | 82,050,192 | 112,684,115 |
| ආදායම් බදු අධි/ඌණ ප්‍රතිපාදනය | (1,031,053) | - |
| | **81,019,139** | **112,684,115** |

22 'අ' සටහන (ස)

| වර්ෂයේ ලාභය මත ආදායම් බද්ද | 2017 වර්ෂය සඳහා | 2016 වර්ෂය සඳහා |
|---|---|---|
| බදු පෙර ලාභය | 321,982,521 | 441,164,887 |
| ඉඩදිය නොහැකි වියදම් | 124,056,791 | 130,936,087 |
| ඉඩදිය හැකි වියදම් | (131,993,120) | (145,148,228) |
| බදු නිදහස් ආදායම | (73,534,273) | (85,783,178) |
| භාණ්ඩාගාර බිල්පත් පොළිය මත ආදායම් බදු | 81,704,748 | 95,314,642 |
| **තක්සේරු ආදායම** | **322,216,667** | **436,484,210** |
| **බදු අය කළ හැකි ආදායම** | **322,216,667** | **436,484,210** |
| බදු අය කළ හැකි ආදායම මත බදු අනුපාතිකය | 28% | 28% |
| බදු අය කළ හැකි ආදායම මත ආදායම් බදු | 90,220,667 | 122,215,579 |
| නාමමාත්‍ර බදු | (8,170,475) | (9,531,464) |
| මුළු ආදායම් බද්ද | **82,050,192** | **112,684,115** |

22 'ආ' සටහන

| විලම්බිත බදු | 2017 වර්ෂය සඳහා | 2016 වර්ෂය සඳහා |
|---|---|---|
| **වර්ෂයට අදළ විලම්බිත බද්ද හඳුනාගත්/(ලියාහැරීම)** | | |
| විලම්බිත බදු බැරකම මත විලම්බිත බදු | 146,863,646 | 144,692,969 |
| විලම්බිත බදු වත්කම් මත විලම්බිත බදු | (11,539,788) | (11,441,473) |
| වර්ෂය අවසානයේදී විලම්බිත බදු බැරකම | 135,323,858 | 133,251,496 |
| වර්ෂය ආරම්භයේදී විලම්බිත බදු බැරකම | 133,251,496 | 118,537,631 |
| වර්ෂය තුළ හඳුනාගත්/(ලියාහල) විලම්බිත බදු | **2,072,361** | **14,713,865** |

## 23 සටහන

| නිෂ්පාදන පිරිවැය | | 2017 වර්ෂය සඳහා | | 2016 වර්ෂය සඳහා |
|---|---|---|---|---|
| **සෘජු ශ්‍රමය (නිෂ්පාදනය)** | | | | |
| වැටුප් හා වේතන | | 6,098,836 | සටහන 23 අ | 673,932 |
| අනියම් සේවක වැටුප් | | 714,520 | සටහන 23 අ | 165,777 |
| ජීවන වියදම් දීමනාව | | 2,671,253 | සටහන 23 අ | 803,270 |
| ගමන් වියදම් දිරිදීමනා | | 3,486,050 | සටහන 23 අ | 421,469 |
| සේවක අර්ථසාධක හා භාරකාර අරමුදල් ගෙවීම් - 15% | | 3,429,875 | සටහන 23 අ | 2,547,687 |
| අතිකාල | | 5,427,637 | සටහන 23 අ | 1,797,901 |
| පැමිණීමේ දිරිදීමනාව | | 3,454,931 | සටහන 23 අ | 1,358,711 |
| නිෂ්පාදන දිරිදීමනාව | | 4,245,293 | සටහන 23 අ | 5,207,544 |
| වාර්ෂික ප්‍රසාද දීමනා | | 2,150,113 | | 1,871,914 |
| ජංගම සේවා පිරිවැය | | 1,018,451 | | 2,097,874 |
| සේවක පොළී පිරිවැය | | 1,548,027 | | 2,207,717 |
| සේවාමුර දිරිදීමනාව | | 2,160,646 | | 924,350 |
| සේවක මණ්ඩල වෛද්‍ය වියදම් | | 2,182,047 | | 1,689,176 |
| නිවාස ණය පොළී ප්‍රතිපූරණය | | 5,525,703 | | 2,045,008 |
| අමතර මාසික දිරි දීමනා | | 259,000 | | 187,318 |
| වැඩ බැලීමේ දීමනා | | 108,000 | | 9,000 |
| දුෂ්කර සේවා දීමනාව | | 3,315,937 | | - |
| වෘත්තියවේදි ගාස්තු | | 48,000 | | - |
| විශ්‍රමික ප්‍රතිලාභ | | 240,000 | | - |
| කාර්ය මණ්ඩල පිරිවැය | | 1,217,812 | | 432,678 |
| | | **49,302,129** | | **24,441,327** |
| **වක්‍ර නිෂ්පාදන පිරිවැය(තත්ව පාලන/ පර්යේෂණ/ සැලසුම් /නඩත්තු)** | | | | |
| වැටුප් හා වේතන | | 24,901,275 | සටහන 23 අ | 11,659,751 |
| අනියම් සේවක වැටුප් | | 1,717,681 | | 481,822 |
| ජීවන වියදම් දීමනාව | | 7,406,654 | | 6,119,979 |
| ගමන් වියදම් දිරිදීමනා | | 4,833,619 | | 3,896,194 |
| සේවක අර්ථසාධක හා භාරකාර අරමුදල් ගෙවීම් - 15% | | 6,074,664 | | 7,123,770 |
| අතිකාල | | 7,270,687 | | 3,218,605 |
| පැමිණීමේ දිරිදීමනාව | | 5,252,981 | | 4,336,108 |
| කාර්යසාධන දිරිදීමනාව | | 9,860,040 | | 5,900,362 |
| වාර්ෂික ප්‍රසාද දීමනා | | 1,636,439 | | 1,375,801 |
| ජංගම සේවා පිරිවැය | | 781,463 | | 1,543,342 |
| සේවක පොළී පිරිවැය | | 1,047,237 | | 1,516,963 |
| සේවාමුර දිරිදීමනාව | | 620,184 | | 351,450 |
| සේවක මණ්ඩල වෛද්‍ය වියදම් | | 1,597,258 | | 2,107,156 |
| නිවාස ණය පොළී ප්‍රතිපූරණය | | 3,448,823 | | 2,301,680 |
| අමතර මාසික දිරි දීමනා | | 259,000 | | 187,318 |
| සුපරීක්ෂක දීමනා | | 213,097 | | 18,000 |
| දුෂ්කර සේවා දීමනාව | | 1,541,942 | | - |
| වෘත්තියවේදි ගාස්තු | | 54,000 | | - |
| කාර්ය මණ්ඩල පිරිවැය | | 866,698 | | 358,378 |
| විශේෂ වැඩ බැලීමේ දීමනාව | | 117,151 | | 67,428 |
| දුරකථන බිල්පත් ප්‍රතිපූරණය | | 314,494 | | 299,647 |
| සෞඛ්‍ය රක්ෂණ යෝජනාක්‍රමයේ වාරිකය | සටහන 27 | 84,864 | | 6,555,255 |
| කාර්ය මණ්ඩල සුභසාධනය | | 16,755,682 | සටහන 23 අ | 10,787,391 |
| කාර්ය මණ්ඩල පුහුණුව | | 6,655,910 | | 1,862,511 |
| නිල ඇඳුම් හා පාවහන් | | 1,508,316 | | 990,052 |
| ජල ගාස්තු | | 475,563 | සටහන 23 අ | 14,490 |
| වරිපනම් හා බදු | | 646,216 | | 359,764 |
| විදුලිය | | 2,580,997 | සටහන 23 අ | 15,842 |
| රක්ෂණය - පොදු | | 343,977 | සටහන 23 අ | 600,535 |
| ආරක්ෂක ගාස්තු - නිෂ්පාදන | | 5,157,472 | සටහන 23 අ | 4,535,159 |
| උපකරණ නඩත්තුව | | 1,448,003 | සටහන 23 අ | 30,926 |
| නිෂ්පාදන නඩත්තු කටයුතු | | 2,832,580 | සටහන 23 අ | 1,345,396 |
| ක්ෂය | | 89,297,112 | | 92,444,583 |
| ප්‍රවාහන ගාස්තු | | 1,705,749 | | 1,613,171 |
| අමතර කොටස් පරිභෝජනය | | 1,441,708 | සටහන 23 අ | 2,726,864 |
| ඉන්ධන හා ලිහිසි ද්‍රව්‍ය පරිභෝජනය | | 717,530 | සටහන 23 අ | 565,007 |
| යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියාව | | 1,602,711 | සටහන 23 අ | 250,832 |
| තත්ත්ව පාලන වියදම් | | 2,249,654 | | 64,257 |
| අමුද්‍රව්‍ය විනාශ කිරීමේ පිරිවැය | | 855,294 | | - |
| ප්‍රතික්ෂේපිත අමුද්‍රව්‍යවල පිරිවැය | | 654,452 | | (322,688) |
| ප්‍රතික්ෂේපිත ඇසුරුම් ද්‍රව්‍ය පිරිවැය | | 3,261 | | 16,365 |
| ප්‍රතික්ෂේපිත නොනිමි ද්‍රව්‍ය පිරිවැය | | 3,142,914 | | 1,415,341 |
| හානි වූ අමුද්‍රව්‍යවල පිරිවැය | | (24,000) | | (24,000) |
| අමුද්‍රව්‍ය ගැලපුම - සාමාන්‍ය ඖෂධ | | (12,685) | | 724 |
| අමුද්‍රව්‍ය ගැලපුම - පෙනිසිලින් ඖෂධ | | (3,634) | | (84,283) |
| අමුද්‍රව්‍ය ගැලපුම - තොග සත්‍යාපනය | | 244,207 | | (612,202) |
| ඇසුරුම් ද්‍රව්‍ය ගැලපුම - තොග සත්‍යාපනය | | 43,986 | | (6,738) |
| තොග සත්‍යාපන ගැලපුම - නඩත්තු | | (160,048) | | 20,561 |
| නොනිමි ද්‍රව්‍ය ගැලපුම් - තොග සත්‍යාපනය | | 47,159 | | 276,559 |
| **නිෂ්පාදන පිරිවැයට අවශෝෂණය කර නොගත් විකුණුම් පිරිවැයට මාරුකරන ලද පිරිවැය** | | 269,412,465 | | 202,746,756 |

23 'අ' සටහන

| නිෂ්පාදන පිරිවැය | අවශෝෂණය නොකල පිරිවැය | විකුණුම් පිරිවැය සඳහා අවශෝෂණය කල පිරිවැය | එකතුව 2017 | එකතුව 2016 |
|---|---|---|---|---|
| **සෘජු ශ්‍රමය (නිෂ්පාදනය)** | | | | |
| වැටුප් හා වේතන | 6,098,836 | 32,851,316 | 38,950,152 | 38,538,099 |
| අනියම් සේවක වැටුප් | 714,520 | 1,674,064 | 2,388,585 | 2,184,770 |
| ජීවන වියදම් දීමනාව | 2,671,253 | 6,972,168 | 9,643,421 | 9,424,691 |
| ගමන් වියදම් දිරිදීමනා | 3,486,050 | 2,457,898 | 5,943,947 | 4,772,572 |
| සේවක අර්ථසාධක හා භාරකාර අරමුදල් ගෙවීම් - 15% | 3,429,875 | 4,346,684 | 7,776,559 | 9,602,724 |
| අතිකාල | 5,427,637 | 1,228,762 | 6,656,398 | 4,872,280 |
| පැමිණීමේ දිරිදීමනාව | 3,454,931 | 2,246,519 | 5,701,450 | 7,630,237 |
| නිෂ්පාදන දිරිදීමනාව | 4,245,293 | 7,987,959 | 12,233,251 | 10,346,700 |
| වාර්ෂික ප්‍රසාද දීමනා | 2,150,113 | - | 2,150,113 | 1,871,914 |
| ජංගම සේවා පිරිවැය | 1,018,451 | - | 1,018,451 | 2,097,874 |
| සේවක පොළී පිරිවැය | 1,548,027 | - | 1,548,027 | 2,207,717 |
| සේවාමුර දිරිදීමනාව | 2,160,646 | - | 2,160,646 | 1,532,350 |
| සේවක මණ්ඩල වෛද්‍ය වියදම් | 2,182,047 | - | 2,182,047 | 2,545,905 |
| නිවාස ණය පොළී ප්‍රතිපූරණය | 5,525,703 | - | 5,525,703 | 2,956,371 |
| අමතර මාසික දිරි දීමනා | 259,000 | - | 259,000 | 187,318 |
| වැඩ බැලීමේ දීමනා | 108,000 | - | 108,000 | 9,000 |
| දුෂ්කර සේවා දීමනාව | 3,315,937 | - | 3,315,937 | - |
| වෘත්තියවේදි ගාස්තු | 48,000 | - | 48,000 | - |
| විශ්‍රමික ප්‍රතිලාභ | 240,000 | - | 240,000 | - |
| කාර්ය මණ්ඩල පිරිවැය | 1,217,812 | - | 1,217,812 | 432,678 |
| | 49,302,129 | 59,765,370 | 109,067,498 | 101,213,201 |
| **වක්‍ර නිෂ්පාදන පිරිවැය(තත්ව පාලන/ පර්යේෂණ/ සැලසුම් /නඩත්තු)** | | | | |
| වැටුප් හා වේතන | 24,901,275 | 6,041,066 | 30,942,342 | 30,074,102 |
| අනියම් සේවක වැටුප් | 1,717,681 | - | 1,717,681 | 1,110,787 |
| ජීවන වියදම් දීමනාව | 7,406,654 | - | 7,406,654 | 7,146,012 |
| ගමන් වියදම් දිරිදීමනා | 4,833,619 | - | 4,833,619 | 3,896,194 |
| සේවක අර්ථසාධක හා භාරකාර අරමුදල් ගෙවීම් - 15% | 6,074,664 | - | 6,074,664 | 7,123,770 |
| අතිකාල | 7,270,687 | - | 7,270,687 | 3,218,605 |
| පැමිණීමේ දිරිදීමනාව | 5,252,981 | - | 5,252,981 | 4,336,108 |
| කාර්යසාධන දිරිදීමනාව | 9,860,040 | - | 9,860,040 | 7,669,078 |
| වාර්ෂික ප්‍රසාද දීමනා | 1,636,439 | - | 1,636,439 | 1,375,801 |
| ජංගම සේවා පිරිවැය | 781,463 | - | 781,463 | 1,543,342 |
| සේවක පොළී පිරිවැය | 1,047,237 | - | 1,047,237 | 1,516,963 |
| සේවාමුර දිරිදීමනාව | 620,184 | - | 620,184 | 351,450 |
| සේවක මණ්ඩල වෛද්‍ය වියදම් | 1,597,258 | - | 1,597,258 | 2,107,156 |
| නිවාස ණය පොළී ප්‍රතිපූරණය | 3,448,823 | - | 3,448,823 | 2,301,680 |
| අමතර මාසික දිරි දීමනා | 259,000 | - | 259,000 | 187,318 |
| සුපරීක්ෂක දීමනා | 213,097 | - | 213,097 | 18,000 |
| දුෂ්කර සේවා දීමනාව | 1,541,942 | | 1,541,942 | - |
| වෘත්තියවේදි ගාස්තු | 54,000 | | 54,000 | - |
| කාර්ය මණ්ඩල පිරිවැය | 866,698 | - | 866,698 | 358,378 |
| විශේෂ වැඩ බැලීමේ දීමනාව | 117,151 | - | 117,151 | 67,428 |
| දුරකථන බිල්පත් ප්‍රතිපූරණය | 314,494 | - | 314,494 | 299,647 |
| සෞඛ්‍ය රක්ෂණ යෝජනාක්‍රමයේ වාරිකය සටහන 27 | 84,864 | - | 84,864 | 9,188,266 |
| කාර්ය මණ්ඩල සුභසාධනය | 16,755,682 | 7,135,813 | 23,891,495 | 21,903,614 |
| කාර්ය මණ්ඩල පුහුණුව | 6,655,910 | - | 6,655,910 | 1,862,511 |
| නිල ඇඳුම් හා පාවහන් | 1,508,316 | - | 1,508,316 | 990,052 |
| ජල ගාස්තු | 475,563 | 900,306 | 1,375,869 | 1,608,724 |
| වරිපනම් හා බදු | 646,216 | - | 646,216 | 645,747 |
| විදුලිය | 2,580,997 | 21,116,455 | 23,697,452 | 27,777,101 |
| රක්ෂණය - පොදු | 343,977 | 965,590 | 1,309,567 | 600,535 |
| ආරක්ෂක ගාස්තු - නිෂ්පාදන | 5,157,472 | 2,004,353 | 7,161,825 | 4,535,159 |
| උපකරණ නඩත්තුව | 1,448,003 | 3,315,344 | 4,763,348 | 1,774,619 |
| නිෂ්පාදන නඩත්තු කටයුතු | 2,832,580 | 7,858,266 | 10,690,846 | 12,641,260 |
| ක්ෂය | 89,297,112 | - | 89,297,112 | 92,444,583 |
| ප්‍රවාහන ගාස්තු | 1,705,749 | - | 1,705,749 | 1,613,171 |
| අමතර කොටස් පරිභෝජනය | 1,441,708 | 11,891,810 | 13,333,518 | 9,450,832 |
| ඉන්ධන හා ලිහිසි ද්‍රව්‍ය පරිභෝජනය | 717,530 | 10,287,674 | 11,005,204 | 12,779,810 |
| යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියාව | 1,602,711 | 1,290,862 | 2,893,572 | 556,218 |
| තත්ත්ව පාලන වියදම් | 2,249,654 | - | 2,249,654 | 1,533,019 |
| අමුද්‍රව්‍ය විනාශ කිරීමේ පිරිවැය | 855,294 | - | 855,294 | - |
| ප්‍රතික්ෂේපිත අමුද්‍රව්‍යවල පිරිවැය | 654,452 | - | 654,452 | (322,688) |
| ප්‍රතික්ෂේපිත ඇසුරුම් ද්‍රව්‍ය පිරිවැය | 3,261 | - | 3,261 | 16,365 |
| ප්‍රතික්ෂේපිත නොනිමි ද්‍රව්‍ය පිරිවැය | 3,142,914 | - | 3,142,914 | 1,415,341 |
| හානි වූ අමුද්‍රව්‍යවල පිරිවැය | (24,000) | - | (24,000) | (24,000) |
| අමුද්‍රව්‍ය ගැලපුම - සාමාන්‍ය ඖෂධ | (12,685) | - | (12,685) | 724 |
| අමුද්‍රව්‍ය ගැලපුම - පෙනිසිලින් ඖෂධ | (3,634) | - | (3,634) | (84,283) |
| අමුද්‍රව්‍ය ගැලපුම - තොග සත්‍යාපනය | 244,207 | - | 244,207 | (612,202) |
| ඇසුරුම් ද්‍රව්‍ය ගැලපුම - තොග සත්‍යාපනය | 43,986 | - | 43,986 | (6,738) |
| තොග සත්‍යාපන ගැලපුම - නඩත්තු | (160,048) | - | (160,048) | 20,561 |
| නොනිමි ද්‍රව්‍ය ගැලපුම් - තොග සත්‍යාපනය | 47,159 | - | 47,159 | 276,559 |
| | **269,412,465** | **132,572,908** | **401,985,374** | **378,499,877** |

24 සටහන

**විශ්‍රාම ප්‍රතිලාභ වගකීම**

මූල්‍ය තත්ත්ව වාර්තාවෙහි හඳුනා ගනු ලැබූ මුදල් ප්‍රමාණයන් පහත පරිදි වේ.

| | 31.12.2017 | 31.12.2016 |
|---|---|---|
| වර්ෂය මුලදී ශුද්ධ බැරකම් | 40,862,404 | 60,520,058 |
| ජංගම සේවා පිරිවැය | 2,655,342 | 5,028,968 |
| පොළී පිරිවැය | 3,881,928 | 5,446,805 |
| උපකල්පන වෙනස්වීම් නිසා වූ ලාභ / අලාභ | (2,121,769) | (24,048,388) |
| බැරකම් අත්දැකීම් අලාභය | (1,226,459) | (4,817,184) |
| | 44,051,446 | 42,130,259 |
| **අඩු කළා** | | |
| වර්ෂය තුළ කරන ලද ගෙවීම් | (2,837,917) | (1,267,855) |
| | **41,213,529** | **40,862,404** |

සංස්ථාවේ විශ්‍රාම ප්‍රතිලාභ බැරකම පියල් එස්. ගුණතිලක ඇසෝෂියේට්ස් විසින් කරන ලද ආයුගණක තක්සේරුව මත පදනම්ව ඇත. විශ්‍රාම ප්‍රතිලාභයේ පිරිවැය නිර්ණය කිරීමෙහිලා භාවිතා කරන ලද ප්‍රධාන අනුමානයන් වූයේ;

| | | |
|---|---|---|
| අපේක්ෂිත අනාගත වැටුප් වැඩි වීම | 4% | 4% |
| වට්ටම් අනුපාතිකය | 10.4% | 9.5% |
| කාර්ය මණ්ඩල පිරිවැටුම් සාධකය | 2.67% | 2.67% |

ආදායම් ප්‍රකාශ තුළ හඳුනා ගෙන ඇති මුදල් ප්‍රමාණයන් පහත
පරිදි වේ:

| | | |
|---|---|---|
| ජංගම සේවා පිරිවැය | 2,655,342 | 5,028,968 |
| පොළී පිරිවැය | 3,881,928 | 5,446,805 |

ඒවායේ හොඳම ඇස්තමේන්තු ගෙනෙනු පිණිස 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වයේ වත්මන් වටිනාකම තක්සේරු කරනු පිණිස ආයුගණක තක්සේරුවක් සිදු කෙරුණි.

25 සටහන

**ආශ්‍රිත පාර්ශව අනාවරණයන්**

සැලකිය යුතු ආශ්‍රිත පාර්ශව අනාවරණයන්හි විස්තර පහත පරිදි වේ.

| සංවිධානය | සබඳතාවය | ගනුදෙනුවේ ස්වභාවය | වර්ෂය තුළ විකිණීම් |
|---|---|---|---|
| වෛද්‍ය සැපයුම් අංශය | ගනුදෙනුකරු | භාණ්ඩ විකිණීම | 2,484,217,605 |
| රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව - බෙදාහරින්නන් හරහා | ගනුදෙනුකරු | භාණ්ඩ විකිණීම | 50,024,605 |
| - ටෙන්ඩරපත් හරහා | ගනුදෙනුකරු | භාණ්ඩ විකිණීම | 10,774,300 |

27 සටහන

**සෞඛ්‍ය රක්ෂණ යෝජනාක්‍රමය**

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශණ වල වැරදීමකින් සෞඛ්‍ය රක්ෂණ අරමුදලේ අගය රු. 5,784,963 ක් වැඩියෙන් දක්වා තිබුණි. එම අගය සෞඛ්‍ය රක්ෂණ පරිපාලන වියදම් ලෙස රු. 1,251,866 ක් සහ සෞඛ්‍ය රක්ෂණ නිෂ්පාදන වියදම් යටතේ රු. 4,533,097 ක් වශයෙන් මූල්‍ය ප්‍රකාශණ වල දක්වා තිබුණි. එය පහත පරිදි වේ.

සටහන 17

| පරිපාලන වියදම් | 2016 මූල්‍ය ප්‍රකාශණ වලට අනුව | වැඩියෙන් දැක්වූ අගය | නිවැරදි විය යුතු අගය |
|---|---|---|---|
| සෞඛ්‍ය රක්ෂණ යෝජනාක්‍රමය | 2,577,9117 | 1,251,866 | 1,326,051 |
| 23 සටහන සහ 23 'අ' සටහන | | | |
| වක්‍ර නිෂ්පාදන පිරිවැය(තත්ව පාලන/ පර්යේෂණ/ සැලසුම් /නඩත්තු) | | | |
| සෞඛ්‍ය රක්ෂණ යෝජනාක්‍රමය | 9,188,266 | 4,533,097 | 4,655,169 |

ඉහත තත්වයන් මත 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශණ වල සෞඛ්‍ය රක්ෂණය යටතේ රු. 5,784,963 ක් අඩුවෙන් දක්වා නිවැරදි කරන ලදී.

සටහන 17

| පරිපාලන වියදම් | 2017 මූල්‍ය ප්‍රකාශණ වලට අනුව | අඩුවෙන් දැක්වූ අගය | නිවැරදි විය යුතු අගය |
|---|---|---|---|
| සෞඛ්‍ය රක්ෂණ යෝජනාක්‍රමය | 209,109 | 1,251,866 | 1,460,975 |
| 23 සටහන සහ 23 'අ' සටහන | | | |
| වක්‍ර නිෂ්පාදන පිරිවැය(තත්ව පාලන/ පර්යේෂණ/ සැලසුම් /නඩත්තු) | | | |
| සෞඛ්‍ය රක්ෂණ යෝජනාක්‍රමය | 84,864 | 4,533,097 | 4,617,961 |

28 සටහන

**ලැබිය යුතු**

තියෝෆිලින් ඇන්හයිඩ්‍රස් කි. ග්‍රෑ. 1000ක් මිලදී ගැනීම සඳහා චීනයේ ජොයිකෙම් ආයතනය වෙතට ටෙලිග්‍රෆික් ට්‍රාන්සර මඟින් කරන ලද ගෙවීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කරනු ලබන හෙයින් අදාළ අත්තිකාරම් ගිණුමේ ඇති මුදල වන රු. 1,577,780.29 ලැබිය යුතු ගිණුමට මාරු කරන ලදී.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එච්එස්එම්/ඒ/එස්පීඑම්සී/1/17/43
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2018 සැප්තැම්බර් 05 දින.

සභාපති

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

**ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහාවූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29 වන වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සංස්ථාවේ සභාපති වෙත 2018 ජූලි 26 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍යප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනයකළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2

## 2. මූල්‍ය ප්‍රකාශන

-------------------

### 2.1 තත්ත්වාගණනයකළ මතය

------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1

----------------------------------

ප්‍රමිතයේ 32 ඡේදය ප්‍රකාරව, වත්කම් සහ වගකීම් එකිනෙකට හිලව් නොකළ යුතු වුවත්, සංස්ථාවේ උපයන විට ගෙවීම් බදු ගිණුමේ රු.166,155 ක හර ශේෂය වෙළඳ හා වෙනත් ණයහිමි ගිණුමේ රු.112,457,527 ක බැර ශේෂයෙන් හිලව් කර මූල්‍ය ප්‍රකාශනවල රු.112,291,372 ක් ලෙස දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

-----------------------------------

ප්‍රමිතයේ 51 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.223,206,845 ක්වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුනි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24

-----------------------------------

ප්‍රමිතයේ 17 ඡේදය ප්‍රකාරව, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සඳහා ගෙවීම් (Key Management Personnel Compensation)පිළිබඳ තොරතුරු හෙළිදරව් කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්පනාත්මක රාමුවෙහි 4.56 ඡේදය ප්‍රකාරව, ආයතන විසින් සිය මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී බහුලව යොදා ගන්නා මිනුම් ක්‍රමය ඓතිහාසික පිරිවැය ක්‍රමය වුවත් එය අනෙකුත් මිනුම් ක්‍රම සමඟ ඒකාබද්ධව පවතී. එමනිසා වත්කම් සහ වගකීම් මිනුම්කරණය සඳහා වෙන වෙනම මිනුම් ක්‍රම හඳුනාගත යුතු වේ. එහෙත් සංස්ථාව විසින් එලෙස හඳුනා ගැනීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්කරණ ප්‍රතිපත්ති 2.2 යටතේ ඓතිහාසික පිරිවැය ක්‍රමය පමණක් පදනම් කර ගන්නා බව දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 හි 67 ඡේදය ප්‍රකාරව, සේවක පාරිතෝෂික වගකීම ගණනය කිරීමේදී පුරෝකථනය කළ ඒකක බැර ක්‍රමය (projected unit credit method) යොදාගත යුතු වුවද, සංස්ථාව විසින් එම ක්‍රමය යොදා ගත්තේද යන්න පිළිබඳව ගිණුම්කරණ ප්‍රතිපත්තිවල හෙළිදරව් කර නොතිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

2014 වර්ෂයේදී වෛද්‍ය සැපයුම් අංශයට අලෙවි කර තිබුණු Folic Acid Tablets තොගයක් තත්ත්වයෙන් අසමත්වී තිබූ බව වෛද්‍ය සැපයීම් අංශයේ අධ්‍යක්ෂගේ 2017 ඔක්තෝබර් 02 දිනැති අංක MSD/SB11/SPMC/2017/QF දරන ලිපියෙන් දක්වා තිබුණද ඒ වෙනුවෙන් එම අංශයට ගෙවිය යුතු රු.1,609,965ක් ගිණුම් ගත කර නොතිබුණි.

**2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

සැපයුම්කරුවන් 03 දෙනෙකු වෙත මුදල් ගෙවීමේදී රඳවා ගෙන තිබුණු රු.429,955 ක් වර්ෂ 2 කට වඩා වැඩි කාලයක සිට ආපසු ගෙවීමට හෝ ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා පහත පරිදි විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 2017 දෙසැම්බර් 31 දින වන විට භාවිතයට ගත නොහැකි මුළු පිරිවැය එකතුව රු.17,360,465 ක් වූ අමුද්‍රව්‍ය තොග, නිමිද්‍රව්‍ය තොග හා ඇසුරුම් ද්‍රව්‍ය තොග මෙන්ම මුළු පිරිවැය රු.56,788,918 ක් හා පොත් අගය ශූන්‍ය වූ වත්කම් ඒකක 395ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2009 මාර්තු 09 දිනැති හා අංක ඩීඑම්එස්/ඊ4/10/4/090/2 දරන සෞඛ්‍ය ලේකම් ඇමතු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය ඡේද අංක 02-01 | (i) අදාල ලිපියට පටහැනි ලෙස සංස්ථාවේ විධායක හා විධායක නොවන නිලධාරීන් වෙත දුර ප්‍රමාණය නොසළකා 2009 වර්ෂයේ සිට මාසිකව පිළිවෙලින් රු.4,700ක හා රු.3,000 ක ප්‍රවාහන දීමනාවක් ගෙවා තිබුණි. 2016 වර්ෂයේ සිට අධ්‍යක්ෂක මණ්ඩල තීරණයකට අනුව එම මාසික දීමනාව පිළිවෙලින් රු.5,450 ක් හා රු.3,750 ක් දක්වා වැඩිකර මුදල් ගෙවා තිබුණි. |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ii) ලිපිය ප්‍රකාරව කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත මාසික නිෂ්පාදන දිරි දීමනාවක් ලෙස රු.4,000 ක් පමණක් ගෙවිය හැකි වුවත්, ඊට අනුකූල නොවන පරිදි 2011 ජූලි 01 දින සිට මාසිකව උපරිමය රු.12,000 කට යටත්ව සමස්ත කාර්ය මණ්ඩලය වෙත නිෂ්පාදන දිරි දීමනා ගෙවා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළදී වැඩියෙන් ගෙවා තිබුණු රු.17,154,670 ක්ද ඇතුළුව 2011 ජූලි සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළදී මුළු එකතුව රු.62,719,822ක් වැඩියෙන් ගෙවීම් කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.223,907,939 ක ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු.296,646,714 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභයේ රු.72,738,775 ක අඩුවීමක් දක්නට ලැබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී බදු වියදම රු.46,443,591 කින් අඩු වුවද දළ ලාභය රු.38,323,331 කින් අඩුවීම හා පරිපාලන වියදම් සහ විකුණුම් හා බෙදා හැරීමේ වියදම් පිළිවෙළින් රු.38,790,533 කින් හා රු.19,250,140 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයෙහි ඉහත අඩුවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී, 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අඛණ්ඩ ශුද්ධ ලාභයක් පෙන්නුම් කළද එය වාර්ෂිකව උච්චාවචනයවී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැලපීමෙන් පසු සංස්ථාවේ 2013 වර්ෂයේදී රු.662,577,528 ක්වූ දායකත්වය 2017 වර්ෂයේදී රු.838,962,510 ක් දක්වා සියයට 06 සිට සියයට 10 අතර උච්ඡාවචනයන් සහිතව වර්ධනයවී තිබුණු අතර 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ දායකත්වය සියයට 4 කින් අඩුවී තිබුණි.

6

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දළ ලාභ අනුපාතය හා ශුද්ධ ලාභ අනුපාතය පිළිවෙලින් සියයට 6.4 කින් හා සියයට 8 කින් අඩුවී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ණයගැති පිරිවැටුම් අනුපාතය වාර 14.1 කින් අඩුවී තිබුණු අතර ණය ආපසු අයකර ගැනීමේ කාලය දින 15 කින් වැඩිවී තිබුණි. ණයහිමි පිරිවැටුම් අනුපාතය වාර 6.8 කින් වැඩිවී තිබුණු අතර ණයහිමි පිරිවැටුම් කාලය දින 5 කින් අඩුවී තිබුණි. ඒ පිළිබඳ අවධානය යොමු කරමින් සංස්ථාවේ මෙහෙයුම් කටයුතු කාර්යක්ෂම කර ගත යුතු වන බව නිරීක්ෂණය විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් අලෙවි දෙපාර්තමේන්තුවට අදාළ කාර්යයන් 05ක්ද, නිෂ්පාදන දෙපාර්තමේන්තුවට අදාළ කාර්යයක්ද, තත්ත්ව පාලන දෙපාර්තමේන්තුවට අදාළ කාර්යයන් 06ක්ද, මානව සම්පත් දෙපාර්තමේන්තුවට අදාළ කාර්යයන් 02ක්ද, වට්ටෝරු හා සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාළ කාර්යයන් 03ක්ද, ඉංජිනේරු දෙපාර්තමේන්තුවට අදාළ කාර්යයන් 02 ක්ද හා තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවට අදාළ කාර්යයක්ද ඉටු කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පෞද්ගලික ආයතන වෙතින් ඖෂධ නිෂ්පාදනය කරවා ගෙන මිලදී ගැනීම හා නැවත විකිණීම සංස්ථාවේ ප්‍රධාන අරමුණු අතරට නොගැනෙන අරමුණක් වුවද, විධිමත් පරිදි සංස්ථාවේ පනතේ සඳහන් අරමුණු සංශෝධනයකින් තොරව හා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව ඖෂධ නිෂ්පාදනය කර සංස්ථාව වෙත සැපයීම සඳහා

(iv) දෙවන අත්සන්කරු ලෙස කටයුතු කරන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (තත්ත්ව පාලන) වෙත පවරා තිබුණු අධිකාරී බලයට අනුව, ඔහුට අනුමැතිය දිය හැකි උපරිම සීමාව රු.500,000 ක් වුවත් එම සීමාව ඉක්මවා යථෝක්ත ගෙවීම සඳහා අනුමැතිය ලබාදී තිබුණි.

(v) මුළු අලාභය වූ රු.1,577,780 න් රු.331,000 ක් සැපයුම්කරුගේ කාර්යසාධන හා ලංසු සුරක්ෂණවලින් අයකරගෙන තිබුණු නමුත් 2018 ජූලි 20 දින වන විටත් ඉතිරි මුදල වූ රු.1,246,780 ක් අයකරගෙන නොතිබුණි.

(vi) සිදුවී ඇති අලාභයට වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ඈ) ස්ථාවර වත්කම් ලේඛනයෙහි ඇතුළත් පිරිවැය රු.391,250 ක් වූ අයිතම 08 ක ඌනතාවයක් 2017 දෙසැම්බර් 31 දිනට පැවති භෞතික භාණ්ඩ සමීක්ෂණයේදී අනාවරණයවී තිබුණු නමුත් ඌනතා ඇතිවීමට හේතු හඳුනාගෙන පිළියම් යෙදීමට හා මුදල් රෙගුලාසි 103 ප්‍රකාරව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ඉන්දියානු සමාගමකින් ඖෂධ ආනයනය කිරීම නිසා සමාලෝචිත වර්ෂයේදී ඖෂධ අයිතම 04 ක නිෂ්පාදන කටයුතු නවතා තිබීම හේතුවෙන් එම ඖෂධ අයිතම 04 නිෂ්පාදනය කිරීම වෙනුවෙන් ගෙන්වා තිබුණු පිරිවැය රු.1,789,731ක් වූ අමුද්‍රව්‍ය කිලෝග්‍රෑම් 204ක් වර්ෂයක කාලයක් තිස්සේ භාවිතයට ගැනීමෙන් තොරව පැවතුනි.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

--------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වෛද්‍ය සැපයුම් අංශය විසින් 2017 හා 2018 වර්ෂවලදී Domperidone Malate BP ඖෂධයෙන් ඒකක මිලියන 50 බැගින් ඇණවුම් කර තිබුණි. එම ඖෂධ නිෂ්පාදනය කිරීම සඳහා පිරිවැය රු.1,214,384 ක්වූ අමුද්‍රව්‍යය කිලෝග්‍රෑම් 100 ක් 2017 ඔක්තෝබර් මාසයේදී මිලදී ගෙන තිබුණු නමුත් 2018 ජුනි 04 දක්වා වූ මාස 08 ක කාලයක් තුළදී එම ඖෂධය නිෂ්පාදනය කර නොතිබුණි. 2018 මාර්තු මාසයට අදාළව විගණනය වෙත

ඉන්දියානු සමාගමක් සමඟ 2016 අප්‍රේල් 05 දින ගිවිසුමකට එළඹ තිබුණු අතර එම ගිවිසුම් කාලය 2017 අප්‍රේල් 04 දින අවසන් වූ හෙයින් 2017 දෙසැම්බර් 14 දින වසරක කාලයකට නව ගිවිසුමකට එළඹ තිබුණි.

(ආ) Theophylline Anhydrous USP 32 ඖෂධයෙන් අමුද්‍රව්‍යය ඒකක 1,000 ක් මිලදී ගැනීම සඳහා කරන ලද ලංසු කැඳවීමේදී අවම මිල ඉදිරිපත් කර තිබුණු ලංසුකරු වෙත 2017 මැයි 24 දින ඇණවුම ප්‍රදානය කර 2017 මැයි 25 දින Telegraphic Transfer ක්‍රමයට මුදල් ගෙවා තිබුණු නමුත් 2018 ජුනි 30 දින වන විටත් අමුද්‍රව්‍යය ඒකක 1,000 සංස්ථාව වෙත ලැබී නොතිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ප්‍රසම්පාදනයට අදාළ ගිවිසුම හා ලංසු ලියවිලිවල ඇතුළත් කොන්දේසි ප්‍රකාරව, ණයවර ලිපි මඟින් සැපයුම්කරුට ගෙවීම් සිදුකළ යුතු වුවද, ඊට පටහැනිව ප්‍රසම්පාදන කමිටු අනුමැතියකින් තොරව හා මුදල් රෙගුලාසි 237 (ආ) හි දැක්වෙන විධිවිධානවලට පටහැනිව අමුද්‍රව්‍යය ලැබීමට ප්‍රථම Telegraphic Transfer ක්‍රමයට ගෙවීම් සිදුකර තිබුණි.

(ii) මෙම ඇණවුම ප්‍රදානය කිරීමට පෙර 2016 ඔක්තෝබර් 27 දින වෙනත් සැපයුම්කරුවකුගෙන් මෙම අමුද්‍රව්‍යයෙන් කිලෝ ග්‍රෑම් 3,000 ක්ඇණවුම් කර තිබුණු බැවින් හා එම තොගය 2017 ජුනි මාසය වන විට සංස්ථාව වෙත ලැබීමට නියමිතව තිබුණු බැවින් තොග හිඟයක් ඇතිවීමේ ඉඩකඩක් නොතිබුණු නමුත් මෙම අමුද්‍රව්‍යයෙන් කිලෝ ග්‍රෑම් 1,000 ක් නැවත ඇණවුම් කිරීමටත්, Telegraphic Transfer ක්‍රමයට හදිසි ගෙවීම් සිදුකිරීමටත් හේතුව විගණනයට අනාවරණය නොකෙරුණි.

(iii) බදු ගණනය කිරීමක් හේතුවෙන් බැංකු ගිණුම් අංකය වෙනස්කළ බවත් එම නව ගිණුම් අංකයට මුදල් ගෙවන ලෙසත් දන්වා 2017 මැයි 25 දින කළමනාකරු (සැලසුම් සහ ප්‍රසම්පාදන) වෙත ලැබී තිබුණු ව්‍යාජ විද්‍යුත් තැපැල් පණිවුඩයක නිර්ව්‍යාජ බව තහවුරු කර ගැනීමකින් තොරව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මූල්‍ය) හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (තත්ත්ව පාලන)ගේ අත්සනින් යුතුව බැංකුව වෙත කරන ලද නියෝගයක් හේතුවෙන් ව්‍යාජ විද්‍යුත් තැපැල් පණිවුඩයේ සඳහන් සැබෑ සැපයුම්කරු සතු නොවූ බැංකු ගිණුමකට බැර වන ලෙස 2017 මැයි 25 දින රු.1,577,780 ක් ගෙවීම් කර තිබුණි.

ලබාදුන් නිෂ්පාදන සැලැස්ම තුළද එම ඖෂධය නිෂ්පාදනය කිරීමට සැලසුම් කර නොතිබුණි. කෙසේ වුවද එම ඖෂධය නිෂ්පාදනය කිරීම වෙනුවට මුළු ඇණවුමම ඉන්දියාවේ Till Healthcare (Pvt) Ltd ආයතනයෙන් ගෙන්වන ලද ඖෂධ වලින් සම්පූර්ණ කර තිබුණි.

(ආ) 2017 අගෝස්තු මාසය වන විට Microcrystalline Cellulose – 200XML අමුද්‍රව්‍යයේ ඉතිරි තොගය කිලෝග්‍රෑම් 406 ක් වූ අතර එදිනට එම තොගය කල් ඉකුත්වී තිබුණි. එම අමුද්‍රව්‍ය යොදා නිෂ්පාදනය කරන ඖෂධය 2017 අගෝස්තු වලින් පසුව නිෂ්පාදනය කර නොතිබුණු අතර 2018 ජනවාරි, පෙබරවාරි සහ ජුනි මාසවලදී පිළිවෙලින් කිලෝග්‍රෑම් 3,000 ක්, කිලෝග්‍රෑම් 2,000 ක් සහ කිලෝග්‍රෑම් 3,000 ක් බැගින් මුළු පිරිවැය රු.7,943,351 ක්වූ අමුද්‍රව්‍ය තොග මිලදී ගෙන තිබුණි. කෙසේ වුවද 2018 ජුනි 18 දින වන විටත් එම අමුද්‍රව්‍ය නිෂ්පාදන කටයුතු සඳහා යොදාගෙන නොතිබුණි.

(ඇ) වෛද්‍ය සැපයුම් අංශය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඇණවුම් කර තිබුණු ඖෂධවලින් විකුණුම් මිල රු.70,113,783 ක්වූ ඖෂධ වර්ග 08 ක ඒකක මිලියන 39.174 ක් සමාලෝචිත වර්ෂය තුළදී සැපයීමට සංස්ථාව අපොහොසත්වී තිබුණි.

**4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

සමාලෝචිත වර්ෂය තුළදී රු.595,000 ක් වැය කර වෛද්‍යවරුන් වෙනුවෙන් දින 02 ක් සඳහා රාත්‍රී ආහාර සපයා තිබුණු නමුත් රාත්‍රී ආහාර ලබාදුන් වෛද්‍යවරුන් පිළිබඳව හෝ රාත්‍රී ආහාර ලබාදීමේ අවශ්‍යතාවය පිළිබඳ විස්තර ඉදිරිපත් නොකෙරුණි.

**4.5 හඳුනාගන්නා ලද පාඩු**

2017 දෙසැම්බර් 31 දින වන විට රු.2,438,354 ක්වූ අමුද්‍රව්‍ය තොග අයිතම 05ක් කල්ඉකුත්වීමෙන් සිදුවී තිබුණු අලාභය පිළිබඳව විධිමත් පරීක්ෂණයක් සිදුකර අලාභයට වගකිව යුතු පාර්ශවයන් හඳුනාගැනීමටත් විධිමත් පරිදි අපහරණය කිරීමටත් හා අදාළ තොග පොත්වලින් ඉවත් කිරීමටත් කටයුතු කර නොතිබුණි.

**4.6 කාර්ය මණ්ඩල පරිපාලනය**

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විගණිත දිනය වූ 2018 ජුනි 05 දින වන විට වර්ෂ 07 ක සිට පුරප්පාඩුවී පවතින නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි) තනතුර පිරවීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ආ) අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා තනතුරු 05 ක් සඳහා නිලධාරීන් 05 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණි.

(ඇ) අනුමත කාර්ය මණ්ඩලයේ නොපවතින වට්ටෝරු හා පර්යේෂණ විධායක, මාධ්‍ය සම්බන්ධීකරණ නිලධාරී, වැඩසටහන් සම්බන්ධීකරණ නිලධාරී, ව්‍යාපෘති සම්බන්ධීකාරක යන තනතුරු සඳහා 2016 වර්ෂය තුළදී එක් අයෙකු හා 2017 වර්ෂය තුළදී 04 දෙනෙකු වශයෙන් කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 05 දෙනෙකු බඳවාගෙන තිබුණු අතර එම තනතුරු සඳහා අනුමත බඳවා ගැනීමේ පරිපාටියක් නොතිබුණු බැවින් තනතුරු සඳහා ප්‍රමාණවත් සුදුසුකම් සහිත නිලධාරීන් බඳවාගෙන තිබුණේද යන බව පරීක්ෂා කළ නොහැකි විය.

(ඈ) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් ) තනතුරෙහි පුරප්පාඩු පිරවීම සඳහා 2017 ජූලි 02 දින පුවත්පත් දැන්වීමක් පළ කර ලැබුන අයදුම්පත් අතුරින් අයදුම්කරුවන් තිදෙනෙකු වෙනුවෙන් සම්මුඛ පරීක්ෂණය පැවැත් වූ බව වාර්තා කර තිබුණද සම්මුඛ පරීක්ෂණ මණ්ඩල වාර්තාව සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සාමාජිකයින් විසින් සහතික කර නොතිබුණි. බඳවා ගැනීමේ පරිපාටියේ ඇතුළත් වයස් සීමාව ඉක්මවූ අයදුම්කරුවකු සංස්ථාවේ සභාපතිගේ උපදෙස් මත හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත 2017 සැප්තැම්බර් 20 දින සිට මාස 06 ක කාලයකට කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණු අතර 2018 ජුනි 05 දින වන විටත් මාස 08 ක කාලයක සිට එම තනතුර ස්ථිරව පිරවීමට කටයුතු නොකර එම නිලධාරියාගේ සේවය දීර්ඝ කර තිබුණි. ස්ථිර තනතුරක් වන මෙම තනතුරට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට හේතු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඉ) සංස්ථාවේ සුළු සේවකයින් බඳවාගැනීමේ පරිපාටිය ප්‍රකාරව පුවත්පත් දැන්වීම් පළකිරීමෙන් තනතුරු පුරප්පාඩු ප්‍රසිද්ධ කර සම්මුඛ පරීක්ෂණ පවත්වා සුදුසුකම් සඳහා ලකුණු දීමෙන් තෝරාගත් පුද්ගලයින් බඳවා ගත යුතු වුවත්, ඊට අනුකූල නොවන පරිදි සමාලෝචිත වර්ෂය තුළදී රියදුරු, ඖෂධ නිමාකිරීමේ සහායක, කම්කරු යන තනතුරුවලට අදාළව ස්ථිර පදනමින් 19 දෙනෙකු හා කොන්ත්‍රාත් පදනමින් එක් අයෙකු වශයෙන් සුළු සේවකයින් 20 දෙනෙකු බඳවාගෙන තිබුණි. තවද ඉකුත් වර්ෂවලදී කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණු කම්කරුවකු හා රියදුරෙකු සමාලෝචිත වර්ෂය තුළදී බඳවා ගැනීමේ පරිපාටිය අනුගමනය නොකර එම තනතුරෙහි ස්ථිර කර තිබුණි.

(ඊ) සංස්ථාවේ විධායක නොවන සේවකයින් බඳවාගැනීමේ පරිපාටිය ප්‍රකාරව පුවත්පත් දැන්වීම් පළකිරීමෙන් තනතුරු පුරප්පාඩු ප්‍රසිද්ධ කර, ලිඛිත විභාගයක් හා සම්මුඛ පරීක්ෂණයක් පවත්වා සුදුසුකම් සඳහා ලකුණු දීමෙන් තොරව සමාලෝචිත වර්ෂය තුළදී කළමනාකරණ සහකාර හා ඖෂධ තාක්ෂණ ශිල්පී යන තනතුරුවලට නිලධාරීන් 09 දෙනෙකු ස්ථිර පදනම මත බඳවා ගෙන තිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

----------------------

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

--------------------------------------------

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර " 2030 න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණු නමුත් තිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ කාර්යභාරය සම්බන්ධව උනන්දුවක් දක්වන පාර්ශවයන් හඳුනාගෙන නොතිබුණි.

## 6. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 6.1 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

### 6.1.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මට අදාළව ප්‍රසම්පාදන කාල සටහන විධිමත්ව පිළියෙල කර නොතිබුණි.

(ආ) පොදු පරීක්ෂණ රසායනාගාරයක් සහ පුහුණු පාසලක් පිහිටුවීම අරමුණු කොට ගෙන සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 88ක් වැයකර, රජයේ බැංකුවක උකසට යටත්ව තිබුණු කළුතර දිස්ත්‍රික්කයේ බුලත්සිංහල ප්‍රදේශයේ මහල් හතරක ගොඩනැගිල්ලක් සහිත ඉඩම මිලදී ගෙන තිබුණු අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) පොදු පරීක්ෂණ රසායනාගාරයක් සහ පුහුණු පාසලක් පිහිටුවීමේ අරමුණ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ii) යථෝක්ත මිලදී ගැනීමට අදාළව මූල්‍ය හා ශක්‍යතා වාර්තාවක් පිළියෙල කිරීම සඳහා විශේෂ තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කළ යුතු බව අධ්‍යක්ෂක මණ්ඩලය තීරණය කර තිබුණද විශේෂ තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කිරීමට හෝ මූල්‍ය හා ශක්‍යතා වාර්තාවක් පිළියෙල කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(iii) මිල ගණන් කැඳවීම සඳහා පළකරන ලද පුවත්පත් දැන්වීමෙහි, මිලදී ගැනීමට අපේක්ෂිත දේපළ කළුතර දිස්ත්‍රික්කයේ බුලත්සිංහලට කිලෝ මීටර් 5 ක් ඇතුළත විය යුතුය යන්න ඇතුළත් කර තිබීම හේතුවෙන් සුදුසුකම්ලත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ප්‍රසම්පාදනයට සහභාගීවීම සඳහා සාධාරණ, සමාන හා උපරිම අවස්ථා ලබාදීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි. එමෙන්ම

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 5.3.1 මාර්ගෝපදේශය ප්‍රකාරව, සම්මත ලංසු කැඳවීමේ ලේඛන (Standard Bidding Documents) භාවිතා නොකිරීම සහ ඒ හේතුවෙන් ඉදිරිපත් කරන ලද ලංසු දෙක එකිනෙකට සැසඳිය නොහැකි වීම හා ඒ පිළිබඳව තාක්ෂණික ඇගයීම් හා ප්‍රසම්පාදනය කමිටු විසින් සලකා නොතිබුණි. තවද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.3 හා 6.3.6 මාර්ගෝපදේශයන් ප්‍රකාරව, පිළිවෙලින් ලංසු විවෘත කිරීමේ කමිටුවක් පත්කර නොතිබුණු අතර ලංසු විවෘත කිරීම පිළිබඳ කටයුතු නියමිත ආකෘති පත්‍රයක වාර්තා කර නොතිබුණි. උක්ත හේතූන් මත යථෝක්ත ප්‍රසම්පාදනය තරඟකාරීත්වයෙන් හා විනිවිදභාවයෙන් බැහැරව සිදුවී තිබුණු බව නිරීක්ෂණය විය.

(iv) යථෝක්ත මිලදී ගැනීම සිදු කිරීමට පෙර සිදුකළ යුතුයැයි තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලබාදී තිබුණු, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ නීති අංශයෙන් අදාළ දේපළ පිළිබඳ මතයක්/පැහැදිලි කර ගැනීමක් ලබාගැනීම, විකුණුම්කරු ලවා අදාළ පලාත් පාලන ආයතනයෙන් ගොඩනැගිල්ල සම්බන්ධයෙන් අනුකූලතා සහතිකයක් (Certificate Of Completion-COC) ලබාගැනීම, අදාළ බැංකු ශාඛාවෙන් ගොඩනැගිල්ල සහිත ඉඩමේ උකස්කරය සම්බන්ධයෙන් විස්තර ලබාගැනීම හා ගොඩනැගිල්ල සම්බන්ධයෙන් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් හෝ ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යංශයෙන් ව්‍යුහගත ඉංජිනේරු වාර්තාවක් (Structural report) ලබාගැනීම යනාදී වූ නිර්දේශයන් අනුගමනය නොකර දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් අවම ලංසුව ඉදිරිපත් කර තිබුණු ලංසුකරු ජයග්‍රාහී ලංසුකරු ලෙස තෝරාගෙන තිබුණි.

(v) ගොඩනැගිල්ල සහිත ඉඩම උකස්කර තිබුණු රජයේ බැංකු ශාඛාව සමඟ සාකච්ඡා කලේ නම් මෙම උකස්කරය වෙනුවෙන් බැංකුව විසින් ඉදිරිපත් කර තිබුණු අවසන් සමථයේ වටිනාකම රු.මිලියන 66 ක් වූ බවද මෙම ඉඩම අදාළ බැංකුව විසින් වෙන්දේසි කිරීමට තීරණය කර තිබුණු බවද දැනගැනීමට හැකිව තිබුණි. නමුත් එසේ නොකිරීමෙන් මිලදී ගැනීම සඳහා වැයකරන ලද රු.මිලියන 88 කට වඩා අඩුවෙන් එම දේපළ මිලදී ගැනීමට විකුණුම්කරු සමඟ සාකච්ඡා කිරීමට තිබුණු අවස්ථාව මගහැරී තිබුණි.

(vi) මිලදී ගැනීමට අදහස් කරනු ලබන ගොඩනැගිල්ල රසායනාගාරයක් සහ පුහුණු පාසලක් ගොඩනැගීම සඳහා සුදුසු ද යන්න පිළිබඳ පරීක්ෂා කිරීම සඳහා විකුණුම්කරු විසින් ව්‍යුහගත ඉංජිනේරුවරයෙකුගෙන් ලබා ගෙන සංස්ථාව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාව අනුවද, සංස්ථාව විසින් ලබා ගත් ව්‍යුහගත ඉංජිනේරු වාර්තාව (Structural Report) අනුවද හා විගණනය විසින් භෞතිකව සිදු කරන ලද පරීක්ෂාව අනුවද මෙම ගොඩනැගිල්ලේ roof slab ප්‍රදේශයේ ජලය කාන්දු වීම සඳහා ක්‍රම ස්ථාපිතව නොතිබුණු අතර එම ප්‍රදේශ ඍජුවම කාලගුණයට නිරාවරණය වී පැවතීම නිසා අධික උෂ්ණත්වය හේතුවෙන් පහළ මහල්වල බිත්ති පුපුරා තිබුණි. තෙවන මහලේ බිත්තිවල ඉරිතැලීම් පැවති අතර තරප්පු පෙළේ අත්වැටක් ඉදිකර නොතිබුණි. මෙම අඩුපාඩු සැකසීමටත් පුහුණු පාසලට අවශ්‍ය ලෙස ගොඩනැගිල්ල නවීකරණය කිරීමටත් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් 2018 මැයි 08 දින රු.33,460,608 කට කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණි.

(vii) විකුණුම්කරු විසින් මෙම ගොඩනැගිල්ල ඉදිකර අවසන් වූ පසුව අදාළ පලාත් පාලන ආයතනයෙන් අනුකූලතා සහතිකය (Certificate Of Completion-COC) ලබාගෙන නොතිබුණි.

(ඇ) සංස්ථාව විසින් මිල සැදහුම් ක්‍රමය අනුගමනය කරමින් පිරිවැය රු.1,680,550ක් වූ ලැප්ටොප් පරිගණක 10ක්, පිරිවැය රු.307,812 ක් වූ වායුසමීකරණ යන්ත්‍ර 2ක්, පිරිවැය රු.5,907,895 ක් වූ ඉලෙක්ට්‍රික් Forklift යන්ත්‍රයක්, පිරිවැයරු.850,000ක් වූ සේවා ටැංකි 02 ක් හා පිරිවැය රු.559,417 ක් වූ Analytical Balance උපකරණයක් මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.1, 6.3.3 හා 6.3.6 යන මාර්ගෝපදේශ ප්‍රකාරව පිළිවෙලින්, මිල සැදහුම් ක්‍රමයට භාණ්ඩ මිලදී ගැනීමේදී භාවිතා කළ යුතු අංක NPA/SBD/GOODS/01 දරන සම්මත ලංසු කැඳවීමේ ලේඛනය භාවිතා කිරීමට, ලංසු විවෘත කිරීමේ කමිටුවක් පත් කිරීමට, ලංසු විවෘත කිරීම පිළිබඳ කටයුතු නියමිත ආකෘති පත්‍රයක වාර්තා කිරීමට කටයුතු කර නොතිබුණි.

15

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව, රු.500,000 ඉක්මවූ ඉහත සඳහන් භාණ්ඩ හෝ සේවා කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් විධිමත් ගිවිසුමකට එළඹී නොතිබුණි.

(iii) ඉලෙක්ට්‍රික් Forklift යන්ත්‍රය ප්‍රසම්පාදනයේදී ලංසුකරුවන් හය දෙනෙකුගෙන් කරන ලද ලංසු කැඳවීමට අනුව ලංසුකරුවන් දෙදෙනෙකු පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබූ අතර ඉදිරිපත් කරන ලද මිල ගණන් අධික වීම හේතුවෙන් එම ලංසු ප්‍රතික්ෂේප කර තිබුණි. ලංසු නැවත කැඳවීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.12.3 මාර්ගෝපදේශය ප්‍රකාරව, තරඟකාරී බවේ අඩුවක් දක්නට ඇත්නම් සහ ලද සියලුම ලංසු ප්‍රතික්ෂේප වී ඇත්නම්, පුළුල් ප්‍රචාරයක් ලබාදිය යුතු නමුත් පුළුල් ප්‍රචාරයක් ලබාදීම වෙනුවට එම ලංසුකරුවන්ගෙන්ම නැවතත් මිල ගණන් කැඳවීමට තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කර දෙවනවර මිලගණන් කැඳවීමට ප්‍රතිචාර දැක්වූ එකම සැපයුම්කරු වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි.පුළුල් ප්‍රචාරයක් ලබා දීමටත්, නව සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවීමටත් කටයුතු නොකිරීම හේතුවෙන් තරඟකාරීත්වය සීමා වී තිබුණි.

(ඇ) Fluid Bed Granulator Dryer යන්ත්‍රය සඳහා පිරිවැය රු.1,258,211ක් වූ අමතර කොටස් සහ New Capsule Filling යන්ත්‍රය සඳහා පිරිවැය රු.2,560,495ක් වූ උපාංග එම යන්ත්‍රවල නිෂ්පාදන ආයතනයෙන් සෘජු මිලදී ගැනීම් ක්‍රමය යටතේ ප්‍රසම්පාදනය කර තිබුණද සැපයුම්කරුවන් සමඟ ගිවිසුමකට එළඹී නොතිබුණු අතර බැංකු සුරක්ෂණයන්ද ලබා නොගෙන Telegraphic Transfer යටතේ මුළු මුදලම සැපයුම්කරුවන්ට ගෙවා තිබුණි. ගෙවීම් සිදුකළ දින සිට විගණිත දිනය වූ 2018 ජුනි 08 දින වන විට පිළිවෙලින් මාස 06ක් හා මාස 05ක් ගත වී තිබුණු නමුත් සංස්ථාව වෙත භාණ්ඩ සපයා නොතිබුණු අතර කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ නොතිබීම හේතුවෙන් භාණ්ඩ නොසැපයීම හෝ ප්‍රමාදවීමෙන් ඇතිවන අලාභයන්ට කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමට නොහැකි වී තිබුණි.

### 6.1.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.242,268,015 ක් වූ ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2015 අගෝස්තු 27 දින උපදේශක ආයතනයක් තෝරාගෙන තිබුණු අතර 2017 සැප්තැම්බර් 01 දින ගොඩනැගිල්ලේ Pilling Works සඳහා රු.22,755,500 කට කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

16

(i) මෙම ඉදිකිරීම් කටයුතු සඳහා තෝරාගත් උපදේශක ආයතනයේ සේවාවන් අසතුටුදායක වීම හේතුවෙන් එම උපදේශක ආයතනය සමඟ පැවති ගිවිසුම අවලංගු කිරීමට 2018 අප්‍රේල් 06 දින අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි. උපදේශක ආයතනය සමඟ ඇතිකරගත් ගිවිසුම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) ගොඩනැගිල්ලේ Pilling Works සඳහා කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.3 මාර්ගෝපදේශය ප්‍රකාරව, ලංසු විවෘත කිරීමේ කමිටුවක් පත් කර නොතිබුණු අතර එම මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 මාර්ගෝපදේශය ප්‍රකාරව, ලංසු විවෘත කිරීම පිළිබඳ කටයුතු නියමිත ආකෘති පත්‍රයක වාර්තා කර නොතිබුණි. තවද, එම මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(අ) මාර්ගෝපදේශය ප්‍රකාරව, මෙම වැඩ කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් විධිමත් ගිවිසුමකට එළඹී නොතිබුණි.

(iii) 2017 සැප්තැම්බර් 01 දිනැති කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ලිපිය අනුව ගොඩනැගිල්ලේ Pilling Works 2018 ජනවාරි 20 දින අවසන් කළ යුතු වුවත් 2018 මැයි 15 දින වන විටද වැඩ අවසන් කර නොතිබුණි.

### 6.1.3 ප්‍රමාද වූ ව්‍යාපෘති

--------------------

මුළු කොන්ත්‍රාත් වටිනාකම රු.144,805,967 ක්වූ ගොඩනැගිලි 02ක ඉදිකිරීම් කටයුතු කොන්ත්‍රාත් ප්‍රදාන ලිපිය ප්‍රකාරව පිළිවෙලින් 2017 මාර්තු 06 දින හා 2017 අගෝස්තු 02 දින අවසන් කළ යුතු වුවත් 2018 මැයි 20 දින වන විටද වැඩ අවසන් කර නොතිබුණි.

## 6.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම

-----------------------------

2016 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව 2018 ජුනි 29 වන දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 6.3 නොවිසඳී ඇති විගණන ඡේද

------------------------------

ඉකුත් වර්ෂයේදී ආනයනය කරවා ගෙන තිබුණු පිරිවැය රු.827,873 ක් වූ “Cloxacillin Caps BP 500 mg” අමුද්‍රව්‍ය කිලෝග්‍රෑම් 210 ක තොගය තුළ කෙඳි (Fiber) කොටසක් අන්තර්ගතවී තිබුණු බව 2016 ජුනි 07 දින අනාවරණයවී තිබීම හේතුවෙන් එම තොගය භාවිතයට ගත නොහැකිවී තිබුණි. නමුත් සංස්ථාව විසින් 2017 පෙබරවාරි 07 දින වන විටත් සැපයුම්කරුගෙන් අලාභය ප්‍රතිපූර්ණය කරන ලෙස ඉල්ලා නොතිබුණු අතර අලාභය හඳුනාගෙන මාස 08 ක කාලයකට පසු

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

දේශීය නියෝජිතගෙන් අලාභය ප්‍රතිපූර්ණය කරන ලෙස කර තිබුණු ඉල්ලීම දේශීය නියෝජිත විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. අදාළ සැපයුම්කාර සමාගමේ ව්‍යාපාර කටයුතු නවතා ඇති බවද දේශීය නියෝජිත විසින් දන්වා තිබුණි. අදාළ සැපයුම්කරු සමඟ අලාභය අයකර ගැනීම සඳහා මූලික එකඟතාවයකට පැමිණ ඇති බව 2017 ජූනි 20 දින සංස්ථාවේ සභාපතිවරයා විසින් විගණනය වෙත අදහස් දක්වා තිබුණද 2018 ජූලි 13 දින වන විටත් එපරිදි කටයුතු සිදුවී නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ජංගම නොවන වත්කම් | භාවිතයට ගත නොහැකි වත්කම් අපහරණය කිරීමට කටයුතු නොකිරීම. |
| (ආ) තොග පාලනය | ප්‍රශස්ථ තොග මට්ටම් පවත්වා නොගැනීම. |
| (ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය | භාණ්ඩාගාර අනුමැතිය රහිතව බඳවා ගැනීම් සිදුකිරීම හා නිසි පරිදි පැමිණීම හා පිටවීම සටහන් නොකිරීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති.

18

# 2017 විගණකාධිපතිවරයාගේ වාර්තාව පිළිබඳ සභාපතිතුමාගේ අදහස්

**2. මූල්‍ය ප්‍රකාශණ**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

**2.2 මූල්‍ය ප්‍රකාශණ පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත**

**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1**

උපයන විට ගෙවීම් බදු ගිණුමේ හර ශේෂය වෙළඳ හා වෙනත් ගෙවීම් යටතේ මූල්‍ය ප්‍රකාශන වල පෙන්වා ඇති නමුත් එය ඉදිරි මූල්‍ය ප්‍රකාශන වල නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16**

ජංගම නොවන වත්කම් අධීක්ෂණය සඳහා සංස්ථා සාමාන්‍යාධිකාරිතුමියගේ මෙහෙයවීමෙන් වත්කම් සමීක්ෂණ කමිටුවක් මෙන්ම (Survey Board) වත්කම් තක්සේරු කිරිමේ කමිටුවක් (Valuation Board) පත් කර ඇති අතර එම කමිටු හරහා හානි වු හා භාවිතයට නුසුදුසු ජංගම නොවන වත්කම් සඳහා මෙන්ම ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීම කඩිනම් කර තිබේ.

**(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24**

ඉදිරි මූල්‍ය ප්‍රකාශන වලදි සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන වල ප්‍රධාන කළමණාකරණ කාර්යය මණ්ඩලය සඳහා ගෙවීම් (Key Management Personnel Compensation) පිළිබඳ තොරතුරු හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ.

**2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

(අ) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදා ගන්නා මිනුම් ක්‍රමයක් පිළිබඳ නිවැරදි සඳහනක් ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ ඉදිරි මූල්‍ය ප්‍රකාශන සඳහා සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) සේවක පාරිතෝෂික වගකීම වර්තමාන වටිනාකමට ගැලපීමේදී පූරෝකථනය කළ ඒකක බැර ක්‍රමය (Projected Unit Credit Actuarial Cost Method) සංස්ථාව විසින් යොදා ගනු ලබන අතර ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වල මින් ඉදිරියට හෙළිදරව්වක් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

සාමාන්‍ය ක්‍රමවේදය වන්නේ තොගයක් තත්වයෙන් අසමත් වුවහොත් අදාල තොගය සංස්ථාවට ආපසු එවීමයි. මේ දක්වා අදාල තොගයන් ආපසුආයතනයට ලැබී නොමැත. එබැවින් විගණණ වාර්තාවේ සඳහන් පරිදි ගිණුම්ගත කිරීමට නොහැක.

**2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

විගණණ වාර්තාවේ සඳහන් පරිදි සැපයුම්කරුවන් තුන් දෙනෙකු වෙත මුදල් ගෙවීමේදී රඳවා ගෙන තිබුණු රු. 429,955 ක් 2018 වර්ෂයේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ඇත.

**2.4 නීති රීති රෙගුලාසි හා කළමණාකරන තීරණ වලට අනුකුල නොවීම**

(අ) විගණණ වාර්තාවේ සඳහන් පරිදි තොග සහ වත්කම් නිසි පරිදි අපහරණය කිරීමට සාමාන්‍යාධිකාරිණි මගින් පත් කරනු ලබන කමිටු මඟින් අපහරණය කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) (i) රජයේ රෝහල් වල අත්‍යවශ්‍ය ඖෂධ අවශ්‍යතාවය සපුරාලීම සඳහා ආයතනය තුළ උදෑසන 6.00 සිට රාත්‍රී 10.00 දක්වා සේවා මුර ක්‍රමය ක්‍රියාත්මක කරනු ලබන අතර ආයතනය පොදු ප්‍රවාහන පහසුකම් නොමැති ස්ථානයක පිහිටා ඇත. මේ නිසා අදාල සේවකයන් අදාල සේවා මුර වලට නිසි වේලාවට ගෙන්වා ගැනීම අත්‍යවශ්‍ය කරුණක් වන සේම මෙම තත්වය තුල ආයතනයට ආසන්නව පදිංචිව සිටින සේවකයන් ඉතාම වැදගත් වේ මෙවැනි තත්වයන් සලකා බලා සේවකයන්ගේ පදිංචි ස්ථාන වල දුර ප්‍රමාණයන්ට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇතිව ප්‍රවාහන දීමනාව ගෙවීම් කරනු ලැබේ.

(ii) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් 2009/03/09 නිකුත් කල ලිපිය (DMS/E4/10/490/2) අනුව නිෂ්පාදන දිරි දීමනාවෙහි පවතින සාධක (Norms) වෙනස් විය යුතුව ඇතැයි සඳහන් කර ඇත. ඒ අනුව කමිටුවක් මගින් පැවති සාධක (Norms) අධ්‍යනය කල අතර කමිටුව මගින් නිෂ්පාදනය දිරි ගැන්වීමේ අරමුණින් සහ කාලීන අවශ්‍යතාවය මත නිෂ්පාදන දිරි දීමනාව පිළිබඳව යෝජනාවක් අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙත යොමු කරන ලදී. ඒ අනුව අධ්‍යක්‍ෂ මණ්ඩලය එම යෝජනාව අනුමත කල අතර එම අනුමැතියට අනුව ගෙවීම කරන ලදී.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

මූල්‍ය ප්‍රතිඵල සම්බන්ධයෙන් දක්වා ඇති සියළු කරුණු සැලකිල්ලට ගන්නා ලදී.

**3.2 විග්‍රහත්මක මූල්‍ය සමාලෝචනය**

(අ) සැලකිල්ලට ගන්නා ලදී.
(ආ) සැලකිල්ලට ගන්නා ලදී.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යය සාධනය**

**4.1.1 ක්‍රියාකාරීත්ව සමාලෝචනය**

ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රගති වාර්තාව පිළියෙල කර 2017 වසරේ සිට ඉදිරිපත් කර ඇත.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

(අ) 2018.05.09 වන දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍ය ගරු රාජිත සේනාරත්න මහතා විසින් යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට අනුව රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ ප්‍රධාන අරමුණු වල සඳහන් පරිදි ගැසට් නිවේදනයක් මගින් සංශෝධනය කිරීමට අනුමැතිය ලබා දෙන ලදී.

2017 වසර අගභාගය වනතුරුත් ජයිකා ආයතනය මගින් සිදුකරන නිෂ්පාදනාගාරයේ අළුත් වැඩියා කටයුතු අවසන් වී නොමැතිවූ නිසා 2017 දෙසැම්බර් මාසයේදී නැවතත් ඉන්දියානු සමාගම සමග තවත් වසරක කාලයකට ගිවිසුමකට එළඹෙන ලදී.

(ආ) (i,ii සහ iii)
මේ අවස්ථාව වන විට අපරාධ පරීක්‍ෂණ දෙපාර්තමේන්තුවේ (CID) උපදෙස් පරිදි, දේශිය නියෝජිතයාට එරෙහිව නීතිඥයාගේ (Lawyer) මාර්ගයෙන් Letter of Demand යවා ඇත. ඒ අනුව දේශිය නියෝජිතයාට මේ පිළිබඳව වගකීමෙන් තොර විය නොහැක.

(iv,v සහ vi)
මෙම සිදුවීම සම්බන්ධව අදල වගකිවයුතු නිළධාරීන් හඳුනා ගැනීමට විධිමත් පරීක්‍ෂණයක් සෞඛ්‍ය අමාත්‍යාංශයේ හදිසි වැටලීම් අංශය මඟින් සිදුකරගෙන යනු ලබන අතර වංචා විමර්ෂණ අංශයෙන් ද පරීක්‍ෂණයක් සිදුකරනු ලබයි.

(ඇ) 2018 වර්ෂයේදී එම ඌනතාවයන් ඇති නොවීමට කටයුතු කරනු ලැබේ.

(ඈ) මෙම කාලයේදී නිෂ්පාදනාගාරයේ අළුත්වැඩියා කටයුතු කරගෙන ගිය අතර එම අළුත්වැඩියා කටයුතු අවසන් කිරීමට සැලසුම්කර තිබූ කාලය අනපේක්ෂිත ලෙස ඉක්මවා යන ලදී. මේනිසා වෛද්‍ය සැපයුම් අංශයට ලබාදිය යුතු ඇණවුමට අදල කොටස් ප්‍රසම්පාදන පටිපාටිය භාවිතා කරමින් ආනයනය කරන ලදී. අමුද්‍රව්‍ය භාවිතා කිරීමට ඉදිරි සැලසුම් සකස් කරමින් පවතී.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

(අ) 2017 වර්ෂයේ අග භාගයේදී හා 2018 වර්ෂයේ මුල් භාගයේ JICA ව්‍යාපෘතිය සඳහා නිෂ්පාදන කටයුතු අත්හිටුවන ලදී. එම නිසා සැලසුම් කරන ලද සමහර අමුද්‍රව්‍ය අතිරික්ත ලෙස පැවතුනි. දැනට මෙම අමුද්‍රව්‍ය යොදගෙන

නිෂ්පාදනයන් කිරීමට සැලසුම්කර ඇත. තවද වෛද්‍ය සැපයුම් අංශයට ලබාදිය යුතු ඇනවුමට අදල ඖෂධ ප්‍රසම්පාදන පටිපාටිය භාවිතා කරමින් ආනයනය කරන ලදී.

(ආ) කිලෝ ග්‍රෑම් 406ක තොගය වර්ෂාවෙන් හානිවී ඇති අතර අදල වටිනාකම රක්‍ෂණ ආයතනයෙන් ලබාගැනීමට කටයුතු කර ඇත.

(ඇ)

| ඇණවුම්අංකය | ඖෂධය | ඉල්ලුම් කළ ප්‍රමාණය (මිලියන) | නොසැපයු ප්‍රමාණය මිලියන | මුදල(රු.) | නොසැපයීමට හේතුව |
|---|---|---|---|---|---|
| 2017/SPM/N/ R/P/00003 | Amoxicillin Capsules BP 250mg | 100 | 16.275 | 30,027,375.00 | අමුද්‍රව්‍ය නියමිත දිනට නොලැබීම නිසා ඇණවුම සම්පූර්ණ කිරීමට නොහැකි විය. |
| 2017/SPM/N/ R/P/00002 | Theophylline S.R Tablets 125mg. | 30 | 3.7360 | 3,747,208.00 | අමුද්‍රව්‍ය නොමැති වීම. |
| 2017/SPM/N/ R/P/00009 | Spironolactone Tablets USP 25mg | 36 | 1.8590 | 6,562,270.00 | අමුද්‍රව්‍ය නොමැති වීම. |
| 2017/SPM/A/ R/P/00012 | Gliclazide Tablets BP 40mg | 34 | 6.1845 | 5,733,031.50 | අමුද්‍රව්‍ය නොමැති වීම. |
| 2017/SPM/N/ R/P/00003 | Amoxicillin Tablets USP 125mg. | 8 | 1.4280 | 1,565,088.00 | ගබඩා පහසුකම් අවම වීම නිසා යන්ත්‍ර අඩු ධාරිතාවයකින් ක්‍රියා කිරීම |
| 2017/SPM/N/ C/P/00010 | Ascorbic Acid Tablets BP 100mg. | 20 | 3.0340 | 1,559,476.00 | අමුද්‍රව්‍ය නොමැති වීම. |
| 2017/SPM/N/ R/P/00005 | Tolbutamide Tablets BP 500mg | 5 | 1.2710 | 2,045,039.00 | අමුද්‍රව්‍ය නොමැති වීම. |
| 2017/SPM/N/ R/P/00007 | Ciprofloxacin Tablets USP 500mg | 10 | 5.3865 | 18,874,296.00 | අමුද්‍රව්‍ය නොමැති වීම. |
| | | | 39.174 | 70,113,783.50 | |

**4.4 මතභේදයට තුඩු දෙන ගනුදෙනු**

අධ්‍යක්‍ෂක මණ්ඩලයේ අනුමැතිය අනුව රු.595,000.00 ගෙවීම් කරන ලදී.

**4.5 හඳුනාගන්නා ලද පාඩු**

Chloroquine Phospate BP අමුද්‍රව්‍ය මැලේරියා රෝගය සඳහා සාදන ලද ඖෂධය සකස් කිරීමට අවශ්‍යවන අතර දැනට මැලේරියා රෝගය නොපවතින නිසා මෙම ඖෂධය නිෂ්පාදනය නොකරයි.

Microcrystaline cellulose BP 200Kg වර්ෂාවෙන් විනාශවී ඇති අතර අලාභය ලබාගැනීමට රක්‍ෂණ ආයතන සමඟ කටයුතු කරමින් පවතී.

Erythrosine Red Lake ----P 27

මෙය කල් ඉකුත්වී අමුද්‍රව්‍යයක් ලෙස පවතී. නිෂ්පාදනයේදී සිදුවන සාමාන්‍ය අපතේයාමක් ලෙස :ඊජ්ටැ* ලෙස සැලකේ.

Polysorbate BP

මෙම අමුද්‍රව්‍යය යොදා නිෂ්පාදනය කිරීමට බලාපොරොත්වූ වට්ටෝරුව අසමත්වීම හේතුවෙන් මෙය භාවිතා නොකරන ලදී.

Zinc stearate BP

නිෂ්පාදනාගාරුයේ නිෂ්පාදන කටයුතු අළුත්වැඩියා කිරීම හේතුවෙන් අනපේක්‍ෂිත ලෙස නිෂ්පාදන කටයුතු අඩාලවූ නිසා මෙම අමුද්‍රව්‍ය භාවිතා කිරීමට නොහැකි විය.

**4.6 කාර්ය මණ්ඩල පරිපාලනය**

(අ) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි) තනතුර පිරවීම සඳහා වරක් අයදුම්පත් කැඳවූ අතර ඒ සඳහා බඳවා ගැනීමට සුදුසු අයදුම්කරුවන් නොවීය.

(ආ) සහ (ඇ)

i **වට්ටෝරු හා පර්යේෂණ විධායක**

වට්ටෝරු සංවර්ධන හා පර්යේෂණ කාර්යයන් සඳහා උපාධිධාරීන් දෙදෙනෙකු අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත යොදවා ගන්නා ලදී. දැනට මොවුන් තාක්ෂණික සහකාරවරුන් වශයෙන් පුහුණුවෙමින් පවතී.

ii **SPMC මාධ්‍ය සම්බන්ධීකරණ නිලධාරී**

අප සංස්ථාවේ නව නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම උදෙසා ගරු ඇමතිතුමාගේ මාධ්‍ය සම්බන්ධීකරණ අංශයේ සහාය ලබා ගැනීමට අවශ්‍ය වූ බැවින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලදී.

iii **වැඩ සටහන් සම්බන්ධීකරණ නිලධාරී**

අළුතින් ආරම්භ කරන ලද පුහුණු පාසලෙහි වැඩ සටහන් සම්බන්ධීකරණ කටයුතු වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත බඳවා ගන්නා ලදී.

iv **ව්‍යාපෘති සම්බන්ධිකරන නිලධාරී**

JICA හා Joint Venture ව්‍යාපෘති සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත බඳවා ගන්නා ලදී.

(ඈ) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ වාර්තාව සම්පූර්ණ කිරීමට පියවර ගන්නා ලදි.

මෙම නිලධාරියා ශ්‍රී ලංකා නාවික හමුදාවේ හිටපු ජ්‍යෙෂ්ඨ නිලධාරීවරයෙකු වන අතර, යුධ සමයේ රටේ ඒකීය භාවය හා ස්වෛරීභාවය වෙනුවෙන් ඉතාමත් කැප වීමෙන් සේවය කරන ලද දැනුමෙන් සහ විනයෙන් පරිනත නිලධාරියෙකු වේ.

උපරිම විශ්‍රාමික වයස් සීමාව වන අවුරුදු 55 න් විශ්‍රාම ගන්වන ලද ත්‍රිවිධ හමුදාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සේවය, රජයේ ආයතනයන්හි උන්නතිය උදෙසා සුදුසු පරිදි සේවයේ යෙදවීමේ, සේනාධිනායක අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පය ක්‍රියාවට නංවමින්, මොහුගේ දැනුමෙන් සහ විනය පරිනත භාවයෙන් මෙම ආයතනයේ උන්නතිය සඳහා සහ ආයතනයේ නව ආදර්ශයන්ට අනුව බඳවා ගැනීමේ පටිපාටිය සකස් කිරීමේ ඉතා සංවේදී කාර්ය භාරය ඇතුළු බොහෝ වැදගත් කාර්යයන් මොහුගේ විෂය පථයට ඇතුලත් වේ. කරුණු මෙසේ හෙයින්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉහත කරුණ ගැන ගැඹුරින් අධ්‍යනය කර මොහුගේ සේවය තව දුරටත් මෙම ආයතනයට අවශ්‍ය බව තීරණය කර තවත් මාස 06 කින් දීර්ඝ කිරීමට අනුමැතිය ලබා දෙන ලදී.

**5.0 තිරසාර සංවර්ධනය**

**5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කරගැනීම**

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය අනුව අප ආයතනය විසින් ඉටුකළ යුතු කාර්යයභාරය සම්බන්ධයෙන් උනන්දුවක් පාර්ශවයන් හඳුනා ගනු ලැබේ.

**6.0 ශිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**6.1.1 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

(අ) අමාත්‍යංශය විසින් සපයා තිබූ ආකෘති පත්‍රයට අනුව අදල ප්‍රසම්පාදන සැලසුම සකස්කර යවන ලදී. ඒ සමගම කාර්තු වශයෙන් කාල සටහන ද සපයා තිබුණි.

(ආ)

(i) ඖෂධ නිෂ්පාදනය සම්බන්ධව මානව සම්පත් පුහුණු කිරීමේ පාසලක අවශ්‍යතාවය 2017-2021 වසර සඳහා සංයුක්ත සැලැස්මේ (Corporate Plan) පිටු අංක 32 (Corporate Social Responsibility - CSR) යටතේ සඳහන් කර ඇත.

කැබිනට් අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව ශ්‍රී ලංකාවේ ඖෂධ නිෂ්පාදනය පුළුල් කිරීම පෙරදැරි කරගෙන කර්මාන්තශාලා ඇති කිරීම. 2017-2021 වසර සඳහා සංයුක්ත සැලැස්මේ (Corporate Plan) පිටු අංක 18 හි Major Goal යටතේ increase product portfolio through joint ventures යටතේ සඳහන් කර ඇත.

තවදුරටත් Corporate Plan - SWOT Analysis ට අනුව පිටු අංක 19 හි Strength යටතේ new state of the art laboratory and pharma training school පොදු පරීක්‍ෂණ රසායනාගාරයක් ආරම්භ කිරීමේ අවශ්‍යතාවය පැන නැගුනි.

ඖෂධ නිෂ්පාදනය කිරීමේ පුහුණු පාසලක් ආරම්භ කිරීමේ අවශ්‍යතාවය 2016 අග භාගයේදී පැන නැගුනු අතර ඒ සඳහා සිසුන් බඳවා ගැනීමේ දැන්වීමක් 2016-12-04 දින Daily News පුවත් පතේ පළ කරන ලදී. මේ සඳහා පළමු පාඨමාලාව 2017 ජනවාරි 25 දින සිසුන් 24 කින් මාසික කුලී පදනම යටතේ රත්මලාන වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ ආරම්භ කරන ලද අතර, මේ දක්වා එක පාඨමාලවක් අවසන් කර දෙවන පාඨමාලව ආරම්භ කර ඇත. ඒ සඳහා රත්මලාන වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ කුලිය වශයෙන් ගෙවා ඇති මුදල් ප්‍රමාණයන් දක්වා ඇත. මෙම කරුණු නිසා ව්‍යාපෘති වාර්ථාවක් පිළියල කිරීමට අවශ්‍යතාවයක් නොතිබුනි.

(ii) මෙය අපගේ Corporate Plan අනුව CSR ව්‍යාපෘතියකට ඇතුලත් කර තිබූ නිසා මූල්‍යමය ප්‍රතිලාභයක් සහ Return on Investment අපේක්‍ෂා නොකරන ලදී. මෙම නිසා විශේෂ තාක්‍ෂණික ඇගයීම් කමිටුවක් පත් කිරීමට අවශ්‍යතාවයක් නොමැත.

ලංකාවේ දැනට ඖෂධ නිෂ්පාදනවේදීන් පුහණු කිරීමේ පාසලක් නොමැති අතර පුහුණු සේවකයින් බඳවා ගැනීම ප්‍රමාණවත් නොවීම නිසා පෞද්ගලික ඖෂධ නිෂ්පාදන ආයෝජකයින් කර්මාන්ත ශාලා ඇතිකිරීමට මැලිකමක් දැක්වීම පැන නැගුනි. මෙම නිසා මෙම අවශ්‍යාතාවය සම්පූර්ණ කිරීම සහ පෞද්ගලික නිෂ්පාදකයින් නිපදවන ඖෂධ වල උසස් තත්ත්වය සහතික කිරීමට පොදු පරීක්‍ෂණ රසායනාගාරයක් ඇති කිරීම අපගේ 2020 දැක්මට අනුව ඉදිරිපත් කරන ලදී. එසේ නොමැති වූයේ නම් පෞද්ගලික ඖෂධ නිෂ්පාදන ආයෝජකයින් අධෛර්‍යයමත් වී කර්මාන්තශාලා ඇති නොවුනහොත් රටේ අඩු මිළට සහ ගුණාත්මක ඖෂධ නිෂ්පාදනය අඩපනවීමට ඉඩතිබුනි.

තවද අප රටේ ඖෂධ පනත අනුව වෛද්‍යවරුන් විසින් ඖෂධ නියම කලයුතුවන්නේ ඖෂධීය නාමයෙන් පමණි. මෙහිදී අප රටේ නිෂ්පාදනය කරනු ලබන ඖෂධ වල තත්ත්වය සහතික කිරීම අත්‍යාවශ්‍ය වේ. ඖෂධ නිෂ්පාදනාගාර ආසන්නයේම පොදු පරීක්‍ෂණ රසායනාගාරයක් ස්ථාපිත කිරීමෙන් තත්ත්වයෙන් උසස් ගුණාත්මක ඖෂධ නිෂ්පාදනය සඳහා පහසුවක් වන බව අපගේ හැඟීමයි.

**(iii)** පුහණු පාසල සහ පොදු පරීක්‍ෂණ රසායනාගාරය කළුතර දිස්ත්‍රික්කයේ හොරණ සහ බුලත්සිංහල ප්‍රදේශ වලින් තෝරා ගැනීමට හේතුවූ කරුණු සහ දක්වා ඇති අනෙකුත් කාරණා සඳහා පහත දැක්වේ.

1. Joint venture ව්‍යාපෘතියට අනුව පෞද්ගලික අංශය සම්බන්ධ කරගෙන කර්මාන්තශාලා 31 ක් පමණ නුදුරු අනාගතයේදී හොරණ සහ බුලත්සිංහල ප්‍රදේශය ආශ්‍රිතව ඉදිකිරීමට යෝජිතව ඇත. මේ නිසා පුහුණු පාසල සහ පොදු පරීක්ෂණ රසායනාගාරය ස්ථාපිත කිරීම සඳහා මෙම ප්‍රදේශ ආශ්‍රිතව සුදුසු ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් මිළදී ගැනීමට තීරණය කරන ලදී.
2. යෝජිත කර්මාන්තශාලා පිහිටුවන පොදු ස්ථානවලට හා දැනටමත් හොරණ ප්‍රදේශයේ ඉදිවෙමින් පවතින කර්මාන්තශාලා වලට පොදු ස්ථානයක පිහිටුවීමට අවශ්‍යතාව තිබුනි.
3. මූලික අවශ්‍යතාවයන් පුවත් පත් දැන්වීමේ පළකර ඇති බැවින් මෙම මිලදී ගැනීම සඳහා Standard Bidding Document අවශ්‍යතාවයක් නොමැත.
4. අපගේ අවශ්‍යතාවය සඳහා ඉඩමක් හෝ ඉදිකරන ලද සුදුසු ගොඩනැගිල්ලක්, මෙම කාරණය සඳහා තෝරා ගැනීමට අදහස් කල ප්‍රදේශයෙන් පුවත් පත් දැන්වීමේ දී ප්‍රතිචාර දක්වා තිබුනේ ලංසු 2ක් පමණි. මෙහිදී කරුණු සලකා බැලීමේදී අපට අවශ්‍ය ප්‍රදේශයෙන් ගොඩනැගිල්ල භාවිතා කර තිබුනේ ආරෝග්‍යශාලාවකට බැවින් (Nursing Home) මෙය අපගේ කාර්යය සඳහා පරිවර්තනය කිරීමට පහසුව සහ යන වියදම ද අලුතින් ඉදිකිරීමකට යන වියදම සහ කාලය ද සැලකීමට ගන්නා ලදී.
5. ඇමුණුම 9 හි ලංසු විවෘත කිරීමට අදාල ලේඛණ අමුණා ඇත.

(iv) සංස්ථාවේ නීතිඥ මණ්ඩලයේ නීතිඥවරියක් පිලියල කරන ලද වාර්තාවේ (Title Report), ඉඩමේ හිමිකම පිලිබඳ අඩුපාඩු තිබුන බැවින් මෙම ගොඩනැගිල්ල ලබා ගෙන කඩිනමින් පුහුණු පාසල සහ පොදු පරීක්‍ෂණ රසායනාගාරය ස්ථාපනය කිරීමට අවශ්‍ය බැවින් දෙවනි මතයක් ලබා ගැනීමට. මෙම හිමිකමෙහි නිවැරදි භාවය සනාථ කරගැනීමට දෙවනි නීතිඥයෙකුගේ සේවය ලබා ගැනීමට කටයුතු කරන ලදී.

මෙය රජ්‍ය බැංකුවක (ලංකා බැංකුව) උගසට තබා තිබූ දේපලක් බැවින් මෙම හිමිකම පිලිබඳව ගැටලුවක් ඇත්නම් බැංකුව විසින් උගසට ලබා ගන්නේද නොමැති නිසා හා දෙවනි නීතිඥයකු නිර්දේශ කල පරිදි තවදුරටත් මෙම විනිශ්වය පිලිබඳව සෑහිමකට පත් වූ අතර සෞඛ්‍ය අමාත්‍යාංශයේ නීති අංශයේ පැහැදිලි කර ගැනීමක් ලබා නොගන්නා ලදී.

අනුකූලතා සහතිකය (COC) ලබාගෙන ඇත. (ඇමුණුම 10)

රජයේ ආයතන දෙකෙන් Structural Report ලබාගැනීමේ කාර්යය සඳහා දීර්ඝ කාලයක් ගතවන බව හැඟී ගිය බැවින් සංස්ථාවේ දැනට ඉදිකිරීම් සඳහා වන උපදේශන සමාගමෙහි Structural Engineer කෙනෙකුගේ Structural Report ලබාගන්නා ලදී.

අදාල බැංකු ශාඛාව සමග සාකච්ඡා කර මිළදී ගැනීම කල නොහැකි වන්නේ අපගේ ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කරමින් මිළදී ගැනීම කලයුතු නිසා වන අතර මෙම ගොඩනැගිල්ල අවසන් වෙන්දේසියේදී ලබා ගැනීමට යාමේදී පහත සඳහන් ගැටලු මතුවේ.

1 ප්‍රසිද්ධ වෙන්දේසියේ දී ලංසු තැබීමකට යාම අපගේ ටෙන්ඩර් පටිපාටිය අනුව කල නොහැක.

2 ප්‍රසිද්ධ වෙන්දේසියේ දී වැඩිම ලංසුවට ගොඩනැගිල්ල විකිණෙන බැවින් අප ලබා ගත් රජයේ තක්සේරු මුදලට මිළදී ගැනීමට නොහැකිවේ.

3 එසේ වුවානම් අපගේ 2020 දැක්මට අනුව රටේ අඩු මිළට සහ ගුණාත්මක ඖෂධ නිෂ්පාදනය වැඩි දියුනු කිරීමේ කාර්යය ප්‍රමාදවීමට ඉඩතිබුනි.

(v) රජයේ තක්සේරුකරු විසින් මිළ තක්සේරු කිරීමේදී මෙම ගොඩනැගිල්ලේ පවතින අඩුපාඩුද සලකා බලා මිළ තීරණය කර ඇති බැවින්ද, අප විසින් මිළදී ගැනීමෙන් අනතුරුව මෙම ගොඩනැගිල්ල නැවතත් අපට අවශ්‍ය ආකාරයට අත්වැඩියා කර නැවත ගොඩනගන බැවින්ද මෙකී අඩුපාඩු සම්බන්දව අප දැනුවත්ව මෙම මිළදී ගැනීම සිදු කර ඇත.

(vi) විකුණුම්කරුට COC ලබාගැනීමට නොහැකිවී ඇත්තේ ගොඩනැගිල්ලේ 3 හා 4 වන මහල් සම්පූර්ණ කර නොමැති බැවිනි. නමුත් අපගේ පුහුණු පාසල සහ පොදු පරීක්ෂණ රසායනාගාරය සඳහා පරිවර්තනය කිරීමෙන් පසුව අප විසින් COC ලබාගැනීම අවදානම් නොවන්නේ පහත කරුණු නිසාය.

1 අප ලබාගත් ගොඩනැගිල්ල භාවිතා කර ඇත්තේ පෞද්ගලික රෝහලක් (Nursing Home) සඳහාය මෙය අපගේ කාර්යයට බෙහෙවින් සමාන වීම විශේෂ කරුණකි.

2 මෙහිදී රෝහලක භාවිතා කරන X-ray lab හා Operation Theater මූලික ගොඩනැගිලි ඉදිකිරීමට අනුමැති ලබා ඇති බැවින් අපගේ කාර්යයේදී මීට අඩු අවදානමක් ඇති Laboratory Instrument භාවිතා වන බැවින් අපගේ පරිවර්තනයෙන් පසුව COC ලබාගැනීම අවදානම් නොවිම සහ 3 හා 4 මහල් සඳහා COC දැනටමත් ලබාගෙන ඇත.

(ඇ)

(i) රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමේ මේ දක්වා කරගෙන ආ පරිදි ලංසු විවෘත කිරීමේ කමිටුව ලෙස පහත සඳහන් පුද්ගලයන්ගෙන් සමන්විත කමිටුවක් පත්කර ඇත.

1 අභ්‍යන්තර විගණන අංශයේ නිළධාරීන්
2 ප්‍රසම්පාදන කමිටු ලේකම්
3 අදල ප්‍රසම්පාදනය කරනු ලබන අංශයේ සාමාජිකයෙක්

මෙම කමිටුව විසින් අදල ප්‍රසම්පාදනයට සහභාගීවූ අය හා ඔවුන් ඉදිරිපත් කල මිළ ගණන් ආදී විස්තර සටහන් කරගනු ලබන අතර එය රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ ලංසු විවෘත කිරීමේ වාර්ථාව ලෙස සලකනු ලබයි.

(ii) එකගවේ. මින් පෙර ද රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ ප්‍රසම්පාදන කටයුතු වලදී වටිනාකම රු.500,000.00 ඉක්මවූ සමහර භාණ්ඩ ප්‍රසම්පාදනයේදී විධිමත් ගිවිසුමකට එළඹ නොතිබූ අතර භාණ්ඩයේ වටිනාකමින් 10% ක් වූ කාර්යසාධන බැඳුම්කරයක් (Performance Bond) පමණක් ලබාගෙන ඇත. ඉදිරි ප්‍රසම්පාදන කටයුතු වලදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කිරීමට බලාපොරොත්තු වෙමු.

(iii) මෙවැනි යන්ත්‍රය ප්‍රසම්පාදනයේදී පූර්ව සාර්ථක සහ වගකීමෙන් යුත් දේශීය සැපයුම් කරුවන් සොයා ගැනීම අසීරු තත්ත්වයක් වූ බැවින් එවන් හා කාර්යක්ෂමව ප්‍රසම්පාදනය කිරීමට අවශ්‍යවූ බැවින් මෙවැනි ඉලෙක්ට්‍රික් යන්ත්‍ර සපයන ලද පූර්ව සාර්ථක වගකීමෙන් යුත් දේශීය සැපයුම්කරුවන්ගෙන් සහ Yellow Pages ආශ්‍රයෙන් සොයාගත් සැපයුම්කරුවන් ලයිස්තුවක් (07 දෙනෙකු) වෙතින් මෙම ලංසු කැඳවීම සිදුකර ඇත.

Forklift යන්ත්‍රය සඳහා තෝරාගත් සැපයුම්කරුවන්ගේ ලයිස්තුව ඉදිරිපත් කරන ලදී.

(ඇ) ආයතනයේ දැනට භාවිතා කරනු ලබන බොහෝ යන්ත්‍ර සූත්‍ර සඳහා අවශ්‍ය අමතරකොටස් විවෘත වෙළඳපොලෙහි ලබාගැනීමට නොමැති හෙයින් එම අමතර කොටස් මුල් නිෂ්පාදකයාගෙන්ම ලබා ගැනීමට සිදුව ඇත.

මෙහිදී මොවුන් ගිවිසුම් සඳහා එළඹීමට මැලි කමක් දක්වන බැවින් ඉදිරි මිළදී ගැනීම් සිදු කිරීමේදී එවැනි ගිවිසුම් වලට එළඹීමට උත්සාහ කරමු.

### 6.1.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

(i) උපදේශක ආයතනයේ සේවය අසතුටු දායක නිසා ඔවුන් සමග ඇතිකරගත් ගිවිසුම අවලංගු කිරීම සඳහා නීති උපදෙස් ලබා ගැනීමට මෙම ගිවිසුම සභාපතිතුමා වෙත ලබා දී ඇති අතර පසුව එම ගිවිසුම අස්ථානගත වී ඇත. සංස්ථාවේ නීතිඥ මණ්ඩලයේ නීතිඥවරියක් පිලියල කරන ලද අවලංගු කිරීමේ ගිවිසුමකට අනුව පයිල් ගැසීමේ කොන්ත්‍රාත්තුවේ වැඩ දක්වා පමණක් උපදේශන ගාස්තු ගෙවා ඔවුන්ගේ සේවය අත්හිටුවා ඇත. ලබාගත් සේවය සඳහා පමණක් ගෙවීම් සිදුකර ඇත.

(ii) ලංසු විවෘත කිරීමේදී සිදුකලයුතු ක්‍රියා පටිපාටිය අනුගමනය කිරීමට සැලසුම් සහ මිළදී ගැනීමේ අංශය දැනුවත් කර ඇත. අදාල කොන්ත්‍රාත් සමාගම සමග ගිවිසුම සකස් කිරීම උපදේශන සමාගම විසින් ප්‍රමාද කර ඇත.

(iii) ගොඩනැගිල්ල ඉදිකිරීමේ සැලසුමේ වෙනස්කම් සිදුකරිම නිසා පයිල් ගැසීමේ කොන්ත්‍රාත්තු අවසන් කල නොහැකිවී ඇත.

### 6.1.3 ප්‍රමාද වූ ව්‍යාපෘති

**Four Storied Facility Building**

මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීමේදී ඇතිවූ ප්‍රායෝගික ගැටළු හේතුවෙන් ප්‍රමාද වූ අතර, ඉදිකිරීම් භූමියේ භූගත සැපයුම් සහ පෙර පැවති අනෙකුත් පාදම් කොටස් ඉවත් කිරීමට කාලයක් ගතවෙයි.

**Two Storied Steel structure warehouse**

මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමේ සැලසුම නාගරික සංවර්ධන අධිකාරිය විසින් අනුමත නොකිරීම නිසා සැලසුම වෙනස් කර ඉදිකිරීමට කටයුතු කිරීම නිසා ප්‍රමාදවීම සිදුවී ඇත.

### 6.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2016 වර්ෂය සඳහා වාර්ෂික වාර්තා 2019 ජුලි මාසය වන විට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත.

### 6.3 නොවිසඳී ඇති විගණණ ඡේද

සැපයුම්කරුට දැනුම්දීම සම්බන්ධව ප්‍රමාදයක් සිදුවී තිබීම පිළිගන්නා අතර අදල අලාභය අයකර ගැනීමට සැපයුම්කරු සමඟ කටයුතු කරමින් පවතී.

අලාභය ලබාදීමට මූලික සැපයුම්කරු එකඟතාවයක් දී ඇති අතර එය ලබාගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.

## 7.0 පද්ධති හා පාලනයන්

(අ) ස්ථාවර වත්කම්
ස්ථවර වත්කම් කාර්යක්ෂමව අපහරණය කිරීම සම්බන්ධයෙන් සාමාන්‍යාධිකාරීතුමිය ඇතුළු කමිටුවක් මගින් ඉදිරියේදී කඩිනමින් අදාල කාර්යයන් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) තොග
මෙම කාලයේදී නිෂ්පාදනාගාරයේ අළුත්වැඩියා කටයුතු කරගෙන ගිය අතර එම අළුත්වැඩියා කටයුතු අවසන් කිරීමට සැලසුම්කර තිබූ කාලය අනපේක්ෂිත ලෙස ඉක්මවා යන ලදි. එමනිසා සමහර අමුද්‍රව්‍ය තොග අතිරික්ත ලෙස පැවතුණි.

ඉදිරියේදී මෙම තත්ත්වයන් පුළුල්ව අධ්‍යනයකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට බලාපොරොත්තු වෙමු.

(ඇ) කාර්යය මණ්ඩල බඳවා ගැනීම්
බඳවා ගැනීම් සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීම හා නිසි පරිදි පැමිණීම හා පිටවීම සටහන් කිරීමට පියවර ගන්නා ලදි.

# ප්‍රස්ථාරාත්මක සමාලෝචනය

## මානව සම්පත්




## තත්ත්ව පාලනය



## නිෂ්පාදනය







## අලෙවිකරණය






## මූල්‍ය


ශුද්ධ ලාභය/(අලාභය)
රු. මිලියන
300
250
200
150
100
50
0
2008
2009
2010
2011
2012
2013
2014
2015
2016
2017
වර්ෂය


මුළු වත්කම්
රු.000
3,350,000
3,150,000
2,950,000
2,750,000
2,550,000
2,350,000
2,150,000
1,950,000
1,750,000
1,550,000
1,350,000
1,150,000
950,000
750,000
2008
2009
2010
2011
2012
2013
2014
2015
2016
2017
වර්ෂය

## නඩත්තු


බලශක්ති පරිභෝජනය
කිලෝවොට් පැය
3,000,000
2,500,000
2,000,000
1,500,000
1,000,000
500,000
-
1,550,285
1,616,464
1,775,660
2,096,330
2,159,566
2,268,250
2,308,930
2,426,792
2,387,538
2,044,165
2008
2009
2010
2011
2012
2013
2014
2015
2016
2017
වර්ෂය

# පසුගිය වර්ෂ 10 තුළ වැදගත් මූල්‍ය විස්තර

| | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| පිරිවැටුම | 890,244 | 1,152,684 | 1,379,652 | 1,431,655 | 1,414,546 | 1,941,182 | 1,712,105 | 2,054,363 | 2,434,508 | 3,174,612 |
| අලෙවි පිරිවැය | 750,281 | 932,212 | 1,030,545 | 1,127,409 | 1,220,523 | 1,513,899 | 1,319,715 | 1,539,441 | 1,888,256 | 2,666,683 |
| දළ ලාභය | 139,963 | 220,472 | 349,107 | 304,246 | 194,023 | 427,283 | 392,391 | 514,921 | 546,252 | 507,928 |
| මෙහෙයුම් ලාභය | 63,403 | 121,423 | 266,166 | 222,469 | 85,292 | 304,176 | 224,758 | 364,845 | 353,776 | 244,781 |
| පරිපාලන වියදම | 62,127 | 60,243 | 62,869 | 72,730 | 82,390 | 106,096 | 133,933 | 125,469 | 165,788 | 204,579 |
| පොළී ආදායම | 60,904 | 33,479 | 30,752 | 23,702 | 34,251 | 28,059 | 44,196 | 53,586 | 87,629 | 77,607 |
| බදු පෙර ශුද්ධ ලාභය | 120,572 | 151,827 | 292,317 | 244,792 | 117,136 | 329,968 | 266,481 | 414,501 | 441,164 | 321,982 |
| බදු පසු ශුද්ධ ලාභය | 78,372 | 98,688 | 154,538 | 193,029 | 98,561 | 209,154 | 183,848 | 262,323 | 296,646 | 223,907 |
| ස්ථාවර වත්කම් | 408,129 | 815,342 | 914,716 | 864,779 | 804,305 | 762,641 | 780,718 | 762,560 | 798,657 | 802,775 |
| කෙටිකාලීන ආයෝජන | 265,893 | 201,529 | 243,264 | 331,779 | 210,691 | 429,896 | 913,443 | 1,027,388 | 1,175,754 | 926,461 |
| මුළු වත්කම් | 1,251,026 | 1,718,461 | 1,887,430 | 1,945,347 | 2,003,258 | 2,294,113 | 2,386,449 | 2,700,885 | 2,902,284 | 3,073,471 |
| සේවක සංඛ්‍යාව | 195 | 209 | 209 | 208 | 199 | 211 | 226 | 229 | 248 | 274 |

මුළු වත්කම් = මුළු ජංගම නොවන වත්කම්වල ශුද්ධ ගිණුම්ගත වටිනාකම + මුළු ජංගම වත්කම්

**ලියාපදිංචි කාර්යාලය**

11, සර් ජෝන් කොතලාවල මාවත,
කඳවල වත්ත,
රත්මලාන.

දුර: 2635353, 2637574, 2636966,
2636967 (ADSL)
ෆැක්ස් : 2634771, 2626621, 2623553
වි - තැපැල : spmclanka@sltnet.lk
වෙබ් අඩවිය : www.spmclanka.lk

**සභාපති**
දුර : 2623238 (සෘජු)
2635353, 2714771 (පොදු)

**කළමනාකාර අධ්‍යක්ෂ**
දුර : 2636368 (සෘජු)
2635353, 2637574 (පොදු)

**සාමාන්‍යාධිකාරිණී**
දුර : 3153835 (සෘජු)
2635353, 2637574 (පොදු)

**නිෂ්පාදන දෙපාර්තමේන්තුව**
**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - නිෂ්පාදන**
දුර : 2623521 (සෘජු)

**සැලසුම් හා ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුව**
**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී**
**- සැලසුම් හා ප්‍රසම්පාදන**
දුර: 2623298 (සෘජු)

**කළමනාකාරිණී - සැලසුම් හා ප්‍රසම්පාදන**
දුර: 2637124 (සෘජු)

**අලෙවි දෙපාර්තමේන්තුව**
**අලෙවි කළමනාකාරිණී**
දුර : 3163308 (සෘජු)

**තත්ව පාලන දෙපාර්තමේන්තුව**
**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - තත්ව පාලන**
දුර : 5012945 (සෘජු)

**වට්ටෝරු, පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව**
**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී**
**- වට්ටෝරු, පර්යේෂණ හා සංවර්ධන**
දුර : 5012950 (සෘජු)

**මූල්‍ය දෙපාර්තමේන්තුව**
**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී - මූල්‍ය**
දුර : 2626630 (සෘජු)

**මූල්‍ය කළමනාකරු**
දුර : 2623276 (සෘජු)

**නඩත්තු දෙපාර්තමේන්තුව**
**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - ඉංජිනේරු**
දුර : 2623246 (සෘජු)

**කළමනාකරු - ඉංජිනේරු**
දුර : 2623239 (සෘජු)

**අභ්‍යන්තර විගණක දෙපාර්තමේන්තුව**
**අභ්‍යන්තර විගණක**
දුර : 2626619 (සෘජු)

**මානව සම්පත් දෙපාර්තමේන්තුව**
**මානව සම්පත් කළමනාකාරිණී**
දුර : 2636234 (සෘජු)

**பதிவு செய்யப்பட்ட அலுவலகம்**

11,சேர் ஜோன் கொத்தலாவல மாவத்தை,
கந்தவெல எஸ்ரேட்,
இரத்மலானை

தொ.பே.: 2635353, 2637574 , 2636966 , 2636967 (ADSL)
தொலைநகல் : 2634771, 2626621, 2623553
மின்னஞ்சல் : spmclanka@sltnet.lk
வலையமைப்பு : www.spmclank.lk

**தலைவர்**
தொ.பே. : 2623238 (நேரடி)
2635353, 2714771 (பொது)

**முகாமைத்துவ பணிப்பாளர்**
தொ.பே : 2636368
2635353, 2637574 (பொது)

**பொது முகாமையாளர்**
தொ.பே : 3153853 (நேரடி)
2635353, 2637574 (பொது)

**உற்பத்தித் திணைக்களம்**
**உற்பத்தி பொது முகாமையாளர்**
தொ.பே : 2623521 (நேரடி)

**திட்டமிடல், கொள்வனவு, சந்தைப்படுத்தல்**
**திட்டமிடல், கொள்வனவு பொது**
**முகாமையாளர்**
தொ.பே : 2623298 (நேரடி)

**திட்டமிடல், கொள்வனவு முகாமையாளர்**
தொ.பே : 2637124 (நேரடி)

**சந்தைப்படுத்தல் திணைக்களம்**
**சந்தைப்படுத்தல் முகாமையாளர்**
தொ.பே : 3163308 (நேரடி)

**தரக் கட்டுப்பாட்டுத் திணைக்களம்**
**தரக்கட்டுப்பாட்டு பொது முகாமையாளர்**
தொ.பே : 5012945 (நேரடி)

**உருவாக்கல், ஆய்வு, அபிவிருத்தித் திணைக்களம்**
**உருவாக்கல், ஆய்வு, அபிவிருத்தி பொது**
**முகாமையாளர்**
தொ.பே : 5012950 (நேரடி)

**நிதித்திணைக்களம்**
**நிதி பொது முகாமையாளர்**
தொ.பே : 2626630 (நேரடி)

**நிதி முகாமையாளர்**
தொ.பே : 2623276 (நேரடி)

**பராமரிப்புத் திணைக்களம்.**
**பராமரிப்பு பொது முகாமையாளர்**
தொ.பே : 2623246 (நேரடி)

**பராமரிப்பு முகாமையாளர்**
தொ.பே : 2623239 (நேரடி)

**உள்ளகக் கணக்காய்வுத் திணைக்களம்**
**உள்ளகக் கணக்காய்வாளர்**
தொ.பே : 2626619 (நேரடி)

**மனிதவள திணைக்களம்**
**மனிதவள முகாமையாளர்**
தொ.பே : 2636234 (நேரடி)

**Registered Office**

11,Sir John Kotelawala Mawatha,
Kandawala Estate,
Rathmalana.

Tel: 2635353 , 2637574 , 2636966 , 2636967(ADSL)
Fax : 2634771,2626621,2623553
email : spmclanka@sltnet.lk
Web : www.spmclanka.lk

**Chairman**
Tel : 2623238 ( Direct )
2635353, 2714771 (General)

**Managing Director**
Tel : 2636368 (Direct)
2635353, 2637574 (General)

**General Manager**
Tel : 3153835 (Direct)
2635353, 2637574 (General)

**Production Dept.**
**DGM Production**
Tel : 2623521 (Direct)

**Planning & Procurement Dept.**
**DGM Planning & Procurement**
Tel : 2623298 (Direct)

**Manager Planning & Procurement**
Tel : 2637124 (Direct)

**Marketing Dept.**
**Manager Marketing**
Tel : 3163308 (Direct)

**Quality Control Dept.**
**DGM Quality Control**
Tel : 5012945 (Direct)

**Formulation, Research & Development Dept.**
**DGM Formulation, Research & Development**
Tel : 5012950 (Direct)

**Finance Dept.**
**DGM Finance**
Tel : 2626630 (Direct)

**Finance Manager**
Tel : 2623276 (Direct)

**Maintenance Dept.**
**DGM Engineering**
Tel : 2623246 (Direct)

**Manager Engineering**
Tel : 2623239 (Direct)

**Internal Audit Dept.**
**Internal Auditor**
Tel : 2626619 (Direct)

**Human Resources Dept.**
**Manager Human Resources**
Tel : 2636234 (Direct)

SPMC

www.spmclanka.lk